**චන්ද්‍ර රණතුංග මහතා (මාවනැල්ල)**
*(திரு. சந்திர றணதுங்க—மாவனல்ல)*
(Mr. Chandra Ranatunga—Mawanella)

**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*

*Seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put and agreed to.*

**පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදින්, 48 (3) වන ස්ථාවර නියෝගය යටතේ, කථානායකතුමා විසින් එය "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.**

*சட்டமூலம், இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு, நிலைக் கட்டளை 48 (3) இன் படி நிலைக் குழு 'ஏ" க்குச் சபாநாயகர் அவர்களால் சாட்டப்பட்டது.*

*Bill accordingly read a Second time, and allocated by MR. SPEAKER to Standing Committee "A" under Standing Order 48 (3)*

## සංවර්ධන සභා (සංශෝධන) පනත් කෙටුම්පත

### அபிவிருத்திச் சபைகள் (திருத்தம்) சட்டமூலம்

## DEVELOPMENT COUNCILS (AMENDMENT) BILL

**දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.**

*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

**ආර්. ප්‍රේමදාස මහතා (අග්‍රාමාත්‍යතුමා, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා, මහාමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමා, සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
*(திரு. ஆர். பிரேமதாச—பிரதம அமைச்சரும், உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண அமைச்சரும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)*
(Mr. R. Premadasa—Prime Minister, Minister of Local Government, Housing & Construction, Minister of Highways, and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, සංවර්ධන සභා (සංශෝධන) පනත් කෙටුම්පත මම ඉදිරිපත් කරනවා. ගිය මාසයේ අපි ග්‍රාමෝදය අරමුදල් පනත සාකච්ඡා කරන විට මේ ගැන හුඟක් දුරට සාකච්ඡා කළා. මම ඒ අවස්ථාවේදී කිව්වා, සංවර්ධන සභා පනතේ සංශෝධන කිපයක් මම මේ මාසයේ ඉදිරිපත් කරනවා කියා. ඒ අනුවයි, මේ සංශෝධන පනත ඉදිරිපත් කරන්නේ.

රටේ සියළුම පරිපාලන දිස්ත්‍රික්කවල 1981 ජූලි 1 වැනි දා සිට ක්‍රියාත්මක වන සේ සංවර්ධන සභා පිහිටුවූ බව තමුන්නාන්සේලා දන්නවා. එයින් බලාපොරොත්තු වුණේ මේ මණ්ඩලවලට පාලන බලතල පවරා දී සංවර්ධන සභා පනතේ නිශ්චිතව සඳහන් කර තිබෙන යම් යම් කොන්දේසිවලට යටත්ව පරිපාලනය විමධ්‍යගත කිරීමටයි. ඊට පසුව පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය මඟින් පැවැත්වූ සාකච්ඡාවලදී හා සම්මන්ත්‍රණවලදී දිස්ත්‍රික් අමාත්‍යවරුන් සංවර්ධන සභා සභාපතිවරුන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් මේ සංවර්ධන සභා පනත ගැන විචාර විමර්ශන ඉදිරිපත් කළා. බොහෝ දෙනෙක් පෙන්නුම් කර තිබුණා, යම් යම් ප්‍රායෝගික දුර්වලතාවයන් සංවර්ධන සභාවලට විධිමත්ව කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට සංවර්ධන සභා පනත සංශෝධනය කරන්නය කියා ඉල්ලීම් තිබුණා. එමෙන්ම ග්‍රාමෝදය මණ්ඩලවල නිශ්චිත තත්ත්වයක් ඇති කරන්නය කියාත් ඉල්ලීම් තිබුණා, ප්‍රාදේශීය මණ්ඩලවල. ප්‍රාදේශීය මණ්ඩලවලටත් ග්‍රාමෝදය මණ්ඩලවලටත් සංවර්ධන සභාවල සංවර්ධන ව්‍යාපෘතිවලට සම්බන්ධ වී ක්‍රියා කරන්නට අවකාශ සලසා දෙන්නය, බලතල දෙන්නය, කියා ගිය මාසයේදී මේ සභාවේදීත් ඉල්ලීම් ඉදිරිපත් කළ බව තමුන්නාන්සේ දන්නවා.

ග්‍රාමෝදය මණ්ඩල 4275 ගේ සාමාජිකයින් 50,000 ක් පමණ සිටිනවා. ප්‍රාදේශීය මණ්ඩල 233නේ සාමාජිකයින් 4600 ක් සිටිනවා. කලින් තිබුණු ගම්සභා හා සුළු නගර සභා බල ප්‍රදේශවල මූලික පහසුකම් හා සේවාවන් සැපයීම සම්බන්ධයෙන් ඒවායේ සේවාවන් අඛණ්ඩව පවත්වා ගෙන යෑමට බලතල පවරන්නය කියා ගිය මාසයේදීත් මන්ත්‍රීවරුන් අපට කරුණු ඉදිරිපත් කළා. ඒ නිසා මේ සංශෝධන පනතින් ඒ නිලධාරීන්ට බලතල පැවරීමට විධිවිධාන සලස්වා තිබෙනවා. එමෙන්ම ග්‍රාමෝදය මණ්ඩලවලටත් ප්‍රාදේශීය මණ්ඩලවලටත් දැනට වඩා උද්‍යෝගයෙන් වැඩ කිරීමට අවශ්‍ය විධිවිධාන් මේ මඟින් සැලසෙනවා. මේ සංශෝධනය සකස් කර තිබෙන්නේ ඒ අදහස් උදහස් සැලකිල්ලට ගැනීමෙනුයි.

ගරු කථානායකතුමනි, මේ සංශෝධන පිළිබඳව විස්තර —නීතිමය විස්තර—ඒ පනතේම සඳහන්ව තිබෙනවා. මේ හැර මම කියන්න කැමතියි, සංවර්ධන සභාවලට පැවරී තිබෙන කාර්යයන්. ඒවා නම් ගොවිජන සේවා, කෘෂිකර්මය, සත්ව පාලනය, සමුපකාර සංවර්ධනය, සංස්කෘතික කටයුතු, අධ්‍යාපනය, රැකීරක්ෂා, ධීවර කර්මාන්තය, ආහාර, සෞඛ්‍ය සේවා, නිවාස, අන්තර් දිස්ත්‍රික්ක ස්වභාවයේ නොවන වාරිමාර්ග කටයුතු, ඉඩම් පරිහරණය සහ ඉඩම් නිරවුල් කිරීම, ග්‍රාම සංවර්ධනය හා කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්ත, මේ ක්ෂේත්‍රයන්හි ඒ ඒ විෂයයන් අදාළ ඇමතිවරු සංවර්ධන සභාවලට බලතල පවරනවා ඇති, ගැසට් නිවේදන මාර්ගයෙන්. මේ අනුවත් තමුන්නාන්සේට පෙනෙයි, සංවර්ධන සහා වැඩ පිළිවෙළ රජයේ කාර්යයන්ට දැනටත් වඩා සම්බන්ධ කර ගැනීමට මෙයින් විධිවිධාන සැලසෙන බව.

Mr. Speaker, Development Councils have been set up in all Administrative Districts with effect from the 1st July 1981 with a view to devolving authority on the Development Councils and to decentralize the administration, subject to certain terms and conditions

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

as sepcified in the Development Councils Act. At various discussions and seminars held by the Ministry of Local Government, Housing and Construction, representations were made by Districts Ministers, Chairmen of Development Councils, District Secretaries to the effect that this Act needs amendments to remove certain operational difficulties and also to ensure smooth functioning of the Development Councils. Here in this House itself last month hon. Members pointed out various shortcomings and I assured this House that I would bring in an Amending Bill to ensure more efficient functioning of the Development Councils and also make provision so that the Development Councils will be able to get the participation of Pradesiya Mandalayas and Gramodaya Mandalayas in the development activities. Also, there were complaints that sub-offices of the Development Councils have failed in many instances to continue to provide basic amenities and services in the local areas, and we have taken those complaints into consideration and formulated these amendments so that these sub-offices will be given the necessary legal authority and power to conduct affairs more efficiently. There are about 50,000 members in the 4,275 Gramodaya Mandalayas and about 4,600 members in the 233 Pradesiya Mandalayas already set up. We are keen that we should obtain the participation of all these members who are representing various organizations to take part in the process of government, and we have made provision for that purpose.

Sir, in addition to that, I would like to state that we are taking a very important step to assign powers, functions and duties to Executive Committees of Development Councils in terms of Development Councils Act No. 35 of 1980. The procedure followed in this connection will be that in the first instance each of the concerned Ministers of the Cabinet under Article 45(4) of the Constitution will delegate to each District Minister functions and duties pertaining to the subjects appearing in the First Schedule to the Development Councils Act. The subjects are agrarian services, agriculture, animal husbandry, co-operative development, cultural affairs, education, employment, fisheries, food, health services, housing, irrigation works which are not of a inter-district character, land use and land settlement, rural development, small and medium scale industries and the respective Ministers, the Minister of Agricultural Development and Research, Minister of Rural Industrial Development, Minister of Food and Co-operatives, Minister of Cultural Affairs, Minister of Education, Minister of Youth Affairs and Employment, Minister of Fisheries, Minister of Health, Minister of Local Government, Housing and Construction, Minister of Lands and Land Development, Minister of Rural Development, Minister of Industries and Scientific Affairs will take action accordingly. Gazette notifications in respect of this delegation will be published shortly. When once these notifications appear in the gazette each District Minister will publish a gazette notification delegating powers, functions and duties to the Executive Committee of the Development Council of his District. Thereby, Sir, we propose to achieve the participation of the people of all Districts in this country in the development process, as I said earlier.

Now, I hope that this devolution of authority will make the people more concerned about the development in their own areas, and I have no doubt that their co-operation will help the Government in carrying out its obligations.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ලක්ෂ්මන් ජයකොඩි මහතා (අත්තනගල්ල)**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—அத்தனகல்ல)*
(Mr. Lakshman Jayakody—Attanagalla)

Mr. Speaker, we quite appreciate the submissions made by the Hon. Prime Minister with regard to the Development Councils, and I wish to bring to his notice one or two matters which have brought a lot of work in our electorates to a standstill. I suppose it may be due to various reasons, and it may be without his knowledge or because of other reasons. First and foremost, I must tell you that I represent an electorate where we have no proper chirman for the Gramodaya Mandalaya. I received a letter from Mr. Paskaralingam, who is the Secretary to the Ministry of Local Government, saying that Mr. D. C. Wanigasundera of Urapola is the Chairman. But, the person who is working there, who is having a frank and so on, is a lady by the name of Rohini Perera. (*Interruption.*) Not Rohini Dias. I am sorry I do not know who the chairman is. But I must say that the Hon. Prime Minster's Secretary has written to me saying that it is Mr. Wanigasundera. So, we would like to work with him and associate with him rather than associate with Rohini Dias—I am sorry, Rohini Perera ! Therefore, we would like the Hon. Prime Minister to find out who these intruders are. We in the Opposition especially would like to work with a person who has the interest of the area at heart, and who would like to serve the people as one of their own. So that is one thing that has taken place in our area.

The second matter that I would like to bring to your notice is this. The other day, when I went to a village called Heendeniya, Pattigoda, I was told that there was an SLFP meeting. Now, the chairman from Heendeniya who is supposed to be the chairman of the Gramodaya Mandalaya had torn some posters or something like that and had taken them to the police station to make a complaint. So, when he went to make the complaint, the police were baffled as to who the chairman was. Anyway, they entertained the complaint, but still the police cannot find out who this person was, who came there posing off as a Gramodaya Mandalaya Chairman.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I do not know, he may be the chairman. What I want to say is, these people have no identification. There are various people at village level who pose off as chairmen of Gramodaya Mandalayas and take advantage of the fact and collect money ; I know some of them. Therefore, I would like to ask the Hon. Prime Minister to give them an identity card, because we do not know who these people are. Let them have it round the neck or somewhere, to say that that particular person is the Gramodaya Mandalaya chairman. There are so many like that at village level now and one cannot find out who they are. There are the SSOs and various other people and different Ministries have various individuals. In the olden days there was only one person and that was the Grama Sevaka. I think at that time they used badges or something like that for the purpose of identification. Even the Grama Sevakas had badges at one time. I do not know whether they use them not. But, I think it is very important for us to have clarification as to who these people are.

Thirdly, as I mentioned to the Hon. Prime Minister, funds have not been allocated to the Gramodayas. The other day, I went to a village called Induragara, in my home electorate which the hon. Member for Divulapitiya (Mr. Ariyaratne Jayatillake) represents. When I went there a gentleman came up to me and said, " I have been appointed the Gramodaya Chairman " Then he asked me, " Sir, has the Parliament allocated funds ?" I said, " I do not know whether they have allocated funds or not, but in the Attanagalla area we managed somehow or other."—(*Interruption*) Sir, you are trying to utilize that one. That is the decentralized budget. That is different. You cannot utilize that because that has been given and spent, I suppose. That is not the point. He came and asked for funds. I said, " Look, I have no right to allocate funds but anyway the hon. Member for Divulapitiya (Mr. Lionel Jayatilleke) is a very congenial person ; he is a fine gentlemen, you go and meet him and ask funds from him." Now, I would like the Hon. Prime Minister to look into that matter—in regard to funds.

In our villages a new gentlemen class of people how come up—English educated people, members of the Rotary Club, Singha Samaja people with various ties and all that—and they attend these meetings, and I find that the village atmosphere has disappeared and some people of that nature dominate the place. Most of the people come and promise money—I do not know for what reason. It is very good if they come and make contributions, but one has to be a bit careful to see that the village structure we had hitherto where the Buddhist priests, the Buddhist clergy held sway—is safeguarded.

The other day I was going through Gampola to Nuwara Eliya, and I always take the short cut through the old road from Srinivasa Pirivena—(*Interruption*). No, I was going to Nuwara Eliya for a meeting. When I was going for that meeting, I stopped at Mathgamuwa to pay my respects to an old priest or ours who died recently in our area, a very learned Bhikku from Mathgamuwa. When I met the priests there they posed the question to me : "ස්වාමීන් වහන්සේලාට ඡන්ද බලය තිබෙනවාද ග්‍රාමෝදය මණ්ඩලවල ? "

I could not immediately answer them because it is possible, and he said

" මම අනුශාසකවරයෙක් වශයෙන් පත් කර තිබෙනව. නමුත් මට ඡන්ද බලයක් නැහැ. ස්වාමීන් වහන්සේ නමක් ග්‍රාම සංවර්ධන සමිතියේ සභාපතිවරයා වුණොත් ඡන්ද බලය තිබෙනවා " ඉතින් මේ විධියට ප්‍රශ්න කළාම මම උන්වහන්සේට කිව්ව, " හෙට අනිද්දා මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලැබෙනවා. ඒ වෙලාවේදී මම අග්‍රාමාත්‍යතුමාගෙන් අහන් නම් ඒ විධියේ වෙනසක් තිබෙනවාද කියලා " [බාධා කිරීමක්] පන්සලේ හාමුදුරුවො දායක සභාවේ සභාපති නොවෙයි. දායකයා හා ස්වාමීන් වහන්සේ අතර විශාල වෙනසක් තිබෙනවා. මම දන්නෙ නැහැ කියන්න, දායකයන් හැටියට ස්වාමීන් වහන්සේලා ඉන්නවාද කියල. එහෙම නම් එවැනි අය ඉන්නෙ කොළොන්නාවෙ වෙන්න ඇති, අපේ පළාත්වල නම් නැහැ. කෙසේ වුණත් ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් දැනගන්න කැමතියි, ඡන්ද බලය තිබෙන හා ඡන්ද බලය නැති එවැනි දෙකොට්ඨාශයක් ඉන්නවාද කියා. මේ කරුණු කීපය පමණයි මම එතුමාට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙන්නේ.

අ. භා. 3.45

**රනිල් වික්‍රමසිංහ මහතා (යොවුන කටයුතු හා රැකී රක්‍ෂා ඇමතිතුමා සහ අධ්‍යාපන ඇමතිතුමා)**

*(திரு. ரணில் விக்ரமசிங்ஹ—இளைஞர் அலுவல்கள், தொழில் வாய்ப்பு அமைச்சரும் கல்வி அமைச்சரும்)*

(Mr. Ranil Wickremasinghe—Minister of Youth Affairs & Employment and Minister of Education)

ගරු කථානායකතුමනි, අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා මේ විවාදයට සහභාගිවීම ගැන මම පුදුමයට පත් වුණා. මම කැමතියි එතුමාට ස්තුතිවන්ත වෙන්නට, මේ අවස්ථාවේදීවත් සංවර්ධන සභා සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීම ගැන. මට පුදුම වෙන්න හේතු කීපයක්ම තිබුණා. මම හිතුවෙ නැහැ අද දින එතුමා මේ සභාවේ ඉඳිය කියල. මා දන්නා තරමට අද හොරගොල්ල වලව්ව ඉදිරිපිට දෙසියක පමණ පිරිසක් කෑකෝ ගසමින් ඉන්නවලු " ඒ අය මැතිණී කෝ " කියල අහනවලු, " මන්ත්‍රී කෝ " කියල අහනවලු, " අනුර කෝ " කියල අහනවලු, " මේ රැස්වීම කල් දැම්මා නම් අපට ටෙලිග්‍රෑම් එකකින්වත් දැනුම් දුන්නේ නැත්තේ මොකද ? " කියල අහනවලු. මේ විධියේ විශාල කලබලයක් ඇති වී තිබෙන අවස්ථාවක අත්තනගල්ලේ මන්ත්‍රීතුමා, ඒ ප්‍රශ්නය විසඳන්නට ඒ ස්ථානයේ ඉඳියි කියලයි අපි හිතුවේ.

ගරු කථානායකතුමනි, සංවර්ධන සභා පනත් කෙටුම්පත ගැන, ග්‍රාමෝදය මණ්ඩල ගැන මෙයට පෙර සාකච්ඡා කළ හැම අවස්ථාවකදීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඒකට සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා. ප්‍රජාතන්ත්‍ර විරෝධිය කියා සංවර්ධන සභා මැතිවරණයට සහභාගි වුණේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රනිල් වික්‍රමසිංහ මහතා]

අවුරුදු හතක් තිස්සේ පළාත් පාලන මැතිවරණ තැබුවේ නැති, හදිසි නීතිය යටතේ ඒ සභා විසුරුවා හැරිය ආණ්ඩුවක් මේ රජයෙන් නව පළාත් පාලන ක්‍රම ඇති කරද්දී, සංවර්ධන සභා ආදිය ඇති කර මහජන ඡන්දයෙන් ඒ සභාවලට නියෝජිතයන් තෝරා පත් කර ගනිද්දී, ප්‍රජාතන්ත්‍ර විරෝධිව මේ රජය කටයුතු කරනවාය කියන්නෙ කොහොමද කියා මම අහන්න කැමතියි. ඇත්ත වශයෙන්ම එදා එවැනි තත්ත්වයක් ඇති වීමට ප්‍රධාන වශයෙන් හේතු වුණේ මොකක්ද? සංවර්ධන සභා මැතිවරණය ප්‍රජාතන්ත්‍ර විරෝධී නිසා නොවෙයි. ඒ කාලයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුලේ ප්‍රශ්න කීපයක්ම තිබුණා. අපේක්ෂකයන් හැටියට පත් කරන්නෙ කවු කවුරුන්ද කියන ප්‍රශ්නය ගැන පිල් දෙකකට බෙදී තිබුණා. ගුටිබැට හුවමාරු කර ගන්න ගිහින් අපේක්ෂක ලැයිස්තුවක් හදා ගන්න බැරි වුණා. ඒ අන්දමට ලැයිස්තුවක් හදා ගන්න බැරි වුණු නිසා සංවර්ධන සභා මැතිවරණයේදී තරඟ කළේ නැහැ. අද ඒක අමතක වෙලා කථා කරනවා. අද සංවර්ධන සභා සංශෝධන පනත සම්බන්ධයෙන් වන මේ විවාදයට ඒ අය සහභාගි වුණාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බෙදීම තාවම නැති වී නෑහැ; වැඩි වෙලයි තිබෙන්නෙ.

එදා තිබුණු භේදය අනුව අන්තිමට මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාත් (මෛත්‍රීපාල සේනානායක මහතා) නුවරඑළිය-මස්කෙළිය දෙවන ගරු මන්ත්‍රීතුමාත් (අනුර බණ්ඩාරනායක මහතා) තවත් කීප දෙනෙකුත්— පොලිට් බියුරෝ එකේ වැඩි ඡන්ද බලය තිබුණු කණ්ඩායම —බලය අල්ලා ගත්තා. ඒ අනුව කණ්ඩායම් දෙකකට බෙදුණා. "මම මැදවච්චියේ මන්ත්‍රීතුමාව නෙරපුවා" කියා බණ්ඩාරනායක මැතිණිය ප්‍රසිද්ධියේම කිව්වා. "නායකයා මමයි, අපි බලයට ආවොත් බණ්ඩාරනායක මැතිණියගේ ප්‍රජා අයිතිවාසිකම් ආපසු ලබා දෙනවා" කියා ඒ කාලයේදී මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාත් කිව්වා. [බාධා කිරීමක්]. තමුන්නාන්සේ ඊයේ ගිහින් පොලිට් බියුරෝ රැස්වීමට සහභාගි වෙලා බණ්ඩාරනායක මැතිණියව පාවා දුන්නා.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)
ඊයේ පරාදයි.

**රනිල් වික්‍රමසිංහ මහතා**
*(திரு. றணில் விக்ரமசிங்ஹ)*
(Mr. Ranil Wickremasinghe)
ඡන්දය දෙන්නට ඉඩ දුන්නේ නැතිලු.

ඊට පස්සේ වැඩි කල් යන්නට ඉස්සර වෙලා මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාට පහරක් ගසා කොටසක් බණ්ඩාරනායක මහත්මියගේ කණ්ඩායමට ආපසු ගියා. දැන් තවමත් පිල් දෙකක් තිබෙනවා. අඩු ගණනේ දැන් මැතිවරණයෙකුත් ළඟ එන නිසා මේ ප්‍රශ්න අඩු වෙයි කියා අපි හිතුවා. ඇයි? සංවර්ධන සභා ඡන්දයට එන්නේ නැහැයි කිව්වා වගේ අනික් පාර කියන්නට පුළුවන් නොවැ අපි ජනාධිපති තරඟයටත් එන්නේ නැහැයි කියා? නමුත් අද තත්ත්වය ඊට වඩා වෙනස් වෙලයි තිබෙන්නේ. එක පැත්තක ඉන්නවා, හෙක්ටරුයි, ඇක්ටරුයි. අනික් පැත්තේ ප්‍රොක්ටර් ඉන්නවාලු. අපේ අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ගම්පහ ගරු මන්ත්‍රීතුමාත් (එස්. ඩී. බණ්ඩාරනායක මහතා) කොත්මලේ ගරු මන්ත්‍රීතුමාත් (ආනන්ද දසනායක මහතා) අද කථා කරන්නේ මොන පක්ෂයක් වෙනුවෙන්ද කියා මම නම් දන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මම හිතන විධියට ඒ අය අයත් වෙන්නේ මොන පක්ෂයටද කියා දැන ගන්නට අපට ඒ අයගේ අයිඩෙන්ටිටි කාඩ්ස් බලන්නට සිදු වෙයි.

ගරු කථානායකතුමනි, "බණ්ඩාරනායක මහත්මිය වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් කථා කරන්නේ මම තමයි" කියා අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කියනවා. නමුත් මම පත්තරේ කියවන විට දක්කා මේ ගරු මන්ත්‍රීවරු තුන් දෙනාම අනික් කණ්ඩායමේ රැස්වීමට සහභාගි වෙලා බණ්ඩාරනායක මහත්මියව සම්පූර්ණයෙන්ම පාවා දීලා තිබෙන බව. වැඩි ඡන්දය එහාටද යන්නේ මෙහාටද යන්නේ කියන්න මම නම් දන්නේ නැහැ. කරුණාකර ඒක අපට කියනවා නම් හොඳයි. ඒක මම දැන ගන්නට කැමතියි. "ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මමයි" කියා මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) මේ ගරු සභාවේදී කීප වතාවක්ම කියා තිබෙනවා. ඒවාගේම "ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මමයි" කියා අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කියා තිබෙනවා. දැන් එතුමා කථා කරන්නේ කවුරු වෙනුවෙන්ද කියා මම දැන ගන්නට කැමතියි. කොබ්බෑකඩුව මැතිතුමා වෙනුවෙන්ද? නැත්නම් බණ්ඩාරනායක මැතිණිය වෙනුවෙන්ද? එහෙමත් නැත්නම් නුවරඑළිය-මස්කෙළිය දෙවන ගරු මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) වෙනුවෙන්ද? ඒ කාරණය මම දැන ගන්නට කැමතියි.

එපමණක් නොවෙයි ගරු කථානායකතුමනි, කොත්මලේ ගරු මන්ත්‍රීතුමාත් (ආනන්ද දසනායක මහතා) පාර්ලිමේන්තුවේ නීතිරීති උල්ලංඝණය කර තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිල පුවත් පත වන 'දිනකර' පත්තරය මේ ආණ්ඩුව විසින් සීල් තිබ්බාය කියා එතුමා මේ ගරු සභාවේ කීප වතාවක්ම නැගිටලා ප්‍රකාශ කර තිබෙනවා. අපි එතුමා කිව්ව දේ පිළිගත්තා. ඔන්න සෙනසුරාදා 'දිවයින' පත්තරේ බණ්ඩාරනායක මහත්මිය කියනවා, 'දිනකර' පත්තරය ඒ අයගේ පක්ෂයේ පත්තරය නොවෙයිලු. එහෙම නම් මෙතුමා මේ ගරු සභාවට ඇවිදින් අසත්‍ය ප්‍රකාශයක් නොවැ කරලා තිබෙන්නේ? ඒ අයගේ පක්ෂයේ පත්තරය සීල් තිබ්බාය කියා මෙතෙක් කල් අපට දෙස් කිව්වා.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)
මොකක්ද පත්තරය?

**රනිල් වික්‍රමසිංහ මහතා**
*(திரு. றணில் விக்ரமசிங்ஹ)*
(Mr. Ranil Wickremasinghe)
'දිනකර' පත්තරය. ගිහින් හැන්සාඩ් වාර්තා කියවා බලන්න. මේ ගරු මන්ත්‍රීවරුන් තුන් දෙනාම කියා තිබෙනවා. එහෙත් බණ්ඩාරනායක මහත්මිය, 'දිනකර' පත්තරේ අපේ පත්තරේ නොවෙයි" කියනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා (සෞඛ්‍ය ඇමතිතුමා)**

*(வைத்திய கலாநிதி ரஞ்ஜித் அத்தபத்து—சுகாதார அமைச்சர்)*

**(Dr. Ranjith Atapattu—Minister of Health)**

ඒක දුවගෙ පත්තරේ.

**රනිල් වික්‍රමසිංහ මහතා**

*(திரு. றணில் விக்ரமசிங்ஹ)*

**(Mr. Ranil Wickremasinghe)**

ඒක කාගෙද කියන්න මම දන්නේ නැහැ. "ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයා මමයි" කියා බණ්ඩාරනායක මහත්මිය කියා තිබෙනවා ඉරිදා උදේ 'දිවයින' පත්තරයෙන් මම දැක්කා. "මට එන්නට බැරි නම් මම අපේක්ෂකයෙක් නම් කරනවා" කියලත් තිබුණා. ඔව්! ඒ උදේ වරුවේ.

**මන්ත්‍රීවරයෙක්**

*(அங்கத்தவர் ஒருவர்)*

**(A Member)**

කාගෙ පත්තරේද?

**රනිල් වික්‍රමසිංහ මහතා**

*(திரு. றணில் விக்ரமசிங்ஹ)*

**(Mr. Ranil Wickremasinghe)**

'දිවයින' පත්තරේ. දැන් ඒකලු පක්ෂයේ පත්තරේ. ඊළඟට මම එදා හැන්දෑ වරුවේ රොස්මිඩ් පෙදෙස පසු කර ගෙන යද්දී දැක්කා, "අපේ අනාගත ජනාධිපති හෙක්ටර් කොබ්බෑකඩුව" කියා එතන ගහලා තිබෙනවා. මොකක්ද තත්ත්වය? ඒක අපි දැන ගන්නට කැමතියි.

**මන්ත්‍රීවරයෙක්**

*(அங்கத்தவர் ஒருவர்)*

**(A Member)**

රොස්මිඩ් පෙදෙස පැත්තේ යන්න තමුන්නාන්සේලා භය නැද්ද?

**රනිල් වික්‍රමසිංහ මහතා**

*(திரு. றணில் விக்ரமசிங்ஹ)*

**(Mr. Ranil Wickremasinghe)**

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කථා කරන්නේ කවුරු වෙනුවෙන්ද කියා අපි දැන ගන්න කැමති. මෙතෙක් කල් කිව්වා—[බාධා කිරීමක්]

කරුණාකර තමුන්නාන්සේලාගේ පක්ෂය මොකක්ද කියා කියන්න. තමුන්නාන්සේ නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමා [අනුර බණ්ඩාරනායක මහතා] පාවා දීලයි මෙතනට ඇවිදින් ඉන්නේ.

**ආනන්ද දසනායක මහතා**

*(திரு. ஆனந்த தஸநாயக்க)*

**(Mr. Ananda Dassanayake)**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය.



**රනිල් වික්‍රමසිංහ මහතා**

*(திரு. றணில் விக்ரமசிங்ஹ)*

**(Mr. Ranil Wickremasinghe)**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මොන පිලේද?

**ආනන්ද දසනායක මහතා**

*(திரு. ஆனந்த தஸநாயக்க)*

**(Mr. Ananda Dassanayake)**

එහෙම කොටසක් නැහැ.

**රනිල් වික්‍රමසිංහ මහතා**

*(திரு. றணில் விக்ரமசிங்ஹ)*

**(Mr. Ranil Wickremasinghe)**

තමුන්නාන්සෙ කියන්න. කවුද තමුන්නාන්සේලාගේ අපේක්ෂකයා?

**ආනන්ද දසනායක මහතා**

*(திரு. ஆனந்த தஸநாயக்க)*

**(Mr. Ananda Dassanayake)**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එකයි.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

Order, please! Order, please! The hon. Member for Kotmale (Mr. Ananda Dassanayake), I can give you a chance to speak. You might mention all that after the Hon. Minister.

**රනිල් වික්‍රමසිංහ මහතා**

*(திரு. றணில் விக்ரமசிங்ஹ)*

**(Mr. Ranil Wickremasinghe)**

Mr. Speaker, I do not blame the hon. Member for Kotmale for firing questions at me, because he finds it embarassing to look at the face of the Second Member for Nuwara Eliya-Maskeliya (Mr. Anura Bandaranaike) after he betrayed him.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

But they are so close to each other.

**රනිල් වික්‍රමසිංහ මහතා**

*(திரு. றணில் விக்ரமசிங்ஹ)*

**(Mr. Ranil Wickremasinghe)**

Yes, so he wants to fire the questions at me. But we ourselves do not know whom they represent, on whose behalf they speak.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

Within the House I will look after them.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. றனில் விக்கிரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)

Yes, Mr. Speaker, with all due respect, I do not think even you know whom they represent, and they cannot look at each other. (*Interruption.*)

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I think you are straying further away. Order, please ! (*Interruption*). Hon. Member for Kotmale, I warned you once. Yes, carry on.

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. றனில் விக்கிரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)

Mr. Speaker, I was discussing the Development Councils and the background in which the Sri Lanka Freedom Party refused to contest. They called this Bill anti-democratic. But the fact was, not that the Bill was anti-democratic. We have held our elections. The fact was that there were so many disputes in the Sri Lanka Freedom Party that they could not put forward a list of the candidates. Today they have gone to the extent of having betrayed their leader Mrs. Bandaranaike. They have even gone against her wishes. The three members of the group–the hon. Member for Attanagalla (Mr. Lakshman Jayakody), the hon. Member for Gampaha (Mr. S. D. Bandaranaike), and the hon. Member for Kotmale–attended the meeting of the Politbureau.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Are you not straying away too much from this Bill ?

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. றனில் விக்கிரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)

No, I want to get back, Mr. Speaker, to the question of the Development Councils. There is always the propaganda that is carried on by the Sri Lanka Freedom Party saying that the Bill is anti-democratic. But it is not that it is anti-democratic ; it is the inability of the Sri Lanka Freedom Party to participate in the democratic process whether at village level or at district level. (*Interruption*)

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please ! I have cautioned the hon. Member for Kotmale. You can make any allegation when you start your speech. Do not disturb the Hon. Minister. (*Interruption*). I think I will warn you once again. Please do not disturb.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

That is not fair, Sir. I am not making any commitment, Sir. I am not prepared to make any commitment.

The Hon. Minister is doing so, Sir. Being a Minister he is talking nonsense.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please !

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. றனில் விக்கிரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)

It it fair to stab your leader in the back ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please ! I am not going to give you any further warning. I am asking you not to disrupt or disturb when any Member is on his feet.

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. றனில் விக்கிரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)

It is their inability to stay with the democratic process. It is considered by hon. Members of the Sri Lanka Freedom Party as being anti-democratic. It is not so. The Development Councils are there to enable the people to participate in the administration at different levels ; but the Sri Lanka Freedom Party is not participating. Their inability is due to their problems. In fact when their leader Mrs. Bandaranaike wanted to nominate the Second Member for Nuwara Eliya-Maskeliya there were groups that were against it. I read the papers, and I understand from the papers like the " Island " that a large number of organizers favour the Second Member for Nuwara Eliya-Maskeliya. But the politbureau wants instead to nominate the former Minister of Lands. So inside their own party there is no democracy. How then can they participate ?

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(வைத்திய கலாநிதி ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

How can they identify themselves with the Gramodaya Mandalayas ?

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. றனில் விக்கிரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)

Yes, with the Gramodaya Mandalayas or the Sanwardhana Sabhas. The hon. Member for Attanagalla is going off. He could not even identify our Chairman. The problem is they cannot identify their own Chairman. So it is in this position, I would like to urge the members

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

of the Sri Lanka Freedom Party to take part in this process. These internal disputes cannot be settled by us. But the fact that you have internal disputes does not mean that the process of Development Councils is anti-democratic.

Yours is an internal struggle. Some of your people are determined to see that the hon. Second Member for Nuwara Eliya-Maskeliya does not come forward as a Presidential candidate. We have nothing to do with it. We would certainly like to see many Members of Parliament presenting as many views as possible, but there is a big campaign that is going on in the city. All the walls are plastered with posters, as I mentioned. Some are supporting the former Minister of Lands & Agriculture, Mr. Hector Kobbekaduwa. That is what is generally called the Hector-actor-trader group—(*Interruption.*) I do not know where the proctor is. Where is the proctor ? Hector the proctor ! Into this confusion why bring the Development Councils Bill ?

In fact, what we see today is ultimately the victory of the Hector-actor group, and that Viyaya Kumaranatunga has today come out as a power within the SLFP—a rising star. We do not know whether it is a democratic process. According to the " Island ", the majority of the organizers are for the hon. Second Member for Nuwara Eliya-Maskeliya. But what has happened is that Vijaya Kumaranatunga, the Assistant Secretary of the SLFP, has today come forward as the chief spokesman. In fact, today I happened to meet some members of the SLFP group whom I knew and they say that Kumaranatunga is no longer the " kumara " ; he is now the " raja ". එච්චරයි කිව්වෙ. He is taking over the whole Party.

I am told that he, Mr. Hector Kobbekaduwa and Mr. Illangaratne went and told Mrs. Bandaranaike, " If you do not accept our nomination, if you do not accept our decision, we will walk away and we will split the politbureau and you will not be able to summon the meeting of the all-island committee. " Mr. Ratnasiri Wickremanayake, the Secretary, did not even send out the letters to summon the committee, though Mrs. Bandaranaike, the party leader, wanted it. Today there has been a complete change in the political picture, and for the first time we find the emergence of a film star as a power in a political party. Whether he thinks this is the first step which will take him on the road that took Ronald Reagan to power, I do not know. But these are facts which we have to take note of, which we cannot forget, because the SLFP or whatever factions of it are saying that the Development Councils Bill is anti-democratic. It is not so. The fact is that there has been a fundamental change in the leadership composition of the Sri Lanka Freedom Party, and some of those who cannot adjust themselves to it are now trying to throw mud at us so that the public will not see what is happening within—(*Interruption.*)

Why, you were all boycotting it, but I think today in fact Mr. Sumathipala Jayawardena has been deprived of his seat in the MMC. There are a large number of seats in the Development Councils which have not been filled. Will they be filled by the hon. member for Medawachchiya or by nominees of Mr. Vijaya Kumaranatunga who is taking over? These are very relevant questions to all of us who are participating in this debate on the Development Councils Bill.

I do not want to take any more of your time. I thought I should apprise the House of these facts because of the false propaganda that has been going on in the country, especially propaganda carried on by different factions of the Sri Lanka Freedom Party. I hope that hon. Members of the SLFP, the diffenent groups that they represent, would be able to tell us the real position. I think they owe an explanation not only to this House but also to the country as to the state of their party today.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

ගරු කථානායකතුමනි, සංවර්ධන සභා (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරන්නට ගිය ගරු අධ්‍යාපන ඇමතිතුමාට පාර වැරදිලා වෙන පාරක ගියාය කියා මා සිතනවා. ඇත්ත විශයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නඩත්තු කරන්නට වගෙ ලොකු කැක්කුමකින් එතුමා කථා කළා. අපි බොහොම ස්තුතිවන්ත වෙනවා, අපේ පක්ෂය ගැන ඒ විධියට නොයෙක් විධියේ මත ඉදිරිපත් කිරීම ගැන.

**රනිල් වික්‍රමසිංහ මහතා**
*(திரு. றனில் விக்ரமசிங்ஹ)*
(Mr. Ranil Wickremasinghe)

Which Party are you representing? Do you accept Mrs. Bandaranaike's leadership?

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

That is none of your business.

**රනිල් වික්‍රමසිංහ මහතා**
*(திரு. றனில் விக்ரமசிங்ஹ)*
(Mr. Ranil Wickremasinghe)

Mr. Speaker, as a Member of this House I have a right to know it.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

You need not take all that courage—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please!

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

Our Party members are there to look after that.

ගරු කථානායකතුමනි, මගේ මිත්‍ර අධ්‍යාපන ඇමතිතුමාට මම බොහොම සලකනවා. එතුමා හොඳ අධ්‍යාපන විශාරදයෙක් නොවුණත් නීති විශාරදයෙක්. නීතිය ගැන හොඳ දැනීමක් එතුමාට තිබෙනවා. හැබැයි "ප්‍රැක්ටිස්" එකක් නැහැ. ඒ වුණත් ඉගෙනගෙන තිබෙනවාය කියල අපි පිළිගන්නවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සංවර්ධන සභාවලට විරුද්ධ වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රජාතන්ත්‍ර විරෝධී නිසා දැයි එතුමා අහනවා. ඒ අවස්ථාවේදී අපේ තර්කය වුණේ මොකක්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් අප කියා සිටියේ එදා තිබුණු ගම් කාර්ය සභාවලින් මේ පළාත් ආණ්ඩු සභාවලින් සහ සුළු නගරසභාවලින් මේ සියලුම කටයුතු කෙරුණු නිසා මේ වැඩ පිළිවෙලට අප එකඟ නොවන බවයි. මේ විධියට අමුතුවෙන් ක්‍රමයක් හදන්න වුවමනා නැති බවයි. අපි කිව්වේ එම නිසා අපි මේකට එකඟ වන්නේ නැහැ. ග්‍රාමෝදය මණ්ඩල සම්බන්ධව ගරු අගමැතිතුමා ඉදිරිපත් කර තිබෙන සියලුම කටයුතු ගම් කාර්ය සභාවලින් කෙරුණා. ග්‍රාමෝදය මණ්ඩල අරමුදල පනතෙහි පැහැදිලිව විස්තර කර තිබෙන සියලුම කටයුතු—සංස්කෘතික කටයුතු, ආගමික කටයුතු, ආර්ථික කටයුතු, පාරවල් පිළිබඳ කටයුතු, පාඨශාලීය කටයුතු, ක්‍රීඩා කටයුතු යනාදී මේ සියල්ලම—ගොනු කර තිබුණා, ගම් කාර්ය සභාවලට. ඒ පනතේ තිබෙනවා සියල්ලක්ම. එහෙම නම් මොකටද මේ තවත් පනත්?

මම හැම වෙලාවේම කියනවා, එදත් කිව්වා, ආණ්ඩුවක් බලයට පත් වුණ විට, ඒ ආණ්ඩුවලින් පත්වෙන ඇමතිවරුන් සමහර විට තමන්ගේ නම ඉතිහාස ගත වීම සඳහා එක එක පනත් ගෙන එනවා. අපේ අධ්‍යාපන ඇමතිතුමාත් පසුගිය කාලයේ පනතක් ගෙන ආවා, අධ්‍යාපන ධවල පත්‍රිකාව කියල. උන්නැහේ හිතුවා හැම දෙනාම පනත් ගෙනෙනවා, මමත් ගෙනෙන්න ඕනෑ කියා. එහෙම හිතල එකක් ගෙනාවා. සමහර විට ගරු අගමැතිතුමා වගේ අය විශාරද බුද්ධියකින් යුතුව, දේශපාලන වශයෙන් බලා, නොයෙක් විධියට බලා, තමන්ගේ බලතල සමහර විට පක්ෂයේ බලතල වැඩි දියුණු කර ගැනීම සඳහා ඒ විධියට පනත් ගෙන එන විට, තවත් කෙනෙක් අර නයා පෙනේ පුප්පන කොට ගැරඬියත් සමහර විට ඇවිත් ඌත් පෙනේ පුප්පන්න උත්සාහ කරනවා වගේ කටයුතු කරනවා. ඒ වගේ, ඇමතිවරුන් පිට පිට පනත් ගෙනාවා. ඔම කතාගාවු වෙනවා අපේ අධ්‍යාපන ඇමතිතුමාගේ අධ්‍යාපන ධවල පත්‍රිකාව ගැන. එයට මොකද වුණේ? ඉතා ඉක්මණින් ක්‍රියාත්මක කරන්න ඕනෑ කිව්වා. දැන් එය නැහැ. එය උපන් ගෙයිම මැරුණා.

ඒ නිසා, ගරු කථානායකතුමනි, මේ පනත සම්බන්ධයෙන් අපේ තිබෙන විරුද්ධත්වය එදත් අපි ප්‍රකාශ කළා. පසුගිය කාලයේ තිබුණ ක්‍රමය අනුව ගමේ මිනිසට යම්කිසි විධියකට තරගයකට ඉදිරිපත් වී ගම්කාර්ය සභාවකට ඇවිත්, ඒ ගම්කාර්ය සභාවෙන් ඊළඟට ප්‍රාදේශීය වශයෙන් ගම්කාර්ය සභාවල නායකත්වය අරගෙන සමස්ත ලංකා වශයෙන්, දිස්ත්‍රික්ක වශයෙන් නායකත්වයට පැමිණෙන්නට අවස්ථාව තිබුණා. එබඳු අය තමයි වැඩි දෙනෙක් මේ පාර්ලිමේන්තුවට ඇවිත් ඉන්නෙ. එදා සිට අද වන තෙක්ම මේ පාර්ලිමේන්තුවට පැමිණි අයගෙන් වැඩි දෙනෙක්ම ඒ ගම්කාර්ය සභාවල කටයුතු කළ අයයි. ටික දෙනයි, එයින් බැහැරව පැමිණ සිටින්නෙ. එහෙම නම් පාර්ලිමේන්තුවට පැමිණීමට නැත්නම් මුළු රට වෙනුවෙන්ම සේවයක් කරන්නට—සමාජ සේවයක් කරන්නට—පිවිසීමේ පළමුවැනි පඩිය තමයි එදා තිබුණ ගම්කාර්ය සභා ක්‍රමය. මේ ගරු සභාවේ හෝ, මීට කලින් තිබුණ පාර්ලිමේන්තුවල හෝ, රාජ්‍ය මන්ත්‍රණ සභාවේ හෝ, ගම්කාර්ය සභාවක හරි පළාත් ආණ්ඩු සභාවක හරි කටයුතු නොකළ කිසිම කෙනෙක් සිටියාය කියා, මම හිතන්නෙ නැහැ. ඒ හැම දෙනාම ඒ ඉනිමගේ නැග්ගා.

ගමේ සාමාන්‍ය මිනිසාට, මහජනතාවට සේවයක් කර, තමාගේ දක්ෂකම්, අවංකකම් පෙන්වා, ඒ අනුව ගමේ ජනතාවගේ, ප්‍රදේශයේ ජනතාවගේ කැමැත්තෙන් පාර්ලිමේන්තුවට එන්න පුළුවන්කම තිබුණා. අන්න ඒ අවස්ථාව දැන් කැපිල ඉවරයි. දැන් ගමේ මිනිහාට ගම් කාර්ය සභාවට එන්න තිබුණ අවස්ථාව නැහැ. ගමේ තරුණයාට තමන් කොයි තරම් ජනප්‍රිය වුණත් එන්න ක්‍රමයක් නැහැ. ඒ වගේම ප්‍රදේශීය වශයෙන් දිස්ත්‍රික්කයේ තිබුණ ගම්කාර්ය සභා සම්මේලනයට එන්න විධියක් නැහැ. ඒවා ඔක්කොම අහෝසියි. ඊළඟට සමස්ත ලංකා වශයෙන් තිබුණ ගම්කාර්ය සභා සම්මේලනවලට එන්න විධියක් නැහැ. ඒවා සම්පූර්ණයෙන්ම අහෝසි කර දැම්මා. අන්න ඒ නිසයි, අපි මේ ක්‍රමය වැරදියි කිව්වෙ. ඒ නිසයි අපි මේ පනතට විරුද්ධ වුණේ. ගමේ ජනතාවට එන්න තිබුණ ඉනිමගක් නැති කළයි කියන තර්කය උඩයි අපි විරුද්ධ වුණේ.

මම එදත් පැහැදිලි කළා, ග්‍රාමෝදය මණ්ඩලවලත්, ගම්කාර්ය සභාවලත්, ග්‍රාම සංවර්ධන සමිතිවලත් වෙනසක් නැති බව. මට නම් පෙනෙන්නේ නැහැ, කිසිම වෙනසක් තිබෙන බවක්. පනත්වල තිබෙන වචන පමණක් ටිකක් වෙනස් කර තිබෙනවා. නමුත් ප්‍රතිපත්ති වශයෙන් බැලුවාම ග්‍රාමෝදය මණ්ඩලත් එකයි, ග්‍රාම සංවර්ධන සමිතිත් එකයි. ප්‍රතිපත්තිත් එකයි, පරමාර්ථත් එකයි. එහෙම නම් මේවා ඇති කිරීමෙන් ඇති වැඩේ මොකක්ද? මම දන්නේ නැහැ, ගරු අගමැතිතුමා මොන අභිප්‍රායකින් කටයුතු කරනවාද කියා. මේ පනත් වෙනස් කිරීමෙන් සිදුවෙන්නේ රටේ කරගෙන ගිය වැඩ අඩපනවීමයි. මම හිතන විධියට දැනට මේවාට මුදල් නැතිකම නිසා ගරු අගමැතිතුමා 'ෆන්ඩ්' එකක් නැත්නම් අරමුදලක් ඇති කරන්න උත්සාහ කරනවා. ඒ අරමුදල ඇති කර——

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)

ඒක නරකද?

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

අපි කියන්නෙ නැහැ, හොඳයි කියලවත්, නරකයි කියලවත්. ගරු අගමැතිතුමා කරගෙන යන වැඩේ ගන පමණයි, අපි කියන්නෙ. අරමුදලක් කරන්න යනවා. ඒ අරමුදල——

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

මේ සාකච්ඡා කරන්නේ ඒ අරමුදල පිළිබඳ පනත නොවෙයි. ඒක සම්මත වී අවසානයි. සංවර්ධන සභාවල සංශෝධන කීපයක් ගැන නැත්නම් ග්‍රාමීය මට්ටමට බල තල ලබා දීම ගැනයි, මේ සාකච්ඡා කරන්නේ. මගේ හිතේ ගරු මන්ත්‍රීතුමාට වැරදි පනතයි, අසුවී තිබෙන්නේ.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

පැහැදිලි කර දීම ගැන ගරු අගමැතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. මම කතාව කරගෙන ගියා. මාව වෙනත් ස්ථානයකට ඇද දැම්මේ අපේ මන්ත්‍රීවරුයි. මම ඒ ගැනත් ස්තුතිවන්ත වෙනවා. ඒ කියන්නෙ පාර්ලිමේන්තුවේ සටන් ඒ විධියට තිබෙන්න ඕනෑ. අපි කියන්නෙ නැහැ, එපාය කියා.

ගරු කථානායකතුමනි, මම හිතන හැටියට මේ සංවර්ධන සභා කටයුතු සම්බන්ධ[බාධා කිරීම]මම කොටස් කීප යක් ලකුණු කරගෙන තිබෙනවා. මේ සංවර්ධන සභා මන්ත්‍රීවරුන් කියා කොටසක් සිටිනවා. මම පළමුවෙනුත් කිව්වා, මෙහි අවුලක් ඇති වන බව. [බාධා කිරීම්] අපට දී තිබෙන බිලේ සඳහන් වී තිබෙන්නේ 'සංවර්ධන සභා' කියායි. මම කියන්න කැමතියි, මේ සංවර්ධන සභා සම්බන්ධව [බාධා කිරීම්] තමුන්නාන්සේ ගෙම්බා වාගේ පච, පච ගාන්නේ නැතිව, කට නොගසා ඉන්නවා. පොල් ගෙම්බෝ ටිකක් ඉන්නවා මා ළඟ.

සංවර්ධන සභාවලට අපි විරුද්ධ වුණා. අපි එසේ විරුද්ධ වීම ගැන අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා අපට චෝදනා කළා. අපේ ග්‍රාමෝදය මණ්ඩලවලට විරුද්ධ වුණේ ඇයි කියා මම ඉස්සරවෙලා කිව්වා. අපි සංවර්ධන සභාවලට විරුද්ධ වුණේත් ඒ ප්‍රතිපත්තිය උඩමයි. පිහිටුවා ගෙන අවුරුදු 30 ක් 40 ක් ගත වී තිබෙන, සංවර්ධන සභාවලට වඩා වැදගත් පළාත් ආණ්ඩු සභා මගින් වැඩියෙන් වැඩ කරන්නට පුළුවන් ශක්තියක් තිබෙනවා. කාලයක් තිස්සේ නීති රීති අතින්, ප්‍රතිපත්ති අතින්, වැඩ පිළිවෙළ අතින්, නිලධාරීන්ගේ වැඩ කටයුතු අතින් ආදී සෑම අතින්ම සාර්ථක වැඩ පිළිවෙළක් ඒවා මගින් ගෙනයන්නට පුළුවන්කම තිබුණා. ඒ වැඩ පිළිවෙළ මේ රජයටත් ගෙනයන්න තිබුණා. මීට ඉහත තිබුණ රජය වල් ඒ වැඩ පිළිවෙළ ගෙන ගියා. මේ රජය ඒ වැඩ පිළිවෙළ වෙනස් කළාට අපි විරුද්ධයි. ඒක කිසිම තේරුමක් නැති වැඩක්.

සංවර්ධන සභා කියන එකේ තේරුම මොකක්ද? සංවර්ධන සභාවලින් කරන්නේත් අර කලින් කළ වැඩ ටිකමයි. කච්චේරිවල අදත් නිලධාරීන් එකතු කර ගන්නවා, දිස්ත්‍රික්කයේ සංවර්ධන සභා හතරේ පහේ ඒ මන්ත්‍රීවරුන්, නැත්නම් ඒ සභික මහත්වරුන් කැඳවා ගන්නවා. පළාතේ මන්ත්‍රීවරුන් කැඳවනවා, ඊළඟට, නාගරික මන්ත්‍රීවරුන් කියා සිටින කට්ටිය කැඳවා ගන්නවා. කොට්ටල්බද්ද ප්‍රදේශයේ මේ විධියට වැඩ කරන්න ගොස් වුණු සිද්ධි දෙකක්, තුනක් මම දන්නවා. මේ වැඩේ කරන්න ඕනෑයයි සංවර්ධන සභාවේ මන්ත්‍රීවරුන් යෝජනා කරනවා. ඊළඟට, පළාතේ මන්ත්‍රීතුමා, 'ඒ වැඩේට ප්‍රමුඛස්ථානය දෙන්න බැහැ, මේක කරන්න ඕනෑ' කියනවා. දැන් අවුලක්. 'ඒ දෙකම නොවෙයි, කරන්න ඕනෑ මම කියන වැඩේ' යයි ඊළඟට සමහර විට දිස්ත්‍රික් ඇමතිවරයා කියයි. ඒ මුදල් සම්මත කරන්න ඕනෑ මේ වැඩේටයයි එතුමා කියයි. ඔය විධියට එතැන කඹ ඇදිල්ලක්. දැන් අවුරුද්දකින් කිසිම වැඩක් කර ගන්න බැරි තත්ත්වයක් දැන් එතන ඇති වී තිබෙනවා.

මේ සංවර්ධන සභාවල බලය වෙනස් ක්‍රමයකට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තියෙන්න ඕන,. එසේ නැත්නම්, සංවර්ධන සභාවල සිටින මන්ත්‍රීවරුන්ගේ බලතල සීමා කරන්න ඕනෑ. එසේ නැත්නම්, කිසිම සංවර්ධන සභාවකින් වැඩක් කරන්න බැහැ. 'අපට තිබෙන බල තල එක සමානයි, අපි කියන දෙයක් කරන්න ඕනෑ' යි හැමදෙනාම කියනවා. ඡන්දයෙන් පත් වුණු පළාතේ මන්ත්‍රීවරුන් එවිට නිහඬ වෙනවා. මේ විධියේ ආරාවුල් තත්ත්වයක් මේ සංවර්ධන සභාවල ඇති වී තිබෙනවා.

කොළඹ දිස්ත්‍රික් ඇමතිතුමා කොළඹ සංවර්ධන මණ්ඩලයේ මූලාසනය ගෙන සිටි අවස්ථාවේදී එහි නොයෙක් විධියේ ප්‍රශ්න ඉදිරිපත් වී තිබෙනවා. [බාධා කිරීමක්] පච ,පච ගාන්නේ නැතිව ඉන්නවා. මේ මන්ත්‍රීවරුන් දෙන්නාටම විශේෂ උපකාරයක් කරලා මගේ පස්සෙන් තියා තිබෙන බවයි පේන්නේ

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)*
**(Mr. Weerasinghe Mallimaratchchi)**

සංවර්ධන සභාවල මූලාසනය ගන්නේ කවුද කියාවත් කොත්මලේ ගරු මන්ත්‍රීතුමා දන්නේ නැහැ. දිසා ඇමතිවරයා සංවර්ධන සභාවේ මූලාසනය ගන්නේ නැහැ. සංවර්ධන සභාවේ මූලාසනය ගන්නේ එහි සභාපති. කොළඹ සංවර්ධන සභාවේ සභාපති ඇල්මන් පීරිස් මහතා. දන්නෙ නැත්නම් අදවත් දැනගන්න.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

තමුන්නාන්සේගේ ප්‍රධානත්වයෙන් එය පැවැත් වුණාය කියා අද පත්තරේ තිබෙනවා මම දැක්කා. ඒ සංවර්ධන සභාවේදී නොයෙක් චෝදනා ඉදිරිපත් කර තිබෙනවා, කිසිම වැඩක් පසුගිය කාලයේ කෙරුණේ නැහැ කියලා. එයින් පෙනෙන්නේ මේ සංවර්ධන සභා නීතියෙන් සකස් කළා, යම්කිසි ක්‍රමයකුත් තිබෙනවා, මන්ත්‍රීවරුන් කියලා කොටසකුත් තේරුවා, නමුත් ඒ සැකිල්ල පමණයි තිබෙන්නේ කියන එකයි. ඇටසැකිල්ල පමණයි තිබෙන්නෙ, මස් නැහැ. මස් කියන්නෙ මිනිසුන්ට වැඩ. මහජනයාට වැඩ නැත්නම් මේ විධියේ නීති ගෙනල්ලා සම්මත කිරීමෙන් කිසිම වැඩක් නැහැ. [බාධා කිරීමක්] මස් දෙන්න නැහැ. ඒ කියන්නෙ මුදල් නැහැ. මේ නිසා අපේ විරුද්ධත්වය අපි ප්‍රකාශ කළා. මේක කවදාවත් හරියෙන්නෙ නැහැ. අපි ජනතාවට පොරොන්දුවකුත් දී තිබෙනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කවදා හරි බලයට පත් වුණොත් පැරණි ක්‍රමයට මෙය ගෙන යනවා කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රේණුකා හේරත් මහත්මිය (නුවරඑළිය දිසා ඇමතිතුමිය)**
*(திருமதி ரேணுகா ஹேரத்—நுவரெலிய மாவட்ட அமைச்சர்)*
(Mrs. Renuka Herath—District Minister, Nuwara Eliya)

ලකුණ මොකක්ද? අතද කකුලද? ලකුණ මොකක්ද?

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

ගරු අගමැතිතුමා එතුමාගේ වැඩපිළිවෙළක් ගෙන යනවා. අපි මුලින්ම කිව්වා අපි මේකට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා කියා. ඒ අනුව විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය [බාධා කිරීමක්].

**රේණුකා හේරත් මහත්මිය**
*(திருமதி ரேணுகா ஹேரத்)*
(Mrs. Renuka Herath)

වාඩිවෙන්න, වාඩිවෙන්න.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

මේක සමූපකාර සමිතියක වැඩක් නොවෙයි. මේක පාර්ලිමේන්තුව. තමුන්නාන්සේ සමූපකාර සමිතිවලට ගිහිල්ලා නම් ඔහොම නියෝග දෙනවා. [බාධා කිරීමක්] මේක සමූපකාර සමිති වැඩක් නොවෙයි. මේක පාර්ලිමේන්තුව. අන්න ඉන්නවා මෙතැන නියෝග දෙන්න අපේ ගරු කථානායකතුමා. එතුමාට පමණයි පුළුවන් මෙතැන නියෝග දෙන්න. තමුන්නාන්සේට පුළුවන් සමූපකාර සමිතිවලට ගිහිල්ලා මෙහෙම කරන්න, මේ විධියට ගනුදෙනුව බේරුම් කරන්න කියල කියන්න. ඒ වුණාට මෙහෙ බැහැ ඒවා. ඒවා එහෙදි [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මම නැහැ අරියාදුවක් කළේ. මගේ හොඳ මිත්‍ර දිසා ඇමතිතුමියට. [බාධා කිරීමක්] මම මෙතැනදී කියන්නෙ මේකයි: මේ පනත අපි පිළිගන්නෙ නැහැ අදත්. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සම්පූර්ණයෙන්ම මේ පනත වෙනස් කරනවා. කවදා හරි පළමු තිබුණු ක්‍රමයටම ගෙන එන්නට සම්පූර්ණ මහජන කැමැත්ත ලබාගැනීමට අපි ඔවුන්ට ඉදිරිපත් කරනවා.

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා (සෞඛ්‍ය ඇමතිතුමා)**
*(வைத்திய கலாநிதி ரஞ்ஜித் அத்தபத்து—சுகாதார அமைச்சர்)*
(Dr. Ranjith Atapattu—Minister of Health)

ගරු කථානායකතුමනි, සංවර්ධන සභා පනත ඉදිරිපත් කරන අවස්ථාවේ දී මමත් කථා කළා. අපි ඒ අවස්ථාවේ දී කිව්වා, අපේ බලාපොරොත්තුව තිබෙන්නේ ග්‍රාමීය මට්ටමේ තිබෙන දේශපාලන බෙදීම්වලින් තොරව සාමාන්‍ය ජනතාවට මේ රටේ සංවර්ධනයට සහභාගි වීමේ අවස්ථාව දීමයි මෙයින් කෙරෙන්නේ කියා. කාලයක් තිස්සේ වැඩ කටයුතු කරලා, මුදල් හදල් බෙදීම, බලය දීම ආදී දේවල තිබෙන අඩුපාඩුකම් දැකලා අද සංශෝධන පනතක් ඉදිරිපත් කර තිබෙනවා වැඩි වැඩියෙන් බලතල දිය යුතු වාතාවරණයක් ඇති වී තිබෙන නිසා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ප්‍රබලව වැඩ කළ අයත්, ජනතා විමුක්ති පෙරමුණට දැනට ප්‍රබලව වැඩ කරන අයත්, අපත් සමග අත්වැල් බැඳගෙන, ග්‍රාමෝදය මණ්ඩල තුළින් ගමක් ගමක් පාසා පොදු වැඩවලට සහභාගී වෙලා අද ගමේ නායකත්වය අරගෙන ක්‍රියා කරනවා. ඔවුන්ට අපි වැඩි වැඩියෙන් බලය දෙන විට, වැඩි වැඩියෙන් අවස්ථාව දෙන විට, මේ රටේ ජනතාව පාගාගෙන, රවටාගෙන, මේ රටේ සාමාන්‍ය අහිංසක ජනතාවට ගම් බද ජනතාවට නොයෙක් නොයෙක් පොරොන්දු දී ඔවුන් රවටාගෙන සිටි රදළවාදීන්ට අවස්ථාව නැතිවෙන බව දැනගෙන තමයි අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මේ රත්වෙලා තිබෙන්නේ.

මේ හැදීගෙන එන පරපුර බලන්නේ කා දිහාද? අපි දිහායි බලන්නේ. අපි මොනවද කතා කරන්නෙ, අපි කොහොමද හැසිරෙන්නෙ, අපේ දේශපලන පක්ෂ අපි කොහොමද නඩත්තු කරන්නෙ, අපේ වැඩපිළිවෙළවල් කොහොමද ආදිය ගැනයි ඔවුන් බලන්නේ. මට කණගාටුයි කියන්න, මේ රටේ ජනාධිපති පදවියට බලාපොරොත්තු තිබෙන නුවරඑළිය මස්කෙළිය දෙවන ගරු මන්ත්‍රීතුමාගේ (අනුර බණ්ඩාරනායක මහතා) ප්‍රධානත්වයෙන් මගේ ආසනයේ පැවැත්වූ රැස්වීමකදී ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ ඔය උත්තරීතර ආසනයේ වාඩිවෙලා හිටපු ස්ටැන්ලි තිලකරත්න මහත්මයා කථා කළ නිච නින්දිත වචන අහලා—මම ආඩම්බරයෙන් කියන්න ඕනැ— ගම්පහ මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මහතා) ඉංග්‍රීසියෙන් කිව්වා, කියලා.

" Don't talk filth, Stanley "

**අනුර බණ්ඩාරනායක මහතා** (නුවරඑළිය-මස්කෙළිය දෙවන)
*(திரு. அனுர பண்டாரநாயக்க—நுவரெலிய மஸ்கெலிய இரண்டாம் அங்கத்தவர்)*
(Mr. Anura Bandaranaike—Second Nuwara Eliya-Maskeliya)

I was presiding at that meeting. The former Speaker never used a single dirty word in that speech. I am sorry that the Hon. Minister made that reference.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The hon. Member for Gampaha is here. He can deny that; he can say yes or no to it.

**එස්. ඩී. බණ්ඩාරනායක මහතා** (ගම්පහ)
*(திரு. எஸ். டி. பண்டாரநாயக்க—கம்பஹா)*
(Mr. S. D. Bandaranayake—Gampaha)

I never said anything like that.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Accept the denial.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා**
*(வைத்திய கலாநிதி ரஞ்ஜித் அத்தபத்து)*
**(Dr. Ranjith Atapattu)**

I accept that I have not exactly quoted the words of the hon. Member for Gampaha. I have not quoted the exact words that the hon. Member for Gampaha used because I was not present at the meeting . But the young people who were listening to the speeches at that meeting said, " Sir, you do not have to hold meetings "–

" තමුන්නාන්සේලා මේ ගමේ ඇවිල්ලා රැස්වීම් පවත්වන්න ඕනෑ නැහැ, ඒ කොල්ලන් ඇවිල්ලා කළ වාචාල කථාවලට පස්සෙ, එතැන සිටි ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් ඒ කථා ඇසුවාට පස්සෙ මේ ගමේ එකම ඡන්දයක්වත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට දෙන්නෙ නැහැ " කියා ඒ උදවිය කිව්ව බව මේ අවස්ථාවේදී මම මතක් කරන්න කැමතියි. මන්ත්‍රීතුමා ජනාධිපති වෙන්න බලාපොරොත්තුවක් නැද්ද? [බාධා කිරීම්.]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

I cannot allow you to have cross talks. You carry on with your speech.

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා**
*(வைத்திய கலாநிதி ரஞ்ஜித் அத்தபத்து)*
**(Dr. Ranjith Atapattu)**

අපි මේ මහන්සි ගන්නේ ගරු කථානායකතුමනි, ලංකාවට නිදහස ලැබී අවුරුදු 35 ක් ගිහිල්ලත් යම්කිසි කොටසකට සීමා වී තිබුණු බලතල, ඒ වාගේම අපේ රජයට තිබෙන බලතල, මේ සභාවට තිබෙන බලතල අපේ ගමේ උදවියගේ අතට දෙන්නයි; තමන්ගේ වැට හදාගන්න, තමන්ගේ පාර හදාගන්න, තමන්ගේ බෝක්කුව හදාගන්න අවස්ථාව සලසා දෙන්නයි. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියනවා, ඒ අය තිබුණු ක්‍රමයටම යනවාලු. අවුරුදු 40 ක් තිස්සේ දේශපාලන ඡන්දයෙන් පත් වූ ගම්සභා මන්ත්‍රීවරුන් තමන්ගේ බෝක්කු හදාගත්තා. කොන්ත්‍රාත් අරගෙන බෝක්කු හැදුවා. එයේ බෝක්කු සෑදූ ඒ ගම්සභා අවුරුදු 7 ක් තිස්සේ අහෝසි කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අද මෙතන ඇවිත් පොරොන්දු වෙනවා, නැවත බලයට ආවොත් ඒ ගොල්ලන් ගම්සභා ඡන්ද පවත්වනවාය කියා. කොණ්ඩෙ බැඳපු චීනුන්ට ඔය කථා කිව්වොත් විශ්වාස කරාවි. මේ රටේ ඡන්දෙ දෙන මිනිස්සු ඔය කථා විශ්වාස කරන්නෙ නැහැ.

මේ රටේ සිටින ජනතාවගෙන් සියයට 60 ක් අවුරුදු 30ට වැඩි කාලයක් තුළ නිදහස් අධ්‍යාපනය ලැබූ බුද්ධිමත් ජනතාවක්. මේ වාගේ බොළඳ කථාවලින් ඒ අය නළවන්න බැහැ. ඒ මහත්වරු දන්නේ නැතුව ඇති ඒ ආපු ගම ගැන. ගැටමාන්න කියන්නේ පිටිසර ගමක් සියයට 90ක් පමණ පැල්පත්වල ජීවත් වන ගමක් අපොස සාමාන්‍ය පෙළ සමත් වුණු සියයට 90 ක් පමණ පෝලිමේ ආවා රක්ෂාවල් ඉල්ලාගෙන. හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිටිසර පළාතක උසස් පෙළ විද්‍යාගාරයක් තිබෙන එකම ගම්මානය ගැටමාන්න කියන ගම්මානය දොස්තරවරු, ඉංජිනේරුවරු, බිහිවුණු ගමක්. ඒ අය ගැන තුච්ඡවූවකටවත් සලකන්නෙ නැතිව, මෙසේ නින්දිත විධියේ රැස්වීමක් පැවැත්තුවා. අපි දන්නවා සිරිමා බණ්ඩාරනායක මුල් පුටුවේ තියාගෙන පුංචි ළමයින්ට පාසල් ළමයින්ට ඔරෙන්ජ් බාර්ලි බෝතලේ දමා අරක්කු විත පොවා, හාල් නැතිව බත් කන්නම්, මිරිස් නැතිව හොදි කන්නම්, අම්ම අපට කියනව නම් රෙදිත් නැතුව අපි යන්නම් " කියා පරම්පරාවක් කාලකන්නි කළ අය අද ඇවිත් මෙතන ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා ගම්බද ජනතාව ගැන කැක්කුමක් ඇතිව ගිරවාපත්තුවේ සිට, හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිට, අපේ වෘත්තිවලින් තිස් හතලිස් දාහක් අද සල්ලි හම්බ කරන්නට පුළුවන්කම තිබියදී ඒවා අත් හැර දමා, අපි මේ සභාවලට ඇවිත් සිටින්නේ ඔය පක්ෂවලට මුක්කු ගහන්න නොවන බව අපි ජනතාවට ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්න ඕනෑ.

කථානායකතුමනි, වැදගත් පරම්පරාවලින් වැදගත් පවුල්වලින් ආපු අය මේ සභාවේ ඉන්නවා. අපේ ඒ පවුල්වල අභාෂයෙන් අපි අවබෝධ කරගෙන තිබෙනවා, අපි කථා කරන්නෙ මොනවාද, අපි හැසිරෙන්නෙ කොහොමද, අපි මොන විධියෙන්ද රට දිහා බලන්න ඕනෑ කියා. අපේ පරම්පරාවල් නිසා අපට අහවල් අහවල් තැන් උරුමය කියා අපි හිතන්නෙ නැහැ. අපි ඒවා ලබාගන්න බලාපොරොත්තු වන්නේ ජනතාවගෙන් විතරයි. අන්න ඒ පාඩම තවම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉගෙනගත්තේ නැති නිසා තමයි, අද මෙතැන ඉන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලු දෙනාම නායකයන් වෙලා තිබෙන්නේ. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සාමාන්‍ය පාක්ෂිකයෝ නැහැ. ඉන්නෙ නායකයෝ විතරයි. පාක්ෂිකයන් නැති, නායකයන්ගෙන් පිරිච්ච බංකොලොත් දේශපාලන පක්ෂයකට අයිති මන්ත්‍රීවරුන් අද මෙතැනට ඇවිල්ලා 'අපි බලයට ආවාම ගම්සභා මැතිවරණ තියනවා'ය කියනවා. ඒ ගොල්ලන්ගෙ පාලන කාලයේ අවුරුදු 7 ක් තිස්සේ නොතියපු ගම්සභා මැතිවරණ තියන්නයි, දැන් කථා කරන්නේ.

ගරු අගමැතිතුමා මේ පොඩි සංශෝධනය මගින් කරන්න යන්නේ, මේ රටේ අහිංසක ජනතාව අතට ඇමතිවරුන්ගේ බලතල දෙන්නයි. මෙතෙක් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ තිබුණු ඒ ඒ ප්‍රදේශයේ සම්පූර්ණ සනීපාරක්ෂාව පිළිබඳ වගකීම, ඒ ඒ ප්‍රදේශයේ රෝහල් නඩත්තුව, ඒ ඒ ප්‍රදේශයේ නැත්නම් දිස්ත්‍රික්කයේ ඉන්න ගම්බද ජනතාව අතට භාර දෙන්න යන අවස්ථාවේදී ඒවා ගැන කථා කරන්නේ නැතිව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවිය ගම්සභා ගැන කථා කරනවා. ඒ ගම්සභාවලින් බෝක්කු හැදුවාලු. මොනවාද, මේ කථ?

කථානායකතුමනි, මේ අවස්ථාවේදී මා මීට වඩා දීර්ඝ ලෙස කථා කරමින් මේ ගරු සභාවේ කාලය ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ, සෑහෙන වැඩ කොටසක් අපට කරන්න තිබෙන නිසා. අනවශ්‍ය කථාවලට ඇහුම්කන් දෙන්න සැලැස්වීම මඟින් මේ ගරු සභාවේ වටිනා කාලය නාස්ති කරන්න එපාය කියා විරුද්ධ පාර්ශ්වයෙන් මා ඉල්ලා සිටිනවා. ඒ වෙනුවට, වැදගත් යෝජනාවක් කරන්න තිබෙනවා නම් ඒ යෝජනාව ඉදිරිපත් කරන මෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා]

ඒ සමගම මම තවත් එකක් කියන්න ඕනෑ. අපේ ආණ්ඩුව ක්‍රියාත්මක කරගෙන යන මේ වැඩ පිළිවෙල තවත් අවුරුදු 6 ක් හරියාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා ජනතාවගෙන් බලය ඉල්ලන ජනාධිපතිවරණය ඔක්තෝබර් මාසේ 20 වැනි දා පැවැත්වෙනවා. ඒ ජනාධිපතිවරණයේදී අපේ ජනාධිපතිතුමා විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබා ගෙන, අපේ ආණ්ඩුවේ මේ ස්ථිර පාලනය තව දුරටත් ඉදිරියට ගෙන යන්න ජනතාවගේ ආශීර්වාදය ලබා ගන්නවා. ඒ විධියට එතුමාට විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබා දෙන්න තීරණය කර තිබෙන මේ රටේ සාමාන්‍ය ජනතාව, මේ රටේ ජීවත් වන ඒ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව, බෞද්ධ, කතෝලික, ක්‍රිස්තියානි, හින්දු, මුස්ලිම් ජනතාව අත්-වැල් බැඳගෙන ඉදිරියට යන්න සූදානම් වී සිටින අවස්ථාවක ඒ ජනතාවගේ අත්ට මේ දෙන්න යන බලතල පමණක් නොව තව-තවත් බලතල දෙන්නේ කොහොමද කියා යෝජනා කරන හැටියට විරුද්ධ පාර්ශ්වයෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**
Order, please!

The sitting is suspended till 5 p.m.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, ප. ව. 5 ට නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

*அதன்படி, அமர்வு பி. ப. 5 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 5 p.m. and then resumed,* MR. DEPUTY SPEAKER (MR. NORMAN WAIDYARATNA) *in the Chair.*

**පී. ගනේෂලිංගම් මහතා (පඩිරිප්පු)**
*(திரு. பி. கணேசலிங்கம்—பட்டிருப்பு)*
**(Mr. P. Ganeshalingam—Paddiruppu)**

Mr. Deputy Speaker, while welcoming the Amendment to delegate powers to the Gramodaya Mandalayas by Development Councils and to make the Gramodaya Mandalayas corporate bodies, I would like to make some observations about the mode of election of Chairmen to the Gramodaya Mandalayas and to the Pradeshiya Mandalayas. Now, this amendment is actually giving sufficient powers to the Gramodaya Mandalayas. The Development Council and delegate its powers to the Gramodaya Mandalayas, the Executive Committee of the Development Council can delegate its powers to the Gramodaya Mandalayas and even the District Secretaries can delegate their powers to the Gramodaya Mandalayas. Corporate bodies like these should be freely elected. The Development Council members and Chairmen were elected by a free vote by the people of this country, whereas the Gramodaya Mandala Chairmen were elected by approved societies. The mode of election was specified only by a circular sent by the Secretary, Ministry of Local Government, Housing and construction.

In my electorate, Sir, overnight several societies were approved for the election of Gramodaya Mandala Chairmen. In one family alone, in Mandur, six societies were formed overnight and approval was given by the Assistant Government Agent, contrary to all the circulars sent by the local Government Ministry. The Local Government Ministry circular specifically mentions those who can authorise the societies that take part in Gramodaya Mandala Chairmen's elections. Except the R.D.S., most of the societies that took part in the Gramodaya Mandala elections in Batticaloa District, according to the circular sent by the Ministry of Local Government, had to be approved by the Assistant Commissioner of Local Government, that is, the Assistant Secretary in the District Development Council, whereas an election in my electorate took place purely on the approval of the Assistant Government Agent—AGA's Wellaweli and Kaluwanchikudi. A circular was sent by the Ministry of Local Government debarring Special Service Officers from taking part in the election of Gramodaya Mandala Chairmen—Circular No. /LM/77/9. But, in spite of this, the Special Service Officers stood for the election and two of them were elected, and when I made representations for their removal, the AGA Kaluwanchikudi took up the position that they were already elected as Chairmen of Gramodaya Mandalayas, and as such he had no power to remove them ! Even after the District Secretary specifically instructed the AGA of the area, quoting reference to this circular and sent a letter No. ET/A/65/PHS/2 of 12.7.82, these Special Service Officers who were elected as Chairmen of Gramodaya Mandalayas were permitted to stand for the Pradeshiya Mandala elections because there is no clear legal provision as to how the election for Gramodaya Mandalayas should be conducted. Now after making several representations to the Hon. Prime Minister, his Secretary and even to His Excellency, reports had been called for from the Assistant Government Agent of the area. After that the District Secretary had sent him reminders, the Senior Assistant Secretary of the Ministry of Local Government had sent him reminders, but with all that he has not replied any of those letters. Therefore, I have to now resort to legal action to remedy this situation. So, I must tell the Hon. Prime Minister that, when providing so much of power to the Gramodaya Mandalayas and Pradeshiya Mandalayas, he must ensure that either these bodies are freely elected bodies by a free vote by the people or at least for future guidance the societies that can take part in the election should be specifically laid down by a statute or by another amendment.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

The other matter is this. As these societies are not properly elected and because there are irregularities taking place at these elections I think there will definitely conflicts when you give so much of power to these societies. At least where our parties are concerned, we will not consider these Gramodaya Mandalayas and Pradeshiya Mandalayas in the Kalkudah and Paddirippu electorates as properly elected bodies. As a result, definitely–it is a human weakness–we will be reluctant to give them these powers, because we feel that someone has usurped these powers from the Development Council and the Executive body. So, I earnestly request the Hon. Prime Minister to go into these matters to see whether, if these Special Service Officers already elected cannot be removed, some legal remedy or some necessary amendment could be brought to the Development Councils (Amendment) Bill to rectify this situation.

අ. භා. 5.11

**ආර්. පී. විජේසිරි මහතා** (හාරිස්පත්තුව දෙවන)
*(திரு. ஆர். பீ. விஜேசிறி—ஹாரிஸ்பத்துவ இரண்டாம் அங்கத்தவர்)*
(Mr. R. P. Wijesiri—Second Harispattuwa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංවර්ධන සභා (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේදී ගරු අධ්‍යාපන ඇමතිතුමා කථා කරමින් ප්‍රකාශයට පත් කළා මේ සංවර්ධන සභා (සංශෝධන) පනත ගැන කථා කරන්නට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අයිතියක් නැත, පසුගිය කාලයේ මේ මේ දේවල් සිදු වුණාය කියා. ඊට පසුව කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) කථා කරමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සංවර්ධන සභා මැතිවරණය වර්ජනය කළේ මේ මේ හේතූන් නිසා යයි කරුණු ඉදිරිපත් කරන්නට උත්සාහ කළා; කරුණු ඉදිරිපත් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංවර්ධන සභා පනත උඩ පැවති මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඡන්දයෙන් වැළකී සිටීමට අවසාන මොහොතේ තීරණය කළ අවස්ථාවේ අපි තරඟ කළ යුතුයි කියන පදනම උඩ ඉඳ එදා තිබුණු දේශපාලන මණ්ඩලයෙන් පවා මම අස් වුණා කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි, මේ චෝදනාව කළ ගරු ඇමතිතුමාටත් චෝදනාවට උත්තර දුන් කොත්මලේ ගරු මන්ත්‍රීතුමාටත්. මේ මේ හේතූන් නිසා සංවර්ධන සභා මැතිවරණයට ඉදිරිපත් නොවුණා කියා පෙන්නුම් කරන්නට කොත්මලේ ගරු මන්ත්‍රීතුමා උත්සාහ කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1980 අගෝස්තු මාසයේ තමයි මේ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. ඒ අවස්ථාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රකාශයක් කර ඒ පනතට විරුද්ධත්වය දක්වා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් වන අපි මේ ගරු සභාවෙන් නැගිට ගියා. එසේ කර අපි ඒ පනත පිළිබඳ විවාදයට සහභාගී නොවී ඒ විවාදය වර්ජනය කළා. ඊට මාසයකට පමණ පසුව අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමස්ත ලංකා කාරක සභාව රැස්වූ අවස්ථාවේ සමස්ත ලංකා කාරක සභාවේ සභිකයෙකු වන ගම්පොල හිටපු මන්ත්‍රීවරයා වූ දි. මු. ජයරත්න මහතා මේ සංවර්ධන සභා මැතිවරණය ගැන සාකච්ඡාව ඇති වූ අවස්ථාවේදී අපි කළ අර ප්‍රකාශය අනුව මේ මේ හේතූන් නිසා අපි සංවර්ධන සභා ඡන්දයෙන් වැළකී සිටිය යුතුයි කියන යෝජනාව ඉදිරිපත් කළා. ඒ යෝජනාව ස්ථිර කරන්නටත් පෙර එවකට අපේ පක්ෂයේ සිටි නායිකාව වන අත්තනගල්ලේ හිටපු මන්ත්‍රීවරිය ඉදිරිපත් වී කියා සිටියා, අපි එදා මේ පනතට විරුද්ධ වුණත් ඒ පිළිබඳව පැවති විවාදය වර්ජනය කළත්, අද උද්ගත වී තිබෙන තත්ත්වය අනුව මේ සංවර්ධන සභා මැතිවරණය පමණයි ආණ්ඩුවට විරෝධය පෑමට ජනතාවට තිබෙන එකම අවස්ථාව, ඒ නිසා අපි එදා ඒ තීරණය ගත්තත් සංවර්ධන සභා මැතිවරණයට අපි ඉදිරිපත් විය යුතුයි; අපි ඉදිරිපත් නොවුණොත් ලංකා සමසමාජ පක්ෂය, ලංකා කොමියුනිස්ට් පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ වැනි පක්ෂ තරඟ බිමට වැදීම නිසා අපේ පාක්ෂිකයින් ඒ පක්ෂවලට කතිරය ගැසීමෙන් ඒ පක්ෂවලට නැඹුරු වන්නට ඉඩ තිබෙනවා; ඒ නිසා අපි මුලින් මේ පනතට විරුද්ධ වුණත් මැතිවරණයේදී අපි තරඟ කළ යුතුයි කියා. ඒ යෝජනාව අත්තනගල්ලේ හිටපු ගරු මන්ත්‍රීවරිය එදා ඉදිරිපත් කළා.

1980 සැප්තැම්බර් මාසයේ දී ඒ යෝජනාව ස්ථිර කරමින් අපේ දේශපාලන මණ්ඩලයේ සිටි උපසභාපතිවරයකු වන ෂන්මුගලිංගම් මහතා කියා සිටියා, සංවර්ධන සභා මැතිවරණයට ඉදිරිපත් වන්නෙ නැති නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසුරුවා හැරීම සුදුසුය කියා ඒ මහතා යෝජනා කරනවාය කියල. මේ විධියට තර්ක විතර්ක කරලා, එදා සැප්තැම්බර් මාසයේ මුල් භාගයේදී අපි තීරණය කළා, ' ළඟ එන සංවර්ධන සභා මැතිවරණයට ඉදිරිපත් විය යුතුයි; තරඟ කළ යුතුයි; දැන් අතුරු මැතිවරණ නැහැ. පළාත් පාලන මැතිවරණ නැහැ. මැතිවරණයක් හැටියට අපිට බලාපොරොත්තු වෙන්නට පුළුවන් වන්නෙ ඊළඟ මහා මැතිවරණයයි. ඒ මැතිවරණය එනතෙක් මේ ආණ්ඩුවට විරෝධතාව පෙන්වීම පිණිස තිබෙන එකම අවස්ථාව මේ සංවර්ධන සභා මැතිවරණයයි " කියලා. එදා, තරඟයෙන් වැළකී සිටිය යුතුය කියා ඉදිරිපත් කළ යෝජනාවක් ස්ථිර කරන්නටවත් කෙනෙක් සිටියේ නැහැ. ඒ මැතිවරණයට ඉදිරිපත් විය යුතුය කියන යෝජනාව ඒකච්ඡන්දයෙන් සම්මත වුණා. ඒ මාසයේදීම තමයි එවකට අත්තනගල්ලේ මන්ත්‍රීතුමියගේ ප්‍රජා අයිතිය අහෝසි කළ යුතුය කියන යෝජනාව මේ සභාවට ඉදිරිපත් කළේ. ඔක්තෝබර් 16 වනදා එතුමියගේ ප්‍රජා අයිතිය අහෝසි වුණා. මෙන්න මේ මේ හේතූන් නිසා අපි එදා මුලින්ම සංවර්ධන සභා පනතට විරුද්ධ වුණත්, අපි සංවර්ධන සභා මැතිවරණයට ඉදිරිපත් විය යුතුය කියා මාස තුනකට පෙර විශාල වශයෙන් කරුණු පෙන්නල ඒ යෝජනාව ගෙන ආ අපේ හිටපු නායිකාව, එක පාරටම ඔක්තෝබර් මාසයේදී නොව නොවැම්බර් මාසයේදී අපේ සමස්ත ලංකා කාරක සභාව නැවත වරක් රැස්වුණු අවස්ථාවේදී එක පාරටම කියා සිටියේ එදා එවැනි තීරණයක් ගත්තත්, සංවර්ධන සභා ඡන්දයෙන් දැන් අපි වැළකී සිටිය යුතුය කියලයි. ඒ සම්බන්ධයෙන් එතුමිය යෝජනාවකුත් ඉදිරිපත් කළා. මේ යෝජනාවට පක්ෂව හා විපක්ෂව විශාල පිරිසක් කථා කළා. එදා අපිට තීරණය කට බහින්නට බැරි වුණා, තරඟ කළ යුතුද නැද්ද කියා. වාද විවාද කර කටයුතු අවසන් කළා. ගිය අවුරුද්දේ ඒ මැතිවරණය ආසන්න වන කොට—මාර්තු මාසයෙදි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. පී. විජේසිරි මහතා]

නැවත වරක් සමස්ත ලංකා කාරක සභාව රැස්වෙලා මේ ගැන තීරණයක් ගන්න උත්සාහයක් ගත්තා. පක්ෂව හා විපක්ෂව තර්ක විතර්ක ඇති වෙලා එදත් බැරි වුණා තීරණයක් ගන්න. ඊට පස්සෙ සංවර්ධන සභා මැතිවරණය තිබුණු අවුරුද්දේ අප්‍රේල් මාසයෙ 10 වනදා සමස්ත ලංකා කාරක සභාව රැස්වෙලා කලින් වාගේ පක්ෂව හා විපක්ෂව තර්ක විතර්ක කරල, එක වැඩි ඡන්දයකින් තීරණය කළා, සංවර්ධන සභා මැතිවරණයට ඉදිරිපත් විය යුතුය කියා. මේ විධියට වැඩි ඡන්ද එකකින් යෝජනාව සම්මත කර ගත්තා. අප්‍රේල් මාසයෙ 27 වනදායි නාම යෝජනා භාර ගැනීමට තිබුණේ. නමුත් අප්‍රේල් මාසයේ 27 වනදා වනකොට නැවත වරක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සිද්ධ වුණා එම තරඟයෙන් ඉවත් වෙන්නට. මේ දවස් ගණන ඇතුළතදී අපට සැහෙන ප්‍රශ්න කීපයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. මම කලින් සඳහන් කළ විධියට අප්‍රේල් මාසයෙ 10 වනදා සමස්ත ලංකා කාරක සභාව වැඩි ඡන්ද එකකින් තීරණය කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සංවර්ධන සභා මැතිවරණයට ඉදිරිපත් විය යුතුය කියා. පසුවද ම අපි සිංහල අවුරුද්ද වෙනුවෙන් අපේ ගම්රටවලට, අපේ ආසනවලට, අපේ ගෙවල්වලට ගියා. අප්‍රේල් මාසයේ 11 වනදා, එවකට සිටි පක්ෂ නායිකාව දේශපාලන මණ්ඩලය රැස් කරල "සංවර්ධන සභා මැතිවරණයට ඉදිරිපත් වුණාට කමක් නැහැ. ඒ සඳහා වියදම් කරන්න පක්ෂයට මුදල් නැහැ. සංවර්ධන සභා මැතිවරණය වෙනුවෙන් එක් දිස්ත්‍රික්කයකට පක්ෂ මූලස්ථානයෙන් පෝස්ටර් දෙදහසක් පමණක් දෙන්න පුළුවනි. අනික් සියලු දේ සඳහාම ඒ ඒ දිස්ත්‍රික්කවලින් මුදල් සොයා ගෙන තරඟ කළ යුතුයි" කියා තීරණයක් ගෙන තිබෙනවා.

තවත් කමිටු දෙකක් පත් කළා. අපේ පක්ෂයේ නායක මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) මැතිවරණය මෙහෙයවීමේ නායකයා වශයෙන් පත් කළා. සිංහල අවුරුද්ද අවසන් වී අප්‍රේල් මාසයෙ 16 වනදා අපි ආපසු ආවායින් පස්සෙ අපට දැන ගන්න ලැබුණා මේ විධියේ නියෝග ලැබී තිබෙනවාය කියල. ඒ අනුව අපි තීරණය කළා, ලංකාවේ සියලුම දිස්ත්‍රික්කවලට මන්ත්‍රී ධුරාපේක්ෂකයන් සොයලා, ලැයිස්තු සකස් කර, මැතිවරණයට ඉදිරිපත් කරවීමට වහාම සූදානම් විය යුතුය කියා. මේ අවස්ථාවේදී නොයෙක් විධියේ ප්‍රශ්න ඇති වුණා. අසවිල් දවසට පෙර සංවර්ධන සභා නාම යෝජනා සඳහා නම් ලැයිස්තු සකස් කර පක්ෂයේ ප්‍රධාන ලේකම්ගේ අත්සන ගැනීම සඳහා පක්ෂ මූලස්ථානයට එවන ලෙස දිස්ත්‍රික් සංවිධානවලට, ඒවායේ නායකයින්ටම නියම කළා. මේක බොහොම අසීරු ප්‍රශ්නයක් වුණා. පිරිසක් එම මැතිවරණයෙන් මග හරින්නටත් තවත් පිරිසක් එම මැතිවරණයට ඉදිරිපත් වන්නටත් උනන්දුවක් දැක්වූ නිසා මේ ප්‍රශ්නය ඇති වූ අවස්ථාවේදී අපේ පක්ෂ මූස්ථානයට නොයෙක් විධියේ ප්‍රශ්නවලට මුහුණ පාන්නට සිදුවුණා. මොකද? මේ ලැයිස්තු සකස් කිරීමේදී 1, 2, 3, 4, 5 යනාදී වශයෙන් අනු පිළිවෙලට අපේක්ෂකයින්ගේ ලැයිස්තු සකස් කරන විට පස් වැනියාට ඉන්න පුද්ගලයා, "නැහැ, මමයි දෙවැනියාට නම ඇතුළත් කිරීමට සුදුස්සා" කියා එහෙන් මෙහෙන් දුරකථන පණිවුඩ එවනවා. ඇයි ඒ පුද්ගලයා පස් වැනියාට දමා තිබෙන්නේ? එයා දෙවැනියාට දමන්න කියනවා. ඔය විධියේ ප්‍රශ්න ඇතිවුණා. ඒ ප්‍රශ්න ඇතිවූ විට එදා වැඩ බැලූ නායකතුමා හැටියට, සංවර්ධන සභා මැතිවරණය මෙහෙයවන්නට පත්වූ නායකයා හැටියට අපේ වර්තමාන නායකතුමාට නීති උපදෙස් ලැබුණා. ශ්‍රී ලකා නිදහස් පක්ෂයේ 1979 වර්ෂයේ ව්‍යවස්ථාව අනුව සභාපති ඉන්නවා නම් වැඩබලන සභාපති කෙනෙකු පත් කරන්නට බැහැ. වැඩ බලන සභාපති කෙනෙකු පත් කරන්නට පුළුවන්කම තිබෙන්නේ සභාපති රටින් බැහැරව සිටිනවා නම් පමණයි. සභාපති රටේ සිටියදී වැඩ බලන සභාපති කෙනෙක් පත් කරන්නට බැහැ. එසේ කළාම යම් ප්‍රශ්නයකදී යම් අපේක්ෂකයෙක් උසාවියට ගියොත්, අධිකරණය හමුවට ගියොත් "ඔබට බලයක් නැහැ, මේ නාම යෝජනා මණ්ඩලයේ සභාපති ධුරය දැරීමට" කියන තීන්දුව ලැබෙන බවට නීති උපදෙස් ලැබුණා. ඔය වගේ නීති උපදෙස් රාශියක් ලැබුණා. මෙන්න මේ හේතු නිසයි, එදා අපිට සංවර්ධන සභා මැතිවරණයට ඉදිරිපත් වෙන්නට බැරි වුණේ. එදා අන්තිම මොහොත වන විට—අප්‍රේල් මාසයේ 25 වැනිදා වන විට—තිබුණේ තව දවස් දෙකයි. වෙනත් දේශපාලන පක්ෂවලටත් ඒ සංවර්ධන සභා මැතිවරණයට අපේක්ෂකයන් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොදී අන්තිම මොහොතේ තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රකාශයක් කළේ, "අපි මේ මැතිවරණයට ඉදිරිපත් වෙන්නේ නැහැ" කියා කළ ප්‍රකාශයෙන් නම්, මේ මේ හේතුන් නිසා ඉදිරිපත් වෙන්නේ නැහැයි කිව්වා. නමුත් මම අද මේ ගරු සභාවේදී තමුන්නාන්සේට මේක කියන්නේ කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) මේ ගැන කිව්ව නිසයි. මෙන්න මේ කියන ලද හේතු නිසයි එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් සංවර්ධන සභා මැතිවරණයට ඉදිරිපත් වෙන්නට බැරි වුණේ. නායකත්වය අතහැර යන්න බැරි තරමට තිබුණු බල ලෝභය නිසා, නායකත්වය ආරක්ෂා කර ගන්නට නම් සංවර්ධන සභා මැතිවරණයෙන් වළකින්නට ඕනෑය කියන හැඟීම ඇති වී තිබුණා. වෙන මොන හේතු කිව්වත් මෙන්න මේ නිසයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එදා සංවර්ධන සභා මැතිවරණයට ඉදිරිපත් වෙන්නට බැරි වුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි දැන් සංවර්ධන සභා ගැන කථා කරමින් ඒකේ අඩුපාඩු කියනවා. ඒකේ අවශ්‍යතාවන් ගැන කථා කරනවා. අපි එදා තරඟ කරලා තිබුණා නම් අද රටේ තත්ත්වය වෙනස් වෙන්නට ඉඩ තිබුණා. අද දේශපාලන වාතාවරණය වෙනස් වෙන්නට ඉඩ තිබුණා. අද මේ ගරු සභාව ඉදිරියට ඇවිත් මේක නැවත පැරණි ක්‍රමයට ගෙනෙනවාය කියනවා නම් ඒක අපි පිළිගන්නවා. අපට බලය ලැබුණු විගස අපි නැවත වරක් තිබුණු පළාත් පාලන ක්‍රමය ක්‍රියාත්මක කරන බවට පොරොන්දු වෙනවා. නමුත් ඔය හේතුව නිසාම නොවෙයි අපි තරඟයෙන් වැළකුණේ. අපේ පක්ෂයේ නායකත්වයේ තිබුණු කැදරකම නිසා, නායකත්වය අත්හැර යන්නට බැරිකම නිසා මේ මැතිවරණය සඳහා අපට සල්ලි දෙන්න බැහැයි කිව්වා. පක්ෂ මූලස්ථානයෙන් අපට කිසිම ආධාරයක් දෙන්නට බැහැයි කිව්වා. අපව අධෛර්ය කළා. අපේ පාක්ෂිකයන් අතර ප්‍රශ්න ඇති කළා. මතභේද ඇති කළා. ගැටුම් ඇති කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ නිසයි අපට සංවර්ධන සභා මැතිවරණයෙන් වළකින්නට සිදු වුණේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපි බලයට ආව දවසක මේ සංවර්ධන සභා ක්‍රමය වෙනස් කරන එක වෙනම කාරණයක්. නමුත් දැන් පවතින ක්‍රමය යටතේ ඉදිරියට අපි මුහුණ දෙන්නට ඕනෑ. දැන් ජනාධිපතිවරණයක් ඇවිත් තිබෙනවා. අපි බින්දුවට බැස්සත්—අපේ විශ්වාසය අපි ජයග්‍රහණය කරනවාය කියන එකයි—ඒකට අපි තරඟ කරනවාය කියන එක මේ අවස්ථාවේදී තමුන්නාන්සේලාට මතක් කරන්නට ඕනෑ. අපි භය වෙන්නේ නැහැ. අපි මඟ හරින්නේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙනුයි අපි ඉදිරිපත් වෙන්නේ. අපි රෝදයෙන්, කකුලෙන් එහෙම නැත්නම් වෙන මොකක්වත් ඉදිරිපත් වෙන්නේ නැහැ. අපේ බලාපොරොත්තුව, අපේ උත්සාහය අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්, දිවංගත බණ්ඩාරනායක මැතිතුමා පිහිට වූ පක්ෂයේ අත සළකුණෙන් ඉදිරිපත් වෙන්නය කියන එක මම මේ ගරු සභාවේදී තමුන්නාන්සේ ඉදිරියේ ප්‍රකාශයට පත් කරන්නට ඕනෑ.

ගරු අගමැතිතුමනි, මේ සංවර්ධන සහා සංශෝධන පනත ගැන කථා කරන විට තමුන්නාන්සේ අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාට බාධා කරමින් "ඇයි, 2.5 million වලින් කරන්නට බැරි?" කියලා ඇසුවා. මේ ගත වූ අවුරුදු පහ තුළම මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටියා—ඡන්දයෙන් තේරී පත් වූ හාරිස්පත්තුවේ දෙවන මන්ත්‍රීවරයා වශයෙන් ඉල්ලා සිටියා—මගේ කොට්ඨාශයේ යම් යම් වැඩ කර දෙන්නය කියා. මට ඡන්දය දුන් ගම් කොට්ඨාශවලට ගත වූ අවුරුදු 5 තුළ කිසිම සංවර්ධන වැඩක් කෙරී නැහැ. ගත වූ අවුරුදු පහේම විමධ්‍යගත අයවැයෙන් මට ශතයක්වත් ලැබුණේ නැහැ. මට ලැබුණා නම් ලැබුණේ පළාත් පාලන අමාත්‍යාංශයෙන්—ගරු අගමැතිතුමාගෙන්—ලැබුණ මුදල පමණයි. ඒ දෙලක්ෂයෙන් තමයි මම වැඩ කර තිබෙන්නෙ. ඒ ගැන මම එතුමාට ස්තුති කරන විට මට කියනවා මම ප්‍රේමදාසගේ පන්දමෙක් කියා.

මොකා මොකී මොනවා කිව්වත්, මට කමක් නැහැ, මගේ වැඩ කොටස් ටික කර දෙනවා නම්. එහෙම වැඩ කරන පුද්ගලයාට මගේ ස්තුතිය පිරිනැමීමයි ජනතාව වෙනුවෙන් මගේ යුතුකම. මුළු රජයම මගේ ආසනයේ ජනතාවට උදව් කරනවා නම් මම ඒ සියලු දෙනාටම ස්තුති කරනවා. නමුත් අනික් ඇමතිවරු උදව් නොකරන නිසා ඒ උදව් කරන ඇමතිතුමාට ස්තුති කිරීමයි මගේ ජනතාව වෙනුවෙන් මට තිබෙන යුතුකම කියා මම විශ්වාස කරනවා. එම නිසා මම ඉතාමත් කාරුණිකව ඉල්ලා සිටිනවා, මේ අවුරුද්ද අවසාන වන්නට කලින් මහ මැතිවරණයක් ඇති නොවුණොත් ලබන අවුරුද්දේවත් විමධ්‍යගත අයවැයෙන් ලැබෙන මුදලින් හාරිස්පත්තුවේ දෙවන මන්ත්‍රීවරයා හැටියට මම ඉදිරිපත් කරන යෝජනා ක්‍රියාත්මක කිරීමට ඒ මුදල් වැය කරන ලෙස මහනුවර දිස්ත්‍රික් ඇමතිතුමාට නියම කරන්නය කියා.

ඒ ඉල්ලීම මම විශේෂයෙන් ගරු අගමැතිතුමාගෙන් ඉල්ලනවා. ඒ මොකද? බෙදී තිබෙන, වෙන් වී තිබෙන, කොන් වී තිබෙන ගම් තිබෙනවා. ගමට යන්න පාරක් නැහැ. ගමට විදුලිය ලබාගන්න බැහැ. ගමට වතුර ටික ලබාගන්න බැහැ. ඔය විධියේ සංවර්ධන කටයුතු රාශියක් අවශ්‍ය වී තිබෙන ගම් රාශියක් ඒ කොට්ඨාශයේ තිබෙනවා. ඒ ගම්වලට ගත වූ අවුරුදු 5 තුළම කිසිම වැඩක් කෙරී නැති බව මම කනගාටුවෙන් මතක් කරනවා. බස් ධාවනය කළ මාර්ග කීපයක්ම අබලන් වීම නිසා බස් ධාවනය සමහර ප්‍රදේශවල ඇණ හිට තිබෙනවා. ඒ මාර්ගවල බස් ධාවනය අත්හැර දමා තිබෙනවා.

පූජාපිටිය-වටගොඩ බස් ධාවනය පසුගිය මාස 4 තිස්සේම නැවතී තිබෙනවා. පාරේ බස් ධාවනයක් කරන්න බැරි තරමටම විශාල වළවල් හැදිලා. මම ඊයෙ පෙරේදා නංගල්ල ප්‍රදේශයට ගියා. එහෙත් එහෙම තමයි. එහේ ඉතින් දැන් අලුත් කාර්වලින් නිසා යන්න පුළුවන්. නමුත් අපේ ජනතාවට ඒ වාගේ සුඛෝපභෝගී කාර් නැහැ. දුනු කැඩෙනවාය කියා අපේ පාරවල බස් ධාවනය කරන්න බැහැ කියනවා.

අවසාන වශයෙන් ගරු කථානායකතුමනි, මෙම සංවර්ධන සභා කටයුතු අපේ කැමැත්තෙන් හෝ වේවා, අකමැත්තෙන් හෝ වේවා ක්‍රියාත්මක කරන්න වන නිසා අපිත් ඒ අනුව කටයුතු කිරීම අවශ්‍ය වී තිබෙනවා. මම විශේෂයෙන් ඉල්ලා සිටින්නේ හාරිස්පත්තුවේ දෙවන මන්ත්‍රීවරයා හැටියට විමධ්‍යගත අයවැයෙන් ඒ ඡන්ද කොට්ඨාශයට ලැබෙන මුදලින් මටත් මුදල් ප්‍රමාණයක්—මට මුදල් වුවමනා නැහැ—මම රෙකමදාරු කරන සංවර්ධන වැඩ ක්‍රියාත්මක කිරීම පිණිස වෙන් කර දෙන ලෙස ඉල්ලමින් මම නිහඬ වෙනවා.

අ. භා. 5.29

**සරත් මුත්තෙට්ටුවේගම මහතා (කලවාන)**
*(திரு. சரத் முத்தெட்டுவேகம—கலவான)*
**(Mr. Sarath Muttetuwegama—Kalawana)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත ගැන කථා කරන විට අපට අමතක කරන්න බැහැ, පසුගිය ඉරිදා පත්‍රවල තිබුණු ජනාධිපතිතුමා අනුරාධපුරයේදී කළ කථාව. නැපෝලියන් වාගේ ලංකාවේ දේශපාලන සිතියම තව අවුරුදු 10 ක් අකුලල දාන්නය කියා ජනාධිපතිතුමා කියා තිබෙනවා. එහෙම කථා කරන නැපෝලියන්ලාට කොහේදි වෝටර්ලූ එකක් හමුවෙයිද කියන එක තමයි, දැන් අපි බලාගෙන සිටින ප්‍රශ්නය වෙලා තියෙන්නෙ.

කෙසේ වෙතත් මේ ග්‍රාමෝදය මණ්ඩල ගැනත් දිස්ත්‍රික් සංවර්ධන සභා ගැනත්—ඒ මොකද දෙකම සම්බන්ධයි—මට ඒ පනත ගෙනා වෙලාවෙදි කථා කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. මම මේ සභාවෙ සිටියෙ නැහැ. නමුත් දිස්ත්‍රික් සංවර්ධන සභා මැතිවරණ පනත සාකච්ඡා කළ වේලාවේදී මගේත් අපේ පක්ෂයේත් අදහස් කෙටියෙන් ප්‍රකාශ කරන්න යෙදුණා. දැන් අවුරුදු එක හමාරක පමණ, නැත්නම් අවුරුද්දකට වැඩි කාලයක අත් දැකීමක් මේ ආයතන ගැන තිබෙනවා. එමනිසා පක්ෂපාතීව නොවෙයි අපක්ෂපාතීව කථා කරන විට මා සිතන හැටියට ගරු අගමැතිතුමාත් පිළිගන්නවා ඇති මේ මුළු මහත් ක්ෂේත්‍රයෙහිම විශාල අඩුපාඩුකම් තිබෙනවාය යන්න. ඒ අඩුපාඩුකම් පැනනගින්නට හේතූන් කීපයක් තිබෙනවා.

මගේ අදහසේ හැටියට සංවර්ධන සභාවල යම් අර්ථයක් තිබෙනවා. දිස්ත්‍රික් සංවර්ධන සභාව තේරුම් ගන්නට පුළුවන් ආයතනයක්. ඒකෙන් වැඩ කොටසක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත් මුත්තෙට්ටුවේගම මහතා]

කරවා ගන්නට පුළුවන්කම ඇති, සමහර විට. නමුත් මා සිතන හැටියට මේ ක්‍රමයට වඩා—මේ මැතිවරණ භූමියට සහ ග්‍රාමෝදය මණ්ඩල පත් කරන ක්‍රමයට වඩා—පරණ ගම් කාර්ය සභා මට්ටමින්ම හෝ වෙනත් ඒ විධියේ මට්ටමකින් ගම්වලින් ඡන්දයෙන් තෝරා ගන්නා නියෝජිතයන්ගෙන් යුත් දිස්ත්‍රික්කයේම ගම් සභිකයන්ගේ සමුළුවකින් තෝරා ගන්නා සංවර්ධන සභාවක් තිබෙනවා නම් මීට වඩා ප්‍රයෝජනවත්. මොකද, වගකීමක් නැතිව බලය උසුලන එක ඉතාම භයානක වැඩක්. ග්‍රාමෝදය මණ්ඩල ගැන දැන් මා කියන දෙය කොයි තරම් දුරට අවංකව පිළිගනීවි දැයි මා දන්නේ නැහැ. රජයේ මන්ත්‍රීවරු වුණත් පපුවට තට්ටු කරල ඇත්ත පිළිගත්තොත් පිළිගනීවි ග්‍රාමෝදය මණ්ඩල තෝරීමේදී විශාල අක්‍රමිකතාවයන් සිදු වී තිබෙන බව. හතු පිපේනා වාගේ සමහර සමිති මතුවුණා. ඇත්ත වශයෙන්ම තිබුණු ජනතා සංවිධාන පිළිගත්තේ නැහැ. එම නිසා ග්‍රාමෝදය මණ්ඩල පිළිබඳව සැකැසුම. ඒ තරම් පිළිගතහැකි තත්ත්වයක් නොවෙයි. මේ ගැන අපට ලොකු සැක ඇතිවී තිබෙනවා.

අද නොයෙකුත් අංශවල ඇති වී තිබෙන වර්ධනයන් ගැන බලන විට ග්‍රාමෝදය මණ්ඩල උඩින් ගෙනැවිත් ගමට පැටෙව්වාට ප්‍රදේශයේ ජනතාවගේ විශ්වාසය ඔවුන්ට ලැබෙන්නේ නැහැ. මම එය දැක්කා. මගේම ඡන්ද කොට්ඨාශයේත් මා ආශ්‍රය කරන තවත් ඡන්ද කොට්ඨාශවලත් ග්‍රාමෝදය මණ්ඩල ගැන මට කියන්නට පුළුවනි. ගරු අගමැතිතුමා මේ ගැන ඇත්ත වශයෙන්ම අධ්‍යයනයක් කරන්නට සූදානම් නම් ග්‍රාමෝදය මණ්ඩලවල රැස්වීම් වාර්තා සහ පැමිණීමේ ලේඛන ගෙන්වා බලන්න. පළමුවන තුන් මාසය තුළ හොඳට පැමිණුනා. ග්‍රාමෝදය මණ්ඩල සාමාජිකයන් පළමුවන තුන් මාසය තුළ හොඳට ඒ රැස්වීම්වලට පැමිණුනා. ඊට පසු එන්න එන්නම පැමිණීම අඩු වුණා. සමහර තැන්වල පැමිණුනේම නැහැ. මම දන්නවා එක ග්‍රාමෝදය මණ්ඩලයක් ගැන. ඒකෙ සභාපති හැටියට ස්වාමීන් වහන්සේ නමක් තෝරා ගත්තා. ඒ ස්වාමීන් වහන්සේ ග්‍රාමෝදය මණ්ඩලයේ සාමාජිකයනුත් එකතු කරගෙන ගම පුරාම ගිහින් ගමේ තිබෙන සියලුම අඩුපාඩුකම් ගැන සටහන් කර ගත්තා. "අපි මේ මේ යෝජනා ඉදිරිපත් කරනවා, මේවා කෙරෙයි" යනුවෙන් ගමේ ප්‍රචාරයක් කළා. නමුත් ඒ එකක්වත් කෙරුනෙ නැහැ. අන්තිමේදී ඒ හාමුදුරුවෝ පන්සලත් අත්හැර ගිහින් තිබෙනවා. [බාධා කිරීමක්] ඕනෑ නම් මට ඒ හාමුදුරුවෝ ගැන විස්තර කියන්නට පුළුවනි. නමුත් ඒ හාමුදුරුවෝ ගැන මට මෙතැන විග්‍රහයක් කරන්නට වෙලාවක් නැහැ. ඒ හාමුදුරුවන්ගෙ ඉතිහාසය ගැන මෙතැන කිව්වොත් ඒ හාමුදුරුවන්ට කොහොම කතා කරන්නද කියලත් ප්‍රශ්නයක් මතු වෙනව. නොයේක් මට්ටමේ හාමුදුරුවරු ඉන්නව. අපි ගරු කරන හාමුදුරුවරුත් ඉන්නව. අපි ගරු නොකරන හාමුදුරුවරුත් ඉන්නව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැන් කථා කරන්නේ ග්‍රාමෝදය මණ්ඩල ගැන. මා කියන්නේ මේ ග්‍රාමෝදය මණ්ඩල උඩින් ගෙනැවිත් ගමට පටවා තිබෙන බවයි. ඇත්ත වමයෙන්ම ඒ මණ්ඩලවලට වැඩක් කරන්නට පුළුවන්කමකුත් නැහැ. යෝජනා සම්මත කරනවා. ග්‍රාමෝදය මණ්ඩල වාර්තා පුරවනවා. නමුත් කිසිම දෙයක් වෙලා නැහැ. ඒකයි ඇත්ත තත්ත්වය. මගේ ඡන්ද කොට්ඨාශයේ තිබෙනවා ග්‍රාමෝදය මණ්ඩල බර ගණනක්. ඒවායින් කිසිම වැඩක් කෙරෙන්නේ නැහැ. ඊයේ පෙරේද ඇති වූ ජල ගැල්මෙන් අපේ කොට්ඨාශවලට හානි ඇතිවුණා. පොඩි පාලම් කැඩී ගියා. නොයෙකුත් හානි සිද්ධ වුණා. ගරු අගමැතිතුමාගේම මණ්ත්‍රාංශය යටතේ පවතින ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට මුදල් දී තිබෙනවා ජල ගැල්මෙන් ඇති වන අඩුපාඩුකම් හදන්න. සමහර ඒවා හදනවා. නමුත් මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. සමහර පාලම් සංවර්ධන සභාවට අයිතියි. සමහර පාලම් මහාමාර්ග දෙපාර්තමේන්තුවට අයිතියි. මහාමාර්ග දෙපාර්තමේන්තුවට සල්ලි දුන්නාම ඒ අය හදන්නේ මහාමාර්ග දෙපාර්තමේන්තුවට අයිති පාලම් පමණයි. කැඩී ගොස් තිබෙන පොඩි අඩි පාලම් ගැන කවුවුරුවත් වග කියන්නේ නැහැ. ග්‍රාමෝදය මණ්ඩලය වාර්තා ලියනවා. රෙජිස්ටර් ලියුම් යවනවා. නමුත් කිසි කෙනෙක් ඒවා තුට්ටු දෙකකටවත් ගණන් ගන්නෙ නැහැ. එමනිසා මේක දැන් ඇනහිටපු ව්‍යාපාරයක් බවට පත් වී තිබෙනවා.

අපේ ලංකාවේ ඡන්ද කොට්ඨාශ සීතියමත් අවුරුදු දහයකට අකුලන කොට මේ ග්‍රාමෝදය මණ්ඩලත් ඒ ඇකිලිල්ලට අසු වෙන්න පුළුවනි. ග්‍රාමෝදය මණ්ඩලත් ඇකිලිලා මොකුත් නැති තැනකට පත් වෙන්න පුළුවනි. මේ ගැන දැන් අත්දැකීම් තිබෙනවා. අගමැතිතුමාටත් අත්දැකීම් තිබෙනවා. අගමැතිතුමා අවංකව පිළිගන්නවා ඇති මේ වැඩේ ඒ තරම් සාර්ථක වී නැහැයි කියා. මෙහි තිබෙන අඩුපාඩුකම් දැකීම් තිබෙනවා. අගමැතිතුමාටත් අත්දැකීම් තිබෙනවා. අගමැතිතුමා අවංකව පිළිගන්නවා ඇති මේ වැඩේ ඒ තරම් සාර්ථක වී නැහැයි කියා. මෙහි තිබෙන අඩුපාඩුකම් ගැන ටිකක් බලන්න. සංවර්ධන සභාවලට මන්ත්‍රීවරුන් නිල බලයෙන් පත්වී ඉන්නවා. මන්ත්‍රීවරයෙන් වුණ නිසාම ඔහුට සංවර්ධන සභාවේ සාමාජිකත්වය නිල බලයෙන් ලැබෙනවා. දැන් සමහර මන්ත්‍රීවරුන් මේවාට යන්නේ නැහැ. සමහර අය සංවර්ධන සභාවලට යන්නේ නැහැ කියමු. යන්නේ නැති අය ඉන්නවා. [බාධා කිරීම්] ඔව්, ඔව්, විරුද්ධ පක්ෂයේ අය යන්නේ නැහැ. එසේ මාස තුනක් නොගොහින් හිටියාම සාමාජිකත්වය අහිමි වෙනවා. අද ඒ නිසා පුදුම තත්ත්වයක් ඇතිවී තිබෙනවා. මැතිවරණ කොමසාරිස්වරයාද, පළාත් පාලන කොමසාරිස්වරයාද මම දන්නේ නැහැ, පක්ෂයට ලියුම් යවා තිබෙනවා, වෙන කෙනෙක් ඒ වෙනුවට නම් කරන්නය කියා. නමුත් ඒක කරන්න බැහැ. ඒ නිසා පුරප්පාඩුව එහෙමම තිබෙනවා. ඒ නිසා මෙන්න මේ වගේ තැන් සංශෝධනය කරන්න ඕනෑ. සංශෝධනය කළේ නැත් නම් ඒ පුරප්පාඩු පුරවන්න බැහැ. ඒ තනතුර පිරවීම ගැන පමණක් නොව, මේ මූළු සංකල්පය ගැනම නැවත කල්පනා කරන්න ඕනෑ? කල්පනා කර යම් වැඩපිළිවෙලක් යෙදුවේ නැත්නම් මෙය ලොකු ප්‍රශ්නයක් බවට පත්වෙනවා.

මම කියන්නේ නැහැ ගම්කාර්‍ය සභාවිල වැඩ කටයුතු සියයට සියයකින්ම හොඳට කරගෙන ගියය කියා. ගම්කාර්‍ය සභාවලත් යම් යම් අඩුපාඩුකම් තිබුණා. ගම්සභා ප්‍රදේශ සමහර විට හරියාකාරව බෙදා තිබුණේ නැහැ. නමුත් ඒ කොහොම වුණත් ගමේ ගම් සභිකයෙක් සිටියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඡන්ද දායකයින්ට අල්ලා ගන්න පුළුවන් මිනිසෙක් හිටියා. ඡන්දය දුන්න කෙනෙක් සිටියා. ගමේ මිනිසුන්ට වගකිවයුතු කෙනෙක් හිටියා. නමුත් දැන් තිබෙන ග්‍රාමෝදය මණ්ඩල කොහේ තිබෙනවාද කියා කවුරුත් දන්නේ නැහැ. කොහේ රැස්වනවාද කියා දන්නේ නැහැ. රැස් වන අය කොහේ ඉන්නවාද දන්නේ නැහැ. අපේ දිවුලපිටිය මන්ත්‍රීතුමා කිව්වා 'බැජ්' එකක් දෙන්න ඕනෑ කියා. 'බැජ්' එකක් නොවෙයි 'මෙම්බර්, කව්ද කියා සොයා ගන්නට නම් බෙල්ල වටේ ලොකු බෝඩ් එකක් එල්ලන්න වෙයි. නැත්නම් කාටවත් දැනගන්න බැහැ, 'මෙම්බර්' කවුද කියල. හිටපු ගමන් වෙනස් වෙනවා.

**ආරියරත්න ජයතිලක මහතා** (දිවුලපිටිය)
*(திரு. ஆரியரத்ன ஜயதிலக்க—திவுலப்பிட்டிய)*
(Mr. Ariyaratne Jayatillake—Divulapitiya)

මම එහෙම දෙයක් කිව්වෙ නැහැ.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

සමාවෙන්න. මම එය ඉල්ලා අස් කරගන්නවා.

**අනුර බණ්ඩාරනායක මහතා** (නුවරඑළිය-මස්කෙළිය දෙවන)
*(திரு. அனுர பண்டாரநாயக்க—நுவரெலியா-மஸ்கெலிய இரண்டாம் அங்கத்தவர்)*
(Mr. Anura Bandaranaike—Second Nuwara Eliya-Maskeliya)

දිවුලපිටියේ අනාගත මන්ත්‍රීතුමා.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

මම එය ඉල්ලා අස් කරගන්නවා. අත්තනගල්ලේ මන්ත්‍රීතුමයි (ලක්ෂ්මන් ජයකොඩි මහතා) එම යෝජනාව කළේ. දිවුලපිටියේ හිටපු මන්ත්‍රීතුමා කියල කිව්වොත් මම හිතන්නෙ තරහ වෙන එකක් නැහැ.

මේ පනත ගැන කියන්න තිබෙන්නේ අන්න ඒ කාරණයයි. මේ සල්ලි එහා මෙහා කිරීමේ බලතල ලබා දීම ගැන නම් අපට විරුද්ධ වෙන්න බැහැ. මොකද? එහෙම නැත්නම් මේවා කොහොමවත් ක්‍රියාත්මක කරන්න බැහැ. කෙසේ වෙතත් මේ මුළු සංකල්පය ගැනම නැවත කල්පනා කර බලා, අවංකව කවුරුත් එකතු වී කාටත් එකඟ වෙන්න පුළුවන් වැඩපිළිවෙලක් යොදා ගත යුතුයි. ගරු අගමැතිතුමා, මේ රටේ පළාත් පාලන සේවය ගැන හොඳ පළපුරුද්දක් තිබෙන කෙනෙක්. ඒ නිසා මේ ගැන මීට වඩා ගැඹුරට කල්පනා කර බලා, මේ වැඩේ කරන්න පුළුවන් විධියට, කාටත් එකඟ වෙන්න පුළුවන් විධියට සංශෝධනය කර ක්‍රියාත්මක කළොත් ඉතාමත් හොඳයි.

අ. භා. 5.38

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා (කොළඹ දිසා ඇමතිතුමා)**
*(திரு. வீரசிங்ஹ மல்லிமாராச்சி—கொழும்பு மாவட்ட அமைச்சர்)*
(Mr. Weerasinghe Mallimarachchi—District Minister, Colombo)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලවාන ගරු මන්ත්‍රීතුමත් [සරත් මුත්තෙට්ටුවෙගම මහතා] අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් [ලක්ෂ්මන් ජයකොඩි මහතා] කතා කළේ හරියටම පාර්ලිමේන්තුවේ නවක මන්ත්‍රීවරුන් හැටියටයි. නමුත් මේ මන්ත්‍රීවරුන් දෙපොළම හොඳ පළපුරුදු මන්ත්‍රීවරුන් දෙපොළක් බව අපි දන්නවා.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා වගකීමක් ඇති නියෝජ්‍ය ඇමතිවරයෙකු හැටියටත් කටයුතු කළා. එතුමා යෝජනා කළා, ග්‍රාමෝදය මණ්ඩලවල සභිකයින්ට හඳුනා ගැනීම සඳහා යම්කිසි පළඳනාවක් දෙන්න ඕනෑ කියා. එතුමාගේ පක්ෂයේ ඉන්න අය මොන මොන පිළට අයිතිද කියා සොයා ගන්න බැරි තත්ත්වයක් අද තිබෙනවා. අන්න ඒ තත්ත්වයෙන් කල්පනා කර අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා මේ රටේ මිනිසුන් අද කරදරයකට පත්වෙලා ඉන්නවාය කියා හිතනවා ඇති. අපට හිතන්න බැහැ, ඒ මන්ත්‍රීතුමා වාඩි වී ඉන්න පේලියේ සිටින මන්ත්‍රීවරුන් කී දෙනෙක් කොයි පක්ෂයට අයිතිද කියල. එක් කෙනෙක් හෙක්ටර්ට. එක් කෙනෙක් ප්‍රොක්ටර්ට. එක්කෙනෙක් ඇක්ටර්ට. එක් කෙනෙක් මෛත්‍රීපාලට. එකෙක්නෙක් ඩොක්ටර්ට. අන්න ඒ තත්ත්වයෙන් හිතාගෙන මේ විධියට කතා කරනවාද කියා මම අහන්න කැමතියි. මොකක්ද මේකෙ තේරුම?

අනික් කාරණය, එතුමා කියනවා, මේ අය ගම් සභිකයින් වගේ නොවේය, කරදරයකට පත්වෙන්න පුළුවන්ය, ඒ නිසා ඔවුන්ට පළඳනාවක් දෙන්නය කියා. මම එතුමන්ලගෙන් ඉල්ලා සිනටිවා, ග්‍රාමෝදය මණ්ඩල පනත නැවත වරක් කියවා බලන්නය කියා. ඒ පනතේ මොකක්ද සඳහන් වී තිබෙන්නෙ? කණ්ඩායම් 36 ක් ඉන්නවා. ගමක ඉන්නවා එක් එක් වර්ගයේ සමිති සමාගම්වල සභාපතිවරු. ඒ සභාපතිවරු ගමේ පදිංචි වී සිටින උදවිය. ගමේ පන්සලේ දායක සභාවෙ සභාපති එක් සාමාජිකයෙක්. ග්‍රාමෝදය මණ්ඩලයේ අනික් සාමාජිකයා වන්නේ, ගමේ ග්‍රාමාරක්ෂක සභාවේ සභාපතිවරයා. ඒ ගරු මන්ත්‍රීතුමාගේ තර්කය වුණේ, මේ සභිකයන් ගොස් මුදල් එකතු කරනවාය යන කාරණයයි. ඒ අය වෙනත් තැන්වලට යනවාලු. කවදාවත් එහෙම දෙයක් වුණා කියා මම නම් හිතන්නේ නැහැ. එතුමා ඒ කාරණය ඉදිරිපත් කළේ තර්කයක් වශයෙන් නොවෙයි. මොකක් හෝ කියා අපගේ පනතට විරුද්ධතාව ප්‍රකාශ කරන්නට ඕනෑ නිසා, ඒකට වචන ටිකක් ගොතු කර ගත්තා. එයින් මතු පිටට එන්නට බැලුවා.

ඊළඟට කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) කතා කළා. ලංකා කොමියුනිස්ට් පක්ෂය අද එක් අපේක්ෂකයෙක් හොයන්න යන පක්ෂයක්. මොකද, ඒ අය දැන් එක් අපේක්ෂකයෙක් හොයන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසිංහ මල්ලිමාරච්චි මහතා]

යන්නේ? ඒ පක්ෂයත් දූත් පාර්ලිමේන්තුවේ එකට බැස තිබෙන නිසා. ඒ පක්ෂය අවුරුදු හතළිහක් තිස්සේ කරලා, කරලා, මහජනයාට, කම්කරු ව්‍යාපාරයට, ඔක්කෝටම කරලා, අද මෙහි ඉතිරි වී සිටින්නේ එක්කෙනයි. ඒ නිසා මේක කරන්න යනවා. මේක කවදාවත් කරන්න පුළුවන් වැඩක්ද?

විරුද්ධ පක්ෂය ගැන නොහිතා, අවුරුදු දහයකට මේ රටේ ඡන්ද කොට්ඨාශ සිතියම අතුලනවාය කියා අපේ ගරු ජනාධිපතිතුමා අනුරාධපුරයේදී කී බව කලවානේ ගරු මන්ත්‍රීතුමා කිව්වා. අපිත් ඒකම කියනවා. මහජනයාගේ ඡන්ද බලයෙන් විරුද්ධ පක්ෂය අවුරුදු දහයකට නැති කරන බවයි, එතුමා කිව්වේ. මහජනයාගේ කැමැත්තෙන් මිස කඩුවෙන් නොවෙයි, බයිනෙත්තුවෙන්, නොවෙයි, බෝම්බයෙන් නොවෙයි, කිරිච්චියෙන් නොවෙයි. මහජන ඡන්ද බලයෙන් විරුද්ධ පක්ෂය නැති කරන බවයි, එතුමා කිව්වේ. ඒකේ ඇති වරද මොකක්ද කියා මම අහන්න කැමතියි.

අද සිදු වී තිබෙන්නේත් ඒකමනේ. අපි ලංකා සම සමාජ පක්ෂය නැති කර තිබෙනවා. නැතිකර තිබෙන්නේ කොහොමද? මහජනයාගේ ඡන්ද බලයෙන්. අපි කොමියුනිස්ට් පක්ෂය විරුද්ධ පක්ෂයක් වශයෙන් නැත්තටම නැති කළේ මහජනයාගේ ඡන්ද බලයෙන්. මහජන එක්සත් පෙරමුණ නැත්තටම නැති කළේ කොහොමද? මහජනයාගේ ඡන්ද බලයෙන්. එහෙම නම් අපි විරුද්ධ පක්ෂයේ ඉතුරු ටිකත් දහ අවුරුද්දකට නැති කරනවා එන පාර මැතිවරණයේදී කියල මම කියන්න කැමතියි. ඒක කියන්න අපට උරුමයක් තියෙනවා. අපි ඒක කරන්නේ ඡන්ද දායකයන්ගේ කැමැත්තෙන් මිස ඒකාධිපති බලයෙන් නොවෙයි. ඒකාධිපති බලය පාවිච්චි කරන බවක් අපි කවදාවත් කිව්වේ නැහැ; කියන්නේත් නැහැ. තුවක්කුවෙන්, බයිනෙත්තුවෙන් අපි කවදාවත් ඒවා කරන්නේ නැහැ.

ගම්සභිකයකුට තිබුණු බලතල ග්‍රාමෝදය මණ්ඩලයේ සභාපතිවරයාට නැතැයි කලවානේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. එතුමා කවදාවත් නගර සභාවකවත් සුළු නගර සභාවකවත් ඉඳලා නැහැ. මම කොළඹ මහා නගර සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් අවුරුදු 17 ක් සිටියා. දූෂණ කෙරුණ තරමක් කෙරුණේ, ගම්වල කෝලාහල ඇති වුණු තරමක් ඇති වුණේ, මේ ගම්සභා නගර සභා හා වෙනත් පළාත් ආණ්ඩු සභාවල කටයුතු නිසයි. මොකක් හෝ පක්ෂයකින් එක් කණ්ඩායමක් තේරෙනවා. ඒ කාලයේදී මුළු රටේම කෝලාහල. ඒ පළාතේ ගැමියන් අතර තිබුණු අන්‍යොන්‍ය විශ්වාසය නැති වී යනවා. පන්සල්වල කලබල; ග්‍රාම සංවර්ධන සභාවල කලබල. වතු හිමියන්. ගෙවල් හිමියන් අතර අඬදබර. මේ විධියට කරලා, බොහෝම අමාරුවෙන් දහස් ගණන් මුදල් විය දම් කරලා, ගම්සභාවට එක්කෙනෙක් රිංගා ගන්නවා. දිනූ කණ්ඩායම වැඩ කරනවා. පැරදුණු කණ්ඩායම විවේචනය කර කර බලා ඉන්නවා. මේ තත්ත්වය ආයෙමත් ගේන්නද කියන්නේ?

මේ ක්‍රමය අවුරුදු 100 ක් තිස්සේ තිබුණා කියා, ඒකේ පරිවර්තනයක් නොකර ඒක දිගටම ගෙනයන්නද කියන්නේ? කලවානේ ගරු මන්ත්‍රීතුමාගේ අදහස මේකයි. එතුමාට ඕනෑ කරන්නේ, මේ රටේ අවුල් වියවුල් ඇති කිරීමයි. කලබලකාරී තත්ත්වයක් ඇති කිරීමයි. ඒ අනුව තමන්ගේ බලය පාවිච්චි කර, මේ රටේ පාලන බලය අල්ලාගෙන, ඊට පසු මැතිවරණය නැති කිරීමයි, එතුමාගේ අදහස. එතුමන්ලා මේ කරුණු කියන්නේ ඒ අදහස අනුවයි.

ගම්සභාවට තිබුණු අමුතු බලතල මොනවාදැයි මා එතුමාගෙන් අහන්නට කැමතියි. කෝලාහල කරගෙන ගම්සභාවකට නියෝජිතයන් පත් කර, එයින් කෙනෙක් සභාපති වශයෙන් බලයට පත් කරගෙන, බලය ලැබුණු පක්ෂයට පමණක් වැඩ කර අනෙක් අයට වැඩ නොකර සිටිනවාට වඩා, මුළු ගමේම තිබෙන දායක සභා, ග්‍රාමෝදය මණ්ඩල, ග්‍රාමාරක්ෂක සභා, අන්‍යොන්‍යාධාර සමිති, මල්දෙන සමිති, සමුපකාර සමිති යන මේ හැම එකේම සභාපතිවරුන් එකතු වී කිසිම කලබලයක් නැතිව ඒකරාශී වී වැඩ කරතොත් ඒක හොඳ නැද්ද? ඔකට අමුතු ලේබල් ඕනෑද කියා මම අහන්න කැමතියි.

අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කල්පනා කරන්නේත් බලය මහජනයා අතර විමධ්‍යගත කිරීම ගැන නොවෙයි. හාරිස්පත්තුවේ ගරු මන්ත්‍රීතුමා පැය භාගයක් පමණ වේලා කතා කළා. එතුමා මොනවාද කිව්වේ? 'අර සභාව තියෙනවා, සමස්ත ලංකා සභාව තියෙනවා, පොලිට් බියුරෝ එක තියෙනවා' කිව්වා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැමදාම මේවාට කොටුවෙලා ඉඳගෙන මෙතෙක් කල් කළ විවේචනයට පිළිතුරු දෙන්නට පුළුවනි.

තමුන්නාන්සේලාගේ ඔය පොදු අපේක්ෂකයා කියන එක්කෙනා තෝරාගෙන තිබෙන්නේ කොහොමද කියා මම කියන්න කැමතියි. දැනට දෙන්නෙක් තෝරගෙන තිබෙනවා. අහිංසක අනුර බණ්ඩාරනායක මහතාගේ බෙල්ල කපා, බණ්ඩාරනායක මහතාගේ නමින් පාර්ලිමේන්තුවට ආ අය එකතු වී අපේක්ෂකයා පත් කරගෙන තිබෙන්නේ කොහොමද? මම උදාහරණයක් කියන්නම්, එක්සත් ජාතික පක්ෂය ජනාධිපති ධුරය සඳහා අපේක්ෂකයා තෝරා ගත් හැටිත්, හෙක්ටර් කොබ්බෑකඩුව මහතා තෝරා ගත් හැටිත් ගැන. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ රටේ ඡන්ද ලක්ෂ 20 ක් ලබා ගත් පක්ෂයක්, පසුගිය මහා මැතිවරණයේදී. නමුත් හෙක්ටර් කොබ්බෑකඩුව මහතා ජනාධිපති ධුරය සඳහා අපේක්ෂකයකු වශයෙන් තෝරා ගත්තේ 17 දෙනෙකු පමණක් එකතු වෙලා.

එක්සත් ජාතික පක්ෂයේ ජේ. ආර්. ජයවර්ධන මහතා කව්ද පත් කළේ? 1,500 ක් රාමක්‍රිෂ්ණා හෝල් එකට එකතුවෙලා තෝරා ගත්තෙ. මේ රටේ හැම ශාඛා සංවිධානයකම හැම ශාඛා සමිතියකම නියෝජිතයො ඇවිල්ල ඒ සැම දෙනාම තමයි තෝරාගත්තෙ. එහෙම නැතිව අපේ තිබෙන කැබිනට් මණ්ඩලයට තිබුණා තෝරා ගන්න. අපේ සිටින දිස්ත්‍රික් ඇමතිවරුන්ට තිබුණා තෝරා ගන්න. අපේ නියෝජ්‍ය ඇමතිවරුන්ට තිබුණා තෝරාගන්න. අපේ තිබෙන විධායක සභාවට තිබුණා තෝරාගන්න. අපේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ 55 දෙනාට තිබුණා තෝරා ගන්න. නමුත් අපි එහෙම කළේ නැහැ, එහෙම කරන්නෙ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන අපි, හැම වෙලාවෙම ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කරන්න සූදානම්. නමුත් ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන මේ අය මොකක්ද කරන්නේ ? ඒක ධිපතිවාදයට යන්න යනවා. මම අහන්න කැමතියි, පොලිට්බියුරෝ එකේ කී දෙනෙක් ඉන්නවාද ? හත් දෙනයි. හත් දෙනා පත් වුණා, හත් දෙනාම අත ඉස්සුවා, පහුවෙනිදා උදේ පාන්දරම මෙන්න, උසාවිය ළඟ කොළ ගහලා.

කොළයක් ගහලා තිබෙනවා, මොකක්ද කොළේ ? 'අපේ අනාගත ජනාධිපති හෙක්ටර් කොබ්බෑකඩුව'. මොකද මේ අර තරුණයා නැගලා එයි කියලා. පක්ෂයෙන් අම්මත් අගමැති, තාත්තාත් අගමැති ඉතින් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරයි කියලා—

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

කොටවන්න.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)*
**(Mr. Weerasinghe Mallimaratchchi)**

කොටවන්න නොවෙයි, මම කියන්නෙ ඇත්ත. කොටවපු මිනිහා කව්ද කියලා මම කියන්නම් තමුන්නාන්සේලාට දැනගන්න. මම කථා කරන්නෙ අවංකවයි. පූළුවන් නම් ගරු නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) නැගිටලා කියන්න, ඉලංගරත්න නැගිටලා ගියෙ නැද්ද කොබ්බෑකඩුවගෙ නම යෝජනා කරන කොට ? පුළුවන් නම් නැගිටලා කියන්න, නැහැ කියලා. කියන්න බැහැ. තව එකක් අහන්නම් මම, ඊළඟට ඉලංගරත්න කළේ මොකක්ද ? ඉලංගරත්න විගහට දඩිබිඩි ගාලා කොබ්බෑකඩුවගෙ නම ඉදිරිපත් කළා. මොකද අනුර බණ්ඩාරනායකව මේ පැත්තට ඉදිරිපත් කරයි, එවිට දෙන්නාට මැදින් මම එන්නම් කියලයි ඒ. පුළුවන් නම් නැහැ කියා කියන්න නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමා. අපි දන්නෙ නැද්ද මේවා ? අදි සාමාන්‍ය පොඩි පවුල්වලින් ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවට ආවාට මේ රටේ වෙන දේවල් අපිත් දන්නවා. පක්ෂ ඇතුලේ වෙන දේවල් අපිත් දන්නවා. ලොකු තැන්වලට වැඩියෙන් දන්නවා, අපි, කෙරෙන තැන් මොනවාද කියලා. මෙයාගේ බෙල්ල කපන්නයි මෙහෙම කරන්නෙ. මොකද අගමැතිවරු දෙදෙනෙක්ගෙ පුතෙක් නිසා, නායකයා වෙයි, අනාගතයේ දී අපි, හොරු රංචුවට තැනක් නැති වෙයි, කියලා දඩිබිඩියේ දාගත්තා කොබ්බෑකඩුව. මේකට වැඩියෙන් සුදුසු කොබ්බෑකඩුවද නැත්නම් අනුරද ? කොබ්බෑකඩුව කියන්නේ කවුද ? 1956 මැතිවරණයේදී ඊ. ඒ. නුගවෙල මහත්මයාගේ පෝලින් ඒජන්ට් වශයෙන් එක්සත් ජාතික පක්ෂයේ සිටි පුද්ගලයයි. එයාද වැඩිය සුදුසු මේකට, නැත්නම් අනුර බණ්ඩාරනායකද ? මොකක්ද සුදුසුකම ? එයා ප්‍රොක්ටර්, අරයා ඇක්ටර්.

**රනිල් වික්‍රමසිංහ මහතා**
*(திரு. றனில் விக்கிரமசிங்ஹ)*
**(Mr. Ranil Wickremasinghe)**

ඒක ඇත්ත නේද ?

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)*
**(Mr. Weerasinghe Mallimaratchchi)**

නැහැ කියන්න, පුළුවන් නම්. කථානායකතුමනි, මේවා සම්පූර්ණ ඇත්ත. මෙන්න මේ ප්‍රතිපත්ති තියාගෙන තමයි අපේ ග්‍රාමෝදය මණ්ඩලයට ගහන්න එන්නෙ. එපමණක් නොවෙයි, අද බලයට පත් වෙලා ඉන්නෙ කව්ද ? මේ පක්ෂයේ බණ්ඩාරනායක ප්‍රතිපත්ති (බාධා කිරීමක්) විරුද්ධ පාර්ශ්වය කොහොම කල්පනා කළත්, ආණ්ඩු පාර්ශ්වය කොහොම කල්පනා කළත්, මගේ විශ්වාසයක් තිබෙනවා නුවරඑළිය මස්කෙළිය දෙවන ගරු මන්ත්‍රීතුමා ප්‍රජාතන්ත්‍රවාදය ගරු කළ එතුමගේ පියා අනුගමනය කරයි කියා. අපට හිතන්න පුළුවන්, අපට විශ්වාස කරන්න පුළුවන් ඒ ගැන. සියයට සියයක් ම විශ්වාස තබන්න පුළුවන්. නමුත් කොබ්බෑකඩුව කියන පුද්ගලයා, සියයට සියයක් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂාකරයි කියා, කොහෙන්වත් දන්කුඩ වාදය අරක්ෂා කරයි කියා, අපට විශ්වාසයක් නැහැ. ඒ විතරක් නොවෙයි කොහෙන්වත් දන්කුඩ හූරන්න ආ විජේ කුමාරණතුංග අද කොපමණ බලවත්ද කිව්වොත් පක්ෂයේ—අද ගෙදර කෑමට—වලව්වේ හාල් ටික දෙන්නෙ එයයි. අද හාල් සේරු 2 යි, දෙන්නේ. අද හාල් සේරු භාගයයි දෙන්නෙ. අද හුණ්ඩුවයි දෙන්නෙ. අද පරිප්පුයි බතුයි.අද මාලුයි බතුයි මෙන්න මේ වාගේ, කියන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

අනුර මොකද කරන්නෙ ?

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)*
**(Mr. Weerasinghe Mallimaratchchi)**

අනුරට කරන්න දෙයක් නැහැ. ලක්ෂ්මන්ලා මොකක්ද කරන්නෙ ? ලක්ෂ්මන්ලා ව්‍යාපාරයක් ගෙනිච්චා. අනුරලා ව්‍යාපාරයක් ගෙනිච්චා. ඒ ව්‍යාපාරය හරි. මොකක්ද ඒ ව්‍යාපාරය ? මුළු ලංකාවම කැඳවන්න. සමස්ථ ලංකාවම කැඳවන්න. ඒ අනුව සමස්ත ලංකාවම කැඳවන්නයි තිබුණේ. ඒක ඇනගෙන ඉලංගරත්නලයි, කොබ්බෑකඩුවලයි, විජේ කුමාරණතුංගලයි මොනවාද කළේ ? විගහට ගියා කැළණියේ පන්සලට. විගහට රිංගුවා පන්සලට. මොන බුදුහාමුදුරුවොද මේ යක්කුන්ට ? බුදු හාමුදුරුවො ඕනෑකමට නොවෙයි කොබ්බෑකඩුව ඕනෑකමටයි, මේ තරුණයාගේ බෙල්ල කපන්නයි ගියේ. අනුර බණ්ඩාරනායකගේ බෙල්ල කපන්නයි පන්සලට ගියේ. වෙන එකකට නොවෙයි, කඩුව මුවහත් තියන්න ගියේ. ගිහිල්ලා කැපුවා හරියට මල් වට්ටියක් තියලා. මෙන්න මම තමයි අපේක්ෂකයා, බුදුහාමුදුරුවනේ මාව පිළිගන්න කියලා බුදු හාමුදුරුවන්ට වැන්දා. බුදුහාමුදුරුවො පණ පිටින් හිටියනම්, අම්මපල්ලා, බුදු හාමුදුරුවෝ පැනලා දුවනවා පන්සලෙන්, මේ අපරාධය දැකලා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසිංහ මල්ලිමාරච්චි මහතා]

ඊට පසුවදා මොකද, කළේ ? චන්ද්‍රිකා කුමාරණතුංගගේ ආනුභාවයෙන්, අනුසාසකත්වයෙන් මුදල් වියදමින් පවත්වාගෙන යන 'දිනකර' පත්‍රයේ උඩින්ම ලොකු අකුරෙන් දැම්මා, 'මෙන්න, ජනාධිපති කඩුව' කියා. කොබ්බෑ කඩුව අසිපතලු. ඒක අසිපතක්ද, ඉලපතක්ද මම දන්නෙ නැහැ. එහෙම දමල ඊළඟට මොකද, කළේ ? 'අපේ අනාගත ජනාධිපති කොබ්බෑකඩුව' කියලා කොළ ටිකක් මුද්‍රණය කරල උසාවිය ළඟ ගැහුවා. [බාධා කිරීම්] 'අනාගත ජනාධිපති කොබ්බෑකඩුව' කියල උසාවිය ළඟ ගැහුවේ ඇයි? එයා 'ප්‍රොක්ටර්' හින්ද 'ප්‍රොක්ටර්ලාට' පෙනෙන්නයි. ඒ විධියට කොළ ගැහුවා, උසාවිය ළඟත් තවත් තැන්වලත්.

එහෙම කළේ ඇයි ? මේ තරුණයා—නුවරඑළිය-මස්කෙළිය දෙවන ගරු මන්ත්‍රීතුමා—(අනුර බණ්ඩාරනායක මහතා)—'අප්සෙට්' කරන්නයි. ජනාධිපතිවරණ අපේක්ෂක තෝරන ඒ රැස්වීම කොහොම හරි ඒකාධිපති විධියට තිබ්බා. ඇයි, එහෙම කළේ ? මම දැන් වුණත් කියන්නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඒ ගොල්ලන්ගේ පිලේ සමස්ත ලංකා කාරක සභා රැස්වීම කැදෙව්වා නම් ජනාධිපති අපේක්ෂකයා හැටියට තේරෙන්නේ කොබ්බෑකඩුව නොවෙයි. අනුර බණ්ඩාරනායකයි කියා. ඒකට අර ගෙල්ලො බය වුණා. අත්තනගල්ලේ මන්ත්‍රීතුමාට (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මම කියනවා, පුළුවන් නම් නැහැයි කියන්න කියා. ඇයි, සමස්ත ලංකා කාරක සභාව කැඳවන්නේ නැත්තේ ? මම අභියෝග කරනවා, පුළුවන් නම් ඒ සමස්ත ලංකා කාරක සභාව කැඳවා ඒ පක්ෂයේ ජනාධිපතිවරණ අපේක්ෂකයා තෝරන්නය කියා.

ඒ ගොල්ලො එක්සත් ජාතික පක්ෂයටයි කියන්නේ, 'ඒකාධිපති විධියට වැඩ කරනවාය' කියා. අපි නම් අපේ නියෝජිතයො 1500ක් රාමක්‍රිෂ්ණ ශාලාවට කැඳවලා ඒ සියලු දෙනාම අත උස්සලා ඡන්දය දීලයි, අපේ ජනාධිපතිවරණ අපේක්ෂකයා වශයෙන් ගරු ජනාධිපතිතුමා තෝරා ගත්තේ. ඒ විධියට ඒ ගොල්ලන්ටත් පුළුවන් නම් 'සමස්ත ලංකාව' කැඳවලා ඒ නියෝජිතයන්ට නිදහස දීලා තමන්ගේ අපේක්ෂකයා තෝරා ගන්නය කියා මම කියනවා. ඒ ගොල්ලන්ගෙ අපේක්ෂකයා තෝරා ගත්තේ 7 දෙනෙක් අත උස්සලයි. ඒ අතර තවත් 17 දෙනෙක් කැඩිල ගිහින්. ඒ ගොල්ලො වෙනම අපේක්ෂකයෙක් තෝරාගෙන. ඒ දෙගොල්ලොත් වෙනම හැප්පෙනව, බලයට කෑදරකමින්. කොහොම හරි අර තරුණයගෙ—නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමාගෙ—බෙල්ල කැපුව. මේක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉතිහාසගත වන දෙයක්. මේ කැපිල්ල ඒ තරම් ඓතිහාසිකයි. 1959 දීත් එහෙම එකක් වුණානෙ ? [බාධා කිරීම්]

මේ පක්ෂයට අන්තිමට වෙන්නෙ මොකක්ද ? මේ රටේ පළාත් පාලන ක්‍රමයේ ශුභසිද්ධිය සඳහා, පළාත් පාලන ක්‍රමය විමධ්‍යගත කිරීම සඳහා, එය මහජනයා අතට පත් කිරීම සඳහා විශාල සේවයක් කළා, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහත්මයා. එතුමා කළ ඒ සේවය, එතුමාගේ ඒ ව්‍යාපාරය ආරක්ෂා කරනවා වෙනුවට, ඒ සඳහා ග්‍රාමෝදය මණ්ඩල ආරක්ෂා කරනවා වෙනුවට, පළාත් පාලන ආයතන ආරක්ෂා කරනවා වෙනුවට මේ උදවිය අද කරන්නේ මොකක්ද ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මේ ඒකාධිපති කණ්ඩායම තමයි, පළාත් පාලන ආයතන නැති කළේ. එමගින් ඒ උදවිය තමන්ගේ පක්ෂයේ නිර්මාතෘවරයාට පවා අගෞරවයක් කළා. සාක්ෂි ඇතිව ඒ බව ඔප්පු කරන්න මට පුළුවනි.

අත්තනගල්ලේ මන්ත්‍රීතුමා කිවා, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වන්න නම් පළාත් පාලන ආයතනවලට බලතල දෙන්නය කියා. එම නිසා එතුමාට එක දෙයක් මතක් කරන්න කැමැතියි. 1962 ඉඳල 1969 දක්වා මම කොළඹ නගර සභාවේ සභිකයෙක් හැටියට සේවය කර තිබෙනවා. මම අවසාන වරට කොළඹ මහ නගර සභාවට පත් වුණේ 1969 දීයි. ඒ ගොල්ලන්ගෙ පාලන කාලය තුළ—1977 දක්වා—කොළඹ මහ නගර සභාවට සභිකයන් පත් කර ගැනීම සඳහා මැතිවරණයක් තිබ්බේ නැත්තේ ඇයි කියා මම අහන්න කැමැතියි. ඒ තමයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ ප්‍රජාතන්ත්‍රවාදය. එහෙම නම් ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පක්ෂයද, එහෙම නැතිව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද කියා මම අහන්න කැමැතියි.

මේවා කලවානේ මන්ත්‍රීතුමාටත් (සරත් මුත්තෙට්ටුවේගම මහතා) තේරෙනවා, පෙනෙනවා. නමුත් එතුමාත් මේවා නොපෙනෙනවා, නොතේරෙනවා, වගේ ඉන්නවා. මේ ගොල්ලො අනුගමනය කරන්නෙ දෙබිඩි පිළිවෙතක්. ඒ මොකද, මේ රටේ ඒකාධිපතිවාදයක් ගොඩනගන්න පුළුවන් නම් ඒකට කියාපු පිරිස තමයි කොමියුනිස්ට් පක්ෂය. ඒ අය සූදානම් වී ඉන්නේත් ඒකාධිපතිවාදයක් මේ රටේ ගොඩනගන්නයි. ඒ නිසා තමයි, මේ විධියට කෑ ගහන්නෙ. ඒ අය කියනවා, එක අපේක්ෂකයෙක් නැත්නම් පොදු අපේක්ෂකයෙක් ඉදිරිපත් කරන්නය කියා. ජනාධිපතිවරණය ගැන කථාව පටන් ගත් දා ඉඳලම ඒ ගොල්ලො කෑ ගහන්නේ 'කොමන් කැණ්ඩිඩේට්' කෙනෙක් විරුද්ධ පක්ෂයෙන් ඉදිරිපත් කරන්නය කියලයි. එහෙම කෙනෙක් ඉදිරිපත් වුණොත් ඒක පුදුමයක්. ඒක නම් කවදාවත් වෙන්නෙ නැහැ. ඒ මොකද ? එක පැත්තකින් ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතා කියනවා, "මම තමයි, 'කොමන් කැණ්ඩිඩේට්' කියල. අනෙක් පැත්තෙන් කොබ්බෑකඩුව කියනව, "මම තමයි, 'කොමන් කැණ්ඩිඩේට්'" කියල. 'විජේවීර කියනවා, 'උඹලගෙ ඇති වාමාංශිකකමක් නැහැ' කියල. ඇත්ත වශයෙන්ම ඒක පිළිගත යුත්තක්.

අද 'ඇත්ත' පත්තරයත් කෑ ගහනවා, පොදු අපේක්ෂකයෙක් ගැන. ඒ වගේම කලවානේ මන්ත්‍රීතුමාත් කෑ ගහනවා. ඒ වුණත් දැන් මේ රටේ මොන පළාතෙද පුළුවන් කොමියුනිස්ට් පක්ෂයේ රැස්වීමක් තබන්න ? එහෙම නැත්නම් ලංකා සමසමාජ පක්ෂයේ රැස්වීමක් තබන්න පුළුවන් මොන පළාතෙද ? අද ඒ පක්ෂ දෙකම දිය වෙලා ගිහින්.

විරුද්ධ පක්ෂයේ ඉන්න ඔය උදවිය තමන්ගේ පාලන කාලය තුළදී—ඒ හත් අවුරුද්දේදී—මහ මැතිවරණ නැති කරල, මහ නගර සභා මැතිවරණ නැති කරල, පළාත් ආණ්ඩු සභා මැතිවරණ නැති කරල, සුළු නගර සභා මැතිවරණ නැති කරල, ගම් සභා මැතිවරණ නැති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරල, ඒ ඒ ආයතනවලට තමන්ගේ හෙංචයියලා දමල ඒවා අල්ලස්—දූෂණයෙන් විනාශ කරල දැම්මා. ඒ ගොල්ලො වැඩ කළේ ඒකාධිපති විධියටයි. අද ඒ ගොල්ලො අපිට කියනව, ග්‍රාමෝදය මණ්ඩලත් ඒ තත්ත්වයට දමන්නය කියා.

අද ගමේ වැඩක් කෙරෙනවා නම් කෙරෙන්නේ මේ ග්‍රාමෝදය මණ්ඩල නිසයි. නමුත් කොත්මලේ මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) එදා කීවා, මේ ග්‍රාමෝදය මණ්ඩලවලින් කිසි වැඩක් නැහැ කියල. නමුත් එතුමා අද කියන්නේ මොකක්ද? මේවාට බලනල නැතිලු! මේ ග්‍රාමෝදය වැඩ පිළිවෙළ දවසින්-දවස ඉදිරියට යන බව මේ ගොල්ලොත් දන්නවා.

ඒ ගොල්ලන් අතර තිබෙන වාද-භේදවලට අපි පළිද? හාරිස්පත්තුවේ දෙවන මන්ත්‍රීතුමා (ආර්. පී. විජේසිරි මහතා), දිස්ත්‍රික් සංවර්ධන සභා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මුල ඉඳල අනුගමනය කරපු ක්‍රියා පිළිවෙත මොකක්ද කියා පෙන්නා දුන්නා. ඒවාට අපේක්ෂකයන් තෝරා ගන්න ගිහින් ඇති වුණු කලබල නිසා අතරමගදී ඒ ඡන්දයෙන් පැනල ගිය හැටි එතුමා විස්තර කළා. ඒවට අපි පළිද කියා එතුමන්ලාගෙන් අහන්න කැමැතියි. කොත්මලේ මන්ත්‍රීතුමා ඒ සංවර්ධන සභා රැස්වීම්වලට සහභාගි වෙලා කටයුතු කරනවා නම් ඔහොම කථා කරන්නේ නැහැ. අර මෛත්‍රීපාල සේනානායක මහත්මයා නේ බෙල්ල කපන්න ඕනෑ නිසා එතන නැවැත්තුවා. ඒකාධිපතිවාදය තිබෙන්නේ ඒ අය ළඟයි. අවුරුදු 7 ක්ම තබා ගත්තා. අද කෑගහනවා කොබ්බෑකඩුව ජනාධිපති ධුරයට පත් වූ වහාම සිරිමා බණ්ඩාරනායක මහත්මියගේ ප්‍රජා උරුමය ලබා දෙනවාය කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රජා උරුමය නොහොම වණත් ජීවතුන් අතර නැබුවොත් පුදුමයි. මම නුවරඑළිය මස්කෙළිය දෙවන ගරු මන්ත්‍රීතුමාට (අනුර බණ්ඩාරනායක මහතා) කියනවා අම්මව බලා ගන්නය කියා. අනික් වැඩ ඔක්කොම පැත්තකින් තබා එතුමා කළ යුත්තේ තමන්ගේ මෑණියන් පරිස්සම් කර ගන්න යම් ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීමයි, ඔය කොබ්බෑකඩුවලාගෙන් හා ඉලංගරත්නලාගෙන්. කොහෙත් කඩුව දමයිද දන්නේ නැහැ. කරුණාකර මිනක තබා ගන්න, නාත්තාට කළ වැඩේ අම්මටත් කරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු 5 කට බලය අරගෙන අවුරුදු 7 ක් මේ මුළු රටේම මිනිසුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය නැති කළා; ඡන්දය දීමේ බලය නැති කළා. එහෙත් අපි කර තිබෙන්නේ නීත්‍යානුකූලව කොමිෂන් සභාවක් මාර්ගයෙන් අවුරුදු 7 ක් ඒ බලය නැති කිරීමයි. එය ප්‍රජාතන්ත්‍රවාදී විධියට කළ දෙයක්ය කියා මුළු ලෝකයම පිළිගත්තා. අපට ඕනෑ නම් වෙනත් මාර්ග සකස් කරන්න තිබුණා. මම අහන්න කැමතියි, ලංකා කොමියුනිස්ට් පක්ෂය මේ රටේ බලයට පත් වුණොත් පැය කීයක් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තිබේද කියා.

ගරු අගමැතිතුමා මේ ග්‍රාමෝදය මණ්ඩල ඇති කළේ හොඳ සිහි කල්පනාවෙන්, ගමේ මිනිසුන් එකතු කර ගමේ පාර හදන්න, ගමේ කැඩුණු තොටුපොළ හදන්න, ගමේ දුප්පතුන්ගේ වැඩට උදව් කරන්න. අන්න ඒ වැඩ කොටසට විරුද්ධ පාර්ශ්වයේත් සහයෝගය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 5.57

**වීරවන්නි සමරවීර මහතා (නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමා)**

*(திரு. விரவன்னி சமரவீர—கல்விப் பிரதி அமைச்சர்)*

(Mr. Weerawanni Samaraweera—Deputy Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාණන් මේ රටේ අලුත් සමාජ වෙනසක් ඇති කරන්නට—ශ්‍රීමත් ජනාධිපතිතුමාණන් ධර්මිෂ්ට සමාජයක් ඇති කරන්නට, නව මිනිසකු තුළින් නව සමාජයක් ඇති කරන්නට 1977 ජනතාවගේ කැමැත්ත ලබා ගත් වහාම—ගරු අග්‍රාමාත්‍යතුමාණන් අනාදිමත් කාලයක් තිස්සේ තිබුණු මේ රටේ ඇතු පෞරාණික සමාජයට ශිෂ්ටාචාරයට නව පණක් දෙන්නට, මොන විධියේ කාර්මික ආර්ථික වෙනස්කම් මේ රටේ ඇති වුණත් මේ ප්‍රතිය අවුරුදු දහස් ගණනක් ආරක්ෂා කර ගත් සමාජ පදනම ආරක්ෂා කර ගන්නට, ලොකු සමාජ විප්ලවයක් ඇති කරන්නට, සංවර්ධන සභා ක්‍රමය ඇති කළා. ඒ තුළින් එතුමන් බලාපොරොත්තු වුණේ මහජනතාව අතර මුදල් ගැවසීම පමණක් නොවෙයි, මිනිසා තුළ නැත්නම් ජනතාව තුළ ආකල්පමය වෙනසක් ඇති කරන්නයි. මේ සමාජ ආකල්පමය වෙනස ඇති නොවූ නිසා තමයි, 1947 සිට 1977 වන තුරු මේ රටේ කිසියම් වෙනසක් ඇති වුණේ නැත්තේ; මිනිසුන් තුළ වෛරය පැලපදියම් වන්නට වුණේ. රටේ නායකයන් මිනිසුන්ගේ ආකල්පයේ වෙනසක් ඇති කරන්නට, ධාර්මික බවක් ඇති කර ගන්නට, පිළිවෙළක් ඇති නොකළ නිසයි; එසේ වුණේ. අවුරුදු 5 කට පමණක් සීමා වන ආරෝප කර ගත් ක්‍රම තුළින් ඊළඟ වතාවේ බලයට පත් වන්නට තිබුණු බලලෝභී ක්‍රමය නිසා රටේ වෙනසක් ඇති වුණේ නැහැ. නමුත් ශ්‍රීමත් ජනාධිපතිතුමන්ටත් අගමැතිතුමන්ටත් අපේ ගෞරවය හිමි කරන්නට ඕනෑ, අද මුළු මහත් සමාජය පුරාම කිසියම් වෙනසක් ඇතිවේගෙන යැම ගැන.

හැම කාලයකම මැතිවරණ කාලසීමාව ළඟා වන විට ජනතාව තුළ විශාල නොසන්සුන්කමක්, අමුතු කෝපයක්, අමුතු තරහක්, පාලක පක්ෂයත් සමග ඇති වී තිබෙනවා. එහෙත් එවැනි දෙයක් අද නැහැ. ජනතාව රජයත් සමග, ජනතාව රටේ නායකයනුත් සමග, සැදී පැහැදී යන ගමන පිළිබඳව අද කැමැත්තෙන් සිටිනවා. එහෙත් විරුද්ධ පාර්ශ්වය එය තේරුම් ගන්නට බැරිව පරණ මිත ඔස්සේම ගමන් කරනවා.

ගරු සෞඛ්‍ය ඇමතිතුමා මතක් කළා ඉතාම වැදගත් දෙයක් ගරු අගමැතිතුමන් බලාපොරොත්තු වුණේ මිනිසා තුළ හැදියාවක් ඇති කරන්නයි, සංවර්ධන සභා වෙන්; ගම්වල තම තමන්ගේ වැඩ කටයුතුවලට පමණක් සීමා නොවී තමන්ගේ චරියාධර්මය ඇති කර ගන්නටයි මේ සංවර්ධන සභා තුළින්. ගම්පුරා උනුන් කෙරෙහි තිබෙන තරහ, කෝපය, දේශපාලන කෙටිම් නැති කර ගන්නට මේ සංවර්ධන සභා අනන ගෙන ආ බවයි එතුමා කිව්වේ. නමුත් විරුද්ධ පක්ෂය තවමත් බලාපොරොත්තු වෙන්නෙ ජනතාව තුළ වෛරය ඇති කරන්නටයි. දේශපාලනය බලපාන්නේ මිනිසාගේ ආර්ථික හා සමාජීය වෙනසක් ඇති කරන්නටයි. නමුත් ඒ අය තවම මේ කාරණය තේරුම් ගෙන නැහැ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරවන්නි සමරවීර මහතා]

එතුමා තවදුරටත් මතක් කළා, හිටපු කථානායකවර යෙක් එතුමාගේ දිස්ත්‍රික්කයට ගිහින් ඉතාමත් නින්ද නීය ලෙස, අශීලාචාර ලෙස හැසිරුණු ආකාරය පිළිබඳව, මෙය කනගාටුදායක තත්ත්වයක්. නමුත් ඒ ගතිය දැන් රට හැමතැනම යනව. මේ ළඟදී බදුල්ල දිස්ත්‍රික්කයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිරිමා බණ්ඩාරනායක මහත් මියගේ නායකත්වයෙන් රැස්වීමක් පැවැත්වුණා. වාස නාවකට මෙන් මගේ මැතිවරණ කොට්ඨාශයට ආවේ නැහැ. ආරක්ෂක ශේතුන් උඩය තියා ඒක නතර කළා. මම ඒ ගැන සන්තෝෂ වෙනව. ජනතාවට වංචා කළ හොර අම්මන්ඩි කෙනෙක් ජනතාවගේ අයිතිය ගැන කතා කරන්න මේ රැස්වීම්වලට යන්නෙ මොනවාටද?

මගේ මැතිවරණ කොට්ඨාශයේ ශාඛා බලමණ්ඩල විවෘත කරන්නට රැස්වීම් පවත්වන්නට ශබ්ද විකාශන යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනීම සඳහා බලපත්‍ර ලබා දෙන්න වය කියා පොලීසියට කලින්ම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළේ මමයි. ඊට දවස් දෙකකට පස්සෙ සිරිමා බණ්ඩාරනායක මහත්මියගේ කණ්ඩායමේ මහියංගනයෙ හිටපු මන්ත්‍රී වරයා, එඩ්වින් වික්‍රමරත්න ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළාම පොලීසිය ඉල්ලීම් ප්‍රතික්ෂේප කර තිබෙනව, නමුත් ආපසු සාකච්ඡා කර එක සථානයක් දී තිබෙනව. ඊට ඉස් සර මහියංගනයෙ හැම තාප්පයක්, බෝක්කුවක් ගානේම "වීර නායිකාව එනවා" කියල පෝස්ටර් ගහල තිබුණා. ඉතින් පොලිස් අධිකාරිතුමා කියා තිබෙනව, පෝස්ටර් ඇලෙව්වට අපට කරන්න දෙයක් නැහැ, ඒක බලපත්‍ර ලබා ගන්න නීත්‍යානුකූල අයිතියක් නොවෙයි, බලපත්‍ර ලබා ගන්න අප ළඟට එන්න ඕනෑය කියල. ඊට පස්සෙ එයාගේ ගම්මානෙ රැස්වීම් තබන්න තීරණය කර එයාගේ පාක්ෂික සාමාජිකයන්ට හැම දෙනාටම ලියුම් යවා තිබෙනව. මෙය ඉතාම කැත විධියෙ, පහත් විධියෙ පත්‍රිකාවක්. මම අත්තනගල්ලේ මන්ත්‍රීතුමාට (ලක්ෂ්මන් ජයකොඩි මහතා) දෙනවා මේ පත්‍රිකාව බලන්න. තමුන්නාන්සේලා මේ රටේ නායකයන් තෝරන්න ලැගැස්ති වෙන්නෙ මේ විධියේ අශීලාචාර මිනිසුන්ගෙන්ද කියා මම අහනව. සභාවේ කියවන්නට වත් බැහැ, මේකෙ ලියා තිබෙන දේවල්. මම පොට්ටයාලු! නින්දිතයාලු! පාදඩයාලු!.........පාදඩ විරෝධි......උගේ මහ එකා" ඒ කියන්නෙ අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමාට මේ විධියේ දේවල් ලියා තිබෙන්නෙ විරුද්ධව රැස්වීම් තබනවාලු, ගල උඩ.

බලන්න තෝරා ගන්න මිනිසුන්ගෙ හැටි. මෙයා තමයි තමන්ගෙ අක්කගෙ දූ තබා ගෙන ඉන්නෙ. නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීවරයා (අනුර බණ්ඩාරනායක මහතා) ඔය රැස්වීම් තියෙන තැනටම, ගල උඩට ගිහින් කිව්ව," හවස් වන කොට අම්ම තේරුම් කර ගන්නත් බැහැ, සහෝදරිය හඳුනාන්නෙත් නැහැ, මේ විධියේ වලත්තයින්ගෙන් අපිට වැඩක් නැහැ" කියල. මැදවච්චි යේ මන්ත්‍රීතුමාගේ (මෛත්‍රීපාල සේනානායක මහතා) පිළේ ඉන්න කොටයි කිව්වෙ. දැන් එයත් එතැන රැස් වීමට යන්න සූදානම් වෙලා තිබෙනව. ඔය පත්‍රිකාව පෙන් වලා තමයි මම කිව්වෙ, සාමය කඩ වෙන්නට ඉඩ තිබෙ නව, ශීලාචාර, ගුණධර්ම ආරක්ෂා කරන මිනිසුන් මෙයට විරුද්ධයි කියල. ඒකෙන් රැස්වීම් පැවැත්වීම නතර කළා. තමන්ගේ අක්කගේ දුවයි තියාගෙන ඉන්නෙ. බදුල්ලේ ගමනාගමන මණ්ඩලයේ රක්ෂාවක් කළා යතුරු ලියන්නියක හැටියට. රක්ෂාවෙන් අස්කර ගෙන දැන් ගෙදර තියා ගෙන ඉන්නව. සහෝදරයෝ හරි, අම්මා හරි යනකොට කාමරයක දමල දොර වහනව. දැන් ශරීරයේ ලොකු වෙනස්කම් ඇති වෙලා. මැයි මාසයේ එයාගේ වැඩි මහල් සහෝදරයාගේ වාර්ෂික දානය තිබුණා. සහෝදරයෝ ඔක්කොම කියා තිබෙනව, මේ වන චර වැඩේ නිසා එඩ්වින්ගේ ගෙදර පස් පාගන්නෙ නැත කියල. මෙයා තමයි අපේ ශීලාචාරකම් ගැන කතා කරන් නෙ.

මේ ගොල්ලන්ගේ ආණ්ඩුව තිබුණු කාලයේ මෙයා සිරිවර්ධන කියන අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට පුටුවෙන් ගහල ඔළුව පැළුව. ඇයි? අධ්‍යාපනය ගැන කතා කරන්න ගිහින් නොවෙයි, වලත්තකමට ගිහින්. උයන්වත්තේ ගුරු විද්‍යාලයේ හිටපු ගුරුවරියක් පොල්ගොල්ලේ ගුරු විද්‍යාලයට මාරු කරගන්න ගිහින්. මොකද? මේ ගුරු විද්‍යාලය තියෙන්නෙ පාර අයිනෙ. නුවර යන කොට බොහොම ලෙහෙසියෙන්, පහසුවෙන් හම්බු වෙන්න පුළුවන්, දැක බලා ගන්න පුළුවන්. පාඨමාලා දෙකක් මේ ගුරු විද්‍යාල දෙකේ තිබෙන්නෙ. අධ්‍යක්ෂතුමා කිව්ව මෙයාව මාරු කරන්න බැහැ කියල. තරහ ගියා; ඔළුව පැලුවා; නඩු දැම්මා. පීලික්ස් ඩයස්ගේ උපදෙස් අනුව, පැරදෙන විධියට නඩුව දැම්ම. රුපියල් දහයක දඩයක් ගහල මේ මිනිහ දොට්ට දැම්ම. ඒකට මූළු ආසනයේ හැම තැන කින්ම සල්ලි එකතු කළා, වීරයා පිළිගන්න කියල.

එයාගේ වැඩිමහල් සහෝදරයා 1977 මැයි මාසයේ වෙසක් දවස්වල අභාවප්‍රාප්ත වුණා. හදිසියෙයි අන්තරා වුණේ. මරණ පරීක්ෂණයක්වත් තිබ්බේ නැහැ. මේගොල්ලන්ගේ බලතල ඒ දවස්වල. භූමදාන කළා. හත් දවසේ දානය දෙන්නත් ඉස්සරවෙලා ඒ වැඩි මහල් සහෝදරයාගේ භාර්යාව දරුවන් දෙන්නත් එක්ක ගෙදරින් පිට වුණා. ඇයි? යාලුවා ගෙදර හිටපු නිසා. පොලිසියේ සහකාර පොලිස් අධිකාරිවරයට කියා පිදී රත්තරන් බඩු ටික පොලිසියට ගෙන්වලයි අර ගත්තේ. යන එන මං තිබුණේ නැහැ. මහියංගනයේ ගරු මහජන මන්ත්‍රීතුමා, කම්කරු ඇමතිතුමා තමයි, ඊට පස්සේ පොලිසියට කියා ඒ බඩු ටික ගෙනත් දුන්නේ මේ එඩ්වින් වික්‍රමරත්නගේ සහෝදරයින් ටිකට ජීවත් වෙන්න විධියක් තිබුණේ නැහැ. ඉඩ කඩම් ටික සම්පූර්ණ යෙන්ම සූරාගෙන කාලා. අද සිරිමා බණ්ඩාරනායක මහත්මියගේ හොඳ සංවිධායකයෙක්.

කවුද විජය කුමාරණතුංග? එයත් ගිහින් මගේ විවාහ ජීවිතය ගැන කතා කරනවා. එයා කොහොමද? එයා බැන්දේ කාගේ කවුද? අපේ දෙමාපියන් නම් බොහොම ශීලාචාරයි. මට අද කතා කරලා මේ ගරු සභාවේ කියන්නට පුළුවන් මගේ පියා කවුද කියල. සමහර පවුල්වල, දරුවන්ට රජකම් ඉල්ලන කට්ටියට තමන්ගේ තාත්තා කවුද කියා සැකයක් නැතිව කියන්නට බැහැ. හතර පස් දෙනෙකුගේ නම්වලින් තෝරා ගන්නට ඕනෑ, මගේ තාත්තා මේකා වෙන්න ඇති කියා. අපි ශීලාචාරයි. කොහෙන්ද එයා බැන්දේ?

මේ රටේ සිටින ලෝකයේම පිළිගත් කන්තාවක් ගැහැණු දරුවන් දෙන්නෙක් හැදුව අම්මා කෙනෙක් ගැහැණු දරුවෙක් හැදුවාම, තිසි වයසට ආපුවාම රටේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තොටේ ඉන්න නැදෑ හිතවතුන්ට කියා හොඳ කසාදයක් කරලා දෙනවා. එහෙම කසාදයක්ද එයා බැන්දේ? දරුවෝ හදාපු අම්මට පුළුවන්කම තිබුණද නැදෑයොත් එක්ක එකතුවෙලා තමන් හදාපු දරුවන් දෙන්නාය කියා කෙනෙකුට දීග දෙන්න. නැහැ. කුලියට දෙන 'ලවුඩ්ස්පීකර් සෙට්ස්' දෙකක් වගෙයි දරුවෝ දෙන්නාම. අද කෙනෙක් අරගෙන යනවා. හෙට තවත් කෙනෙක් අරගෙන යනවා. ඒ විධියට රටේ තොටේ දුවපු 'ලවුඩ්ස්පීකර් සෙට්' එකක් නේද විජය කුමාරණතුංග ගත්තේ? එහෙම එකක් නේද ගත්තේ? රුස්වීම් තියන්නට දුන්නේ නැත්නම් අපේ එළිපත්තට එනවාය කියා එයා කිව්ව ලු. විජය කුමාරණතුංග වගේ දඬාවතේ යන එන පාදඩයන්ට අපේ ගෙවල් වලට එන්නට ඉඩ දෙන්නේ නැහැ. මම මේවා කියන්නට ඕනෑ, අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාට. කතා කරන විට දේශපාලනය ගැන මිසක් වනචර කතාවක් කරන්න නොවෙයි දේශපාලනයෙන් ඉඩ ලැබෙන්නේ. ඔහෙලා වනචර විධියට දේශපාලනය කළ නිසා තමයි, 1977 දී මුළු රටම එකතුවෙලා ශීලාචාර ශ්‍රේෂ්ඨ නායකයෙකුට මේ රට භාර දුන්නේ. අපි දේශපාලන වේදිකාවල [බාධා කිරීමක්]

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி.)*

**(Mr. Lakshman Jayakody)**

නැහැ! නැහැ! මම වනචර කතා කවදාවත් කියලා නැහැ.

**වීරවන්නි සමරවීර මහතා**

*(திரு. வீரவன்னி சமரவீர)*

**(Mr. Weerawanni Samaraweera)**

තමුන්නාන්සේ නියෝජනය කරන පක්ෂයේ අයට, කතා කරන්නට දන්නේ නැති මිනිසුන්ට උගන්වන්න ඕනෑ කතා කරන්න. අද ප්‍රධාන පෙළේ නායකයෙක් විජය කුමාරණතුංග. එයාට මොකක්ද තිබෙන අයිතිය මගේ විවාහ ජීවිතය ගැන කතා කරන්න. මොන විධියේ විවාහ ජීවිතයක්ද විජය කුමාරණතුංග ආරම්භ කළේ? කෝ පසුබිමක්? සාර්ථක විවාහ ජීවිතයක්ද එයා ගත කරන්නේ?

මට මතකයි මගේ පියා අන්තරා වුණු දවසේ මගේ මවු දරුවෝ ටික ඔක්කොම බදාගෙන හඬා වැලපුණු හැටි. මගේ පියාගේ දේහය ළඟ වැටී ශෝක වුණු හැටි. අවුරුදු ගණනාවක්ම, එතුමිය ඇස් පියා ගන්නා තුරු පියාණන්ගේ ගුණ වර්ණනා කරමින් අපව යහපත් මාර්ගයේ යැව්වා. අනික් අම්මලා? වෙඩි තියනවා දැක්කා. වෙඩි වැටී සිටිනවා දැක්කා. උසාවියට ගියාද සාක්ෂියක් දෙන්න? 'සැමියා නොමරා මැරුවේ අසවලා' කිය කියා ඡන්දය ඉල්ල ඉල්ලා ගියා. දරුවෝ ඉදිරිපිට වේදනා වෙන් කෙඳිරි ගගා ලේ පෙරාගෙන වැටිච්ච වෙලාවේ තමන්ගේ ස්වාමි පුරුෂයාට ආදරයක් තිබුණා නම් උසාවියට යන්නට තිබුණා නේද? රටේ තිබෙන කටකතාවල් වෙනයි, ඒගොල්ලො ගැන. එහෙම පවුල් එන්නේ, අහිංසක ගැමි ජීවිත තුළින් එක්සත් ජාතික පක්ෂයේ නව ආකල්පය තුළින් එළියට ආපු අපේ තරුණයන්ගේ චරිත ඝාතනය කරන්න. හොඳ සෙට් එකක් ලැහැස්ති කරගෙන ඉන්නවා, දැන් අත්තනගල්ලේ මන්ත්‍රීතුමාගේ (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කොටඨාශයෙත් චරිත ඝාතනය කරගෙන යන්න.

කොමියුනිස්ට් පක්ෂයේ දර්ශනයක් තිබෙනවා, හරි යෝ වැරදි හෝ ඒ ගොල්ලන් ඒ දර්ශනය රටට කියාගෙන යනවා. නමුත් කුණුහරුප කියාගෙන යන්නෙ නැහැ. මගේ රෙදි ගලවනවාලු! යට ඇඳුම් ගලවනවාලු! ජනාධිපතිතුමාගේ ඇඳුම් ගලවනවාලු! මුන්ට මහ පිස්සුවක් තිබෙන්නෙ. පිස්සුවක් තිබෙන්නෙ ඇඳුම් ගලවන්න. මුන් නේද ගරු කථානායකතුමනි, ඇඳුම් ගලව ගලවා අවුරුදු හතක් තිස්සේ හෝටල්වලයි අනනයි මෙතනයි, වලත්තයො වගෙ හැසුරුණේ. ගෙවල් දොරවල්වල ගෑණු රැකගන්න බැරි වුණේ කාටද? අපටයි මේ කියන්නෙ ගම්මණ්ඩිවල මිනිසුන්ට. ජනාධිපති තරඟයට එනවනම් හැදිච්ච මිනිස්සු හැටියට ශීලාචාර මිනිස්සු හැටියට කථා කරන්නය කියා කරුණාකර උගන්වන්න.

අපි 1977 දී මේ වලත්තයො ගැන කථා කළේ නැහැ. චරිත ගැන කථා කළේ නැහැ. අපි කිව්වා, මෙන්න අපේ දර්ශනය, මෙන්න අපේ ප්‍රතිපත්තිය මෙන්න අපේ නායකතුමා යන හැටි, මෙන්න අපේ උපනායකතුමා යන හැටි, මෙන්න අපි රක්ෂා ප්‍රශ්නය විසඳන හැටි, මේවාට අපි දෙන පිළිතුරු හොඳ නම් අපි ගාවට එන්නය කියා. කිසි දේකට පිළිතුරක් නැහැ, දර්ශනයක් නැහැ; මාර්ගයක් නැහැ; මාවතක් නැහැ; පිළිවෙතක් නැහැ. බැණ බැණ ඇවිදිනවා. බොහෝම ප්‍රවේසම් වෙන්න ඕනෑ. ඔය විධියට ගමන් කරන්න ආවොත් ඔහේලා ඇඳුම් ගලවල හෙළුවෙන් එවන්න වේවි.

කරනවා නම් ජනාධිපතිවරණය ශීලාචාර විධියට කරමු. අත්තනගල්ලේ මන්ත්‍රීතුමා තමන්ගේ කණ්ඩායමට ගිහින් කියන්න. නැහුණ වාගේ පත්තරේ බල බලා ඉන්නවා දැන්. බොහෝම කණගාටුයි. දැන් විලිස්සන්න පුළුවන්. නමුත් අමු වලත්ත කථා රැස්වීම්වලට ගිහින් කියන්නෙ. කෝ ඔහේලාගේ දර්ශනයක්? කෝ ප්‍රතිපත්තියක්?

මළකඳ බදාගෙන හැම්දාම බණ්ඩාරනායක ප්‍රතිපත්තිය කිව්වට මැරිච්ච වෙලාවෙ සාක්ෂි දෙන්න ගියේ නැහැ. ඒවා අදින්න ගියොත් බඩවැල් වාගේ. ඇයි කුඹුරු පණත ආපු වෙලාවෙ හන්දි ගාණෙ වොන් ගණන් අච්චු ගහල ගලක් උඩ තියල එක එක අරන් යන්නය කිව්වෙ? මොකක්ද? රොස්මීඩ් ප්ලේස් එකෝ කුස්සියෙ උන්දැගෙ විස්තරේ එදා තිබුණේ.

බණ්ඩාරනායක අගමැතිතුමා ඝාතනය කළේ කවුද? මේ රටේ පොදු ජනතාවද? නැහැ. රදළ වලව්වල උදවිය එකතු වෙලයි, ධනපතියො ටික එකතු වෙලයි, ඒ විධියට පොදු ජන නායකයෙක් මරා දැම්මෙ. මෙහෙම මිනිස්සු!

සංවර්ධන සභා පනත අපි ඇති කළේ ගමේ ශීලාචාරකමක් ඇති කරන්නයි, මොන සමිති සමාගම් හෝ එක්කහු කර ගමත් හදා ගන්න අතර ජනතාවගේ මානසික තත්ත්වයේ වෙනසක් ඇති කරගෙන රටත් හදා ගන්නයි. ඊට විරුද්ධව දමා තිබෙන සංවිධායක වරු බලන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරවන්නි සමරවීර මහතා]

අපි ස්තුතිවන්ත වෙනවා, ගරු කථානායකතුමනි, මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාට (මෛත්‍රීපාල සේනානායක මහතා) 1947 සිට—අපි පාසල් යන කාලයේ සිට—දේශපාලනය කළ මන්ත්‍රීතුමෙක් හැටියට. එතුමාගේ කණ්ඩායමට එතුමා ආදර්ශයක් දෙමින් ක්‍රියා කර තිබෙන ආකාරය ගැන. කුණුහරුප නැහැ. අභුටුම්ට්ට වාගේ ඉන්න කොත්මලේ මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) උඩුදුම්බර ආසනයට ගිහින් නියෝජ්‍ය උසස් අධ්‍යාපන ඇමතිතුමාගේ පියාගේ චරිතය ඝාතනය කළා එදා. මෙතන ඇවිත් හැදිච්ච මිනිස්සු වාගේ කථා කරන්නෙ. අහන්න හොයි තරම් අමාරුවෙන්ද කියා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ තරුණයො පික වළන්වා ගත්තෙ කියා, ඔය මිනිස්සු කළ කථාවල් නිසා. ඕවාද රටේ මිනිසුන්ට අවශ්‍ය? අපේ දේශපාලන දර්ශනයේ ප්‍රතිපත්ති හොඳ නැත්නම් ඒවා උළුප්පා දක්වන්න. ඒවා ගැන කථා කරන්න. තමන්ගේ දරුවො හදා ගන්න බැරි, තමන් නායකත්වය දෙන පක්ෂයට තමන්ගේ චරිතය ගැන කතා කරල තමන්ගේ කණ්ඩායම හසුරුවා ගන්න බැරි විනාශ වූ ජීවිත! අපේ අම්මලා නම් ඒ උන්දැලා දිහා බලල උදේ පාන්දර කෙළ ගහනවා; අනේ කෙලෙසුණු ජීවිත! බංගලාවටයි, නමටයි, පරම්පරාවටයි, අදින සාරියටයි බොරු ආටෝපය දාගෙන ලෝකයා රවටන්න "මම පත්තිනි අම්මා, මම විහාර මහා දේවි" කියනවා. කැතයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

සංවර්ධන සභා (සංශෝධන) පනත් කෙටුම්පත යටතේ මම ඒ කරුණු ටික කිව්වේ මේවා ක්‍රියාත්මක කරන්නේ මහජන නියෝජිතයන් නිසයි. මහජන නියෝජිතයන්ගේ චරිතය පිරිසිදු විය යුතුයි. ඒ ගැන අපි කතා කරන්නට ඕනෑ. අපි බොහොම අමාරුවෙන් සීරුවෙන් මේ තැන්වලට ඇවිත් නායකත්වයේ දර්ශනය ඔස්සේ ඉදිරියට ගමන් කරන්නේ. අපේ ගමන් බිමන් අපේ චයසීාවන් අපි පුළුවන් විධියට ශක්ති ප්‍රමාණයෙන් අපි චරිතවත් කරගෙන තිබෙනවා. කාටවත් ඇඟිල්ල දික් කර කියන්නට බැහැ අපි කෙළසුණු මිනිස්සුය කියල. ඒ ශක්තිය ඔස්සේ අපි තවමත් ඉදිරියට යනවා. එක්සත් ජාතික පක්ෂයේ ඉතිහාසය අනුව හැම යුගයෙන් යුගයටම ඒ යුගය ඔප කරන්නට පුළුවන් ශ්‍රේෂ්ට පරම්පරාවක් ශ්‍රේෂ්ඨ නායකයන් බිහි වී තිබෙනවා. අදත් ඒ එළිය තිබෙනවා. අනාගතයේදීත් ඒ එළිය ඒ ආලෝකය මේ රටට ලැබෙනවා. ඒක ඇසල විනාශ වූ චරිතය කෙළසා ගත් උදවිය ඊර්ෂ්‍යාවෙන් අපට මඩ ගහනවා. මෙවැනි ශ්‍රේෂ්ඨ ආයතනයක මේවා ඉතිහාසගත වෙන්නට ඕනෑ. කවදා හරි මේ රටේ ඉතිහාසය කියවන උදවියට දැන ගන්නට, රටට දැන ගන්නට සමාජයට දැන ගන්නට, මේ විධියේ පොදු ජන යහපත උදෙසා ඉදිරිපත් කළ දේවල්වලට විරුද්ධව කෑගැසුවේ කවුදැයි දැන ගන්නට මේවා ඉතිහාස ගත වෙන්නට ඕනෑ. එසේ ප්‍රකාශ කරමින් සංවර්ධන සභා පනත තුළින් අපේ සමාජයේ නව ආකල්පයක් වෙනස්කමක් ඇති කරන්නට ගරු අගමැතිතුමාණන්ට ශක්තිය සහ ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

අ. භා. 5.17

**චන්ද්‍ර රණතුංග මහතා** (මාවනැල්ල)

*(திரு. சந்திர றணதுங்க—மாவனல்ல)*

**(Mr. Chandra Ranatunga—Mawanella)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංවර්ධන සභා (සංශෝධන) පනත් කෙටුම්පත ගැන වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරු රාශියක්ම කථා කරමින් ප්‍රකාශ කරන්නට යෙදුණා මේ සංවර්ධන සභා තුළින් ග්‍රාමෝදය මණ්ඩලවලට පත් වී සිටින නියෝජිතවරු මහජනතාවගේ කැමැත්ත ඇතිව පත් වූ අය නොවේය කියල. මේ ග්‍රාමෝදය මණ්ඩලවලට පත්ව සිටින්නේ අපේ ගම්වල තිබෙන ග්‍රාම සංවර්ධන සමිති, ණය දෙන සමිති, ස්වේච්ඡා සංවිධාන ආදි ආයතනවල සභාපතිවරුන් බව අපි විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මතක් කර දෙන්නට කැමතියි. ඒ සභාපතිවරු ඒ සමිතිවලට පත් වෙන්නේ කොහොමද කියන එකත් අපි විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මතක් කර දිය යුතුයි. අපේ ගම්වල තිබෙන ඒ සමිති සංවිධානවලට සභාපතිවරුත් ඒවාගේම අනෙකුත් නිලධාරීනුත් පත් වෙන්නේ ඒවායේ සාමාජික මහත්ම මහත්මීන්ගේ ඕනෑ එපාකම් අනුව ඡන්දයෙන්. එහෙම නම් පළාත් පාලන ආයතනවලට— ගම් කාර්‍ය සභාවලට, සුළු නගර සභාවලට—නියෝජිතයන් පත් කළා වාගේම මේ ග්‍රාමෝදය මණ්ඩලවලට පත් වන සභාපතිවරුන් ගම්වල සිටින අය විසින්ම ඡන්දයෙන් පත් කරනු ලැබූ පිරිසක් බව මා මුලින්ම මතක් කර දිය යුතුයි. අපේ ගරු අගමැතිතුමාගේ මේ සංකල්පය අනුව ගම් කාර්‍ය සභාවල නියෝජිතවරුන් කිප දෙනෙකු වෙනුවට අද අපේ ගම්වල තිබෙන ස්වේච්ඡා සහ වෙනත් සමිති සංවිධාන රාශියකම සභාපතිවරුන්ට ඡන්දයෙන් තේරී පත් වී ඇවිත් අපේ ගම්වල වැඩ කටයුතු කරන්නට අවස්ථාව ලැබී තිබෙනවා.

ගම් කාර්‍ය සභාවලට පත් වූ නියෝජිතයන්ට වාගේ දැන් ග්‍රාමෝදය මණ්ඩලවලට පත් වන සභාපතිවරුන්ට ගම්වල වැඩ කටයුතු කරන්නට අවස්ථාවක් ලැබෙන්නේ නැත කියලත් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු කියන්නට යෙදුණා. දිස්ත්‍රික් සංවර්ධන සභා සහ ප්‍රාදේශීය මණ්ඩල පිහිටුවා ගත වී තිබෙන අවුරුද්දක් පමණ වූ මේ කාලය තුළදී දැනටමත් ග්‍රාමෝදය මණ්ඩලවලින් සෑහෙන වැඩ කොටසක් වන බව අපේ අත්දැකීම් අනුව පෙන්වා දෙන්නට පුළුවනි.

මට නිදර්ශනයක් වශයෙන් කියන්න පුළුවන් අපේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධන සභාවේ සිදු වුණු එක සිද්ධියක්. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වැඩවලින් මාවනැල්ල කොට්ඨාශයේ එක පාරක පැති බැම්මක් ඉදි කළා. ඒ පැති බැම්ම ඉදි කළාට පසුව, ඒ පැති බැම්මට පස් පිරවීමට අපට අවශ්‍ය වුණා. ඒ පස් පිරවීමේ වැඩ සම්බන්ධව ඇස්තමේන්තුවක් සකස් කරන්නය කියා අපි දෙපාර්තමේන්තුවට කිව්වා. ඒ ඇස්තමේන්තුව සකස් කළා, රුපියල් පණස් දහසකට. මේ කාරණය ගැන අපේ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ සාකච්ඡා කළා. ඒ අවස්ථාවේදී මම පෙන්නා දුන්නා, අපේ කොට්ඨාශයේ ඉතාම හොඳ ග්‍රාමෝදය මණ්ඩල තිබෙන බවත්, ඒ ග්‍රාමෝදය මණ්ඩලවලින් මේ කටයුත්ත ඊට වඩා ඉතාම අඩු මුදලකට කරන්නට පුළුවන් බවත්. ඒ අනුව මගේ කොට්ඨාශයේ තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රත්කොද්දිවල ග්‍රාමෝදය මණ්ඩලයෙන් ඒ කටයුත්ත ඉටු කරන්න පුළුවන් වුණා. රුපියල් පණස් දහසකට ඇස්තමේන්තු කළ ඒ කටයුත්ත රුපියල් හය දහසකින් නිම කළ බව මම අද ඉතාමත් සන්තෝෂයෙන් මතක් කරන්න කැමතියි. මෙන්න මේ පිළිවෙළටයි අපේ ග්‍රාමෝදය මණ්ඩලවලින් දැනට වැඩ කටයුතු කරගෙන යන්නෙ.

ග්‍රාමෝදය මණ්ඩලවල අද යම් යම් අඩුපාඩුකම් තිබුණත්, ග්‍රාමෝදය මණ්ඩල, ප්‍රාදේශීය මණ්ඩල, දිස්ත්‍රික් සංවර්ධන සභා ඇති කළ දැනට ගත වී තිබෙන්නේ ඉතාමත් කෙටි කාලයක් බව අප මතක තබා ගන්න ඕනෑ. උපන් හැටියේ දරුවෙකුට ඇවිදින්න බැහැයි කියා අපේ කියමනක් තිබෙනවා. අපේ තිබුණු පළාත් පාලන ආයතනවලට ඒ තිබුණ තත්ත්වයට එන්නට සෑහෙන කාලයක් ගත වුණු බවත් අපි දන්නවා. එහෙම නම් සෑහෙන කාලයක් ගත වෙන විට මේ ග්‍රාමෝදය මණ්ඩලවලට, ප්‍රාදේශීය මණ්ඩලවලට, දිස්ත්‍රික් සංවර්ධන සභාවලට ඉතාමත්ම ක්‍රියාකාරී තත්වයකට පත් වෙන්නට පුළුවන් වෙන බව අපි දැන ගන්න ඕනෑ.

මේ අවස්ථාවේදී ගරු අගමැතිතුමාට මතක් කර දිය යුතු කාරණයක් තිබෙනවා. අපගේ මේ දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රියාත්මක කිරීමේදී යම් යම් දුෂ්කරතාවයන් කීපයක් අපට පෙනී යනවා. පළාතේ දිසාපතිතුමා නැත්නම් දිසා ලේකම්තුමා ඒ දිස්ත්‍රික් සභාවල ලේකම් හැටියට කටයුතු කරනවා. ඒ වගේම නියෝජ්‍ය ලේකම්වරු පත් කර සිටිනවා. පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාත්, වෙනත් දෙපාර්තමේන්තුවක ප්‍රධානියෙකුත් නියෝජ්‍ය ලේකම්වරුන් හැටියට පත් කරගෙන සිටිනවා. අපේ කෑගල්ල දිස්ත්‍රික් සංවර්ධන සභාවේ නියෝජ්‍ය ලේකම්වරයෙකු හැටියට ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂවරයෙකු පත් කරගෙන සිටිනවා. ඒ නිලධාරි මහත්මයා අයත් දෙපාර්තමේන්තුවේ, එනම් ග්‍රාම සංවර්ධන අංශයේත් වැඩ කරමින්ම ඉතාම වෙහෙස මහන්සියෙන් දිස්ත්‍රික් සංවර්ධන සභාවෙත් වැඩ කරනවා. ඒ මහත්මයාට වැඩ රාශියක්ම තිබෙන නිසා සමහර විට දිස්ත්‍රික් සංවර්ධන සභාවේ වැඩ ටික ටික අතපසු වෙන බවක් අපට පෙනී යනවා. අන්න ඒ කාරණය නිසා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න සතුටුයි, අපගේ සංවර්ධන සභාවල වැඩකටයුතු සඳහා විශේෂයෙන්ම වෙනම නියෝජ්‍ය ලේකම්වරයෙකු පත් කරන්නට කටයුතු කරන්නය කියා.

අපි පත්‍ර මාර්ගයෙන් දැක්කා, අපේ ගරු අගමැතිතුමා ග්‍රාමෝදය මණ්ඩලවල සභාපතිවරුන් සාමදාන විනිශ්චයකාරවරුන් හැටියට පත් කිරීමට අදහස් කර තිබෙන බව. මම හිතනවා ඒ අදහස ඉතාමත් උචිතයි කියා. ග්‍රාමෝදය මණ්ඩලවලට පත්වී සිටින ඒ සභාපතිවරුන් ඉතාම හොඳින් කටයුතු කරන, ගමේ පිළිගැනීමක් තිබෙන, ගමේ යම් යම් ස්වේච්ඡා සමිතිවල සභාපතිවරුන් හැටියට කාලයක් කටයුතු කර තිබෙන උදවියයි. ඒ නිසා ඒ අයගේ ඒ වැඩකටයුතු තව තවත් උද්යෝගිමත්ව කරගෙන යාම සඳහා ඒ අය සාමදාන විනිශ්චයකාරවරුන් හැටියට පත් කිරීමට පියවර ගන්නවා නම් ඉතා හොඳය කියන අදහස මමත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න සතුටුයි. ඒ වගේම අපි කල්පනා කළ යුතුව තිබෙනවා, අපගේ මේ ග්‍රාමෝදය මණ්ඩලවලට පළමුවෙන්ම පත් වුණු ඒ සභාපතිවරුන් සමහර විට හරියාකාර ඡන්දයකින් පත්වුණ අය හැටියට පිළි නොගත්තත්, ඉදිරියේදී මේ ග්‍රාමෝදය මණ්ඩලවලට පත්වෙන ඒ සභාපතිවරුන් අපේ ගම්වල තිබෙන ඒ ස්වේච්ඡා සමිතිවලින් පත් වෙන නිසාම, ඒ ස්වේච්ඡා සමිතිවල වැඩ කටයුතුවලත් මීට වඩා උද්යෝගයක් ඇති වෙන්න පුළුවන්. ඒ වගේම ඒ සමිතිවල සාමාජිකයන් ඉතාම උනන්දුවෙන් තම තමන්ගේ ඡන්දය පාවිච්චි කර ඉතාම සුදුසු අය සංවර්ධන සභාවලට පත් කර එවනවාට කිසිම අනුමානයක් නැහැ. ඒ නිසා, මේ ග්‍රාමෝදය මණ්ඩල ක්‍රමය මේ රටේ මෙතෙක් කල් පැවැති ගම් සභා ක්‍රමයටත්, සුළු නගර සභා ක්‍රමයටත් වඩා ඉතාමත් හොඳ ක්‍රමයක් බව ප්‍රකාශ කරමින්, අපේ ගරු අග්‍රාමාත්‍යතුමා මේ ග්‍රාමෝදය මණ්ඩල සංකල්පයෙන් මේ රටට බලාපොරොත්තු වන සේවය ඒ ආකාරයෙන්ම ඉටු වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

අ. භා. 5.25

**ජේ. එල්. සිරිසේන මහතා (සමාජ සේවා නියෝජ්‍ය ඇමතිතුමා)**

*(திரு. ஜே. எல். சிறிசேன—சமூக சேவைகள் பிரதி அமைச்சர்)*

**(Mr. J. L. Sirisena—Deputy Minister of Social Services)**

ගරු කථානායකතුමනි, මෙය කාලෝචිත පනතක්. මාස 13 ක පමණ කාලයක් තුළ ලැබූ අත්දැකීම් තුළින් මේ සංශෝධන පනත ඉදිරිපත් කිරීම ගැන අපි කවුරුත් ගරු අග්‍රාමාත්‍යතුමාට ස්තුතිවන්ත විය යුතුයි. මේ කාරණය ගැන වචන කීපයක් කියන්නට මත්තෙන් මම කරුණක් කියන්න ඕනෑ. ගම්සභා මැතිවරණය ගැනත්, ගම්සභා සම්මේලනය ගැනත් කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) කථා කළා. 1968 න් පස්සේ මේ රටේ ගම්සභා මැතිවරණ තිබ්බේ නැහැ. අවුරුදු 9 ක් තිස්සේ ගම්සභා මැතිවරණ නොතබා, 1977 වන විට ගම්සභා එකින් එක අවලංගු කළා. කිසිම වරදක් නොකර තිබුණු ගම්සභාවල එක්සත් ජාතික පක්ෂයට හිතවත් සභාපතිවරුන් අස් කර ගන්නට බැරි වුණු විට ඒ ගම්සභා විසුරුවා හැරියා. ඒ විධියෙන් මහජන අයිතිවාසිකම් විශාල වශයෙන් පැහැර ගත් යුගයක් වුණා, 1968 සිට 1977 දක්වා කාලය.

ඒ නිසා, මේ ගම්සභා මැතිවරණ ඇති කරන්නය, එහෙම නැත්නම් ග්‍රාමෝදය මණ්ඩලයට ඡන්දයකින් නියෝජිතයන් පත් කරන්නය කියා ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් කරන ඉල්ලීම විහිළුවක්. ඒ අයට ඒ ඉල්ලීම කරන්නට අයිතියක් නැහැ.

ගම්සභා සම්මේලනය ගැන මම වචනයක් දෙකක් කියන්න කැමතියි, ඒ ගැන කොත්මලේ ගරු මන්ත්‍රීතුමා මතක් කළ නිසා. මම එයින් කාටවත් අපහාසයක්, අවනම්බුවක් කරන්න අදහස් කරනනේ නැහැ. ඇත්ත සිද්ධිය ප්‍රකාශ කරනවා පමණයි. 1951 දී මම දුම්මලසූරිය ගම්සභාවේ සභාපති ධුරයට පත් වෙලා මාස කීපයකට පසු ගම්සභා සම්මේලනය පැවැත්වුණා. ඒ සම්මේලනයේ සභාපති ධුරය එවකට දැරුවේ අභාවප්‍රාප්ත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතායි. එදා මේ ගම්සභා සම්මේලනයේ සභාපති ධුරය දැරුවේ ගම්සභාපති වරයෙක්වත් ගම්සභාවක නියෝජිතයෙක්වත් නොවුණු නිසා. මේ සම්මේලනයේ සභාපති ධුරය



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. එල්. සිරිසේන මහතා]

හා අනෙක් නිලතල දැරිය යුත්තේ ගම්සභා නියෝජිතයන් අතරින් තෝරා ගනු ලබන සභිකයෙක් පමණක් යයි මම මේ සභා වාරයේදී කල් දීමක් ඇතිව යෝජනාවක් ඉදිරිපත් කළා. එදා මේ යෝජනාව ස්ථිර කළේ එවක දෙහිවල ගල්කිස්ස ගම් සභාවේ සභාපතිව සිටි චන්ද්‍ර ගුණසේකර මහත්මයායි. ලංකා සමසමාජ පක්ෂයේ මහාත්මයෙක්. මම යෝජනාව ඉදිරිපත් කරන විට දහවල් 12.15 පමණ වී තිබුණා. ඒ වේලාවේදී එදා මෙහි සභාපති ධුරය දැරූ අභාවප්‍රාප්ත බණ්ඩාරනායක මහතා දවල් කෑමට රැස්වීම විසුරුවා හැරියා. හැන්දෑවරුවේ රැස්වීම පැවැත්වුණේ නැහැ. හැමදාම සිරිතක්ව තිබුණේ ඒකයි. ඒක නිකම්ම ලිස්සා යනවා. මගේ යෝජනාව ස්ථිර වෙලා සති දෙකකට පස්සෙ මොකක්ද සිදු වුණේ ? වැඩි ඡන්දයෙන් සම්මත වූ ඒ යෝජනාව ක්‍රියාත්මක කරනවා වෙනුවට ඒ සම්මේලනයේ කාරක සභාවට මා පත් කළා. එදා මෙදා තුර ඒ යෝජනාව ක්‍රියාත්මක වුණේ නැහැ. මෙන්න මෙහෙමයි එදා ගම් සභා සම්මේලනය පැවැත්වුණේ.

මම මේ කාරණය ගැන කථා කරන්න හිතා හිටියේ නැහැ. මේ ගැන කරුණු කී නිසා මට මේක මතක් වුණා. මේ සම්මේලනයේ නිලතල සඳහා එදා ඒ විධියටයි නියෝජිතයන් පත් කෙරුණේ.

මේ ග්‍රාමෝදය මණ්ඩල ඇති කිරීමෙන් කරුණු දෙකක් ඉෂ්ට කර තිබෙනවා. ඉන් එකක් මෙයයි: 1977 මැතිවරණයට පෙර අපි ප්‍රකාශයක් කළා, ගම් මට්ටමෙන් ජනතාව පාලනයට සම්බන්ධ කර ගන්නා බවට ගම් මට්ටමෙන් ජනතාව පාලනයට සම්බන්ධ කර ගන්නට නම් ඒ සඳහා ඉතාම සුදුසු ග්‍රාමෝදය මණ්ඩල යයි. ග්‍රාමෝදය මණ්ඩලවලටත් සාමාජිකයින් ඡන්දයකින් පත් කරන්නට ගියොත් ගම්වල ජනතාව අතර විශාල වශයෙන් වාද භේද ඇති වෙනවා. ගම්සභා ක්‍රමය පැවති මුල් කාලයේ අවුරුදු 3 කට වරක් ඡන්දය පැවැත්තුවා. පසුව අවුරුදු 4 කට වරක් ඡන්දය පැවැත්තුවා. මේ සෑම අවස්ථාවකදීම ගමේ කෝලහල අසමගිකම් ආදිය ඇතිවුණා. එක වරක් ඡන්දය කරලා තවත් අවුරුදු හතරක් ගිහින් නැවත ඡන්දයක් එන තුරුත් ගමේ දෙපක්ෂයක් අතර විශාල වශයෙන් භේද තිබුණා. සමහරවිට නෑ මිත්‍රකම් පවා නැතිවෙලා ගමේ දියුණුවට බොහෝ බාධා ඇතිවුණා. නමුත් දැන් ග්‍රාමෝදය මණ්ඩල ක්‍රමය මගින් ඒ අසමාදානය නැතිවෙලා තිබෙනවා. කොහොම වුනත් ග්‍රාමෝදය මණ්ඩලවලට නියෝජිතයන් නැත්නම් සභාපතිවරුන් තේරීම සම්බන්ධයෙන් මාවනැල්ල ගරු මන්ත්‍රීතුමා (චන්ද්‍ර රණතුංග මහතා) ඉදිරිපත් කළ අදහසට මමත් එකඟ වෙනවා. මේවා තවත් ක්‍රමවත් කළ යුතුයි. ඒ සමිතිවල සභාපති තනතුරු දීම ක්‍රමවත් කළ යුතුයි. ඒවා ලියාපදිංචි කිරීම හෝ ඒ සමිතිවලට කාල සීමාවක් නියම කිරීම හෝ කළ යුතුයි. එහෙම නැත්නම් සමහරවිට හතු පිපෙන්නාක් මෙන් සමිති ආරම්භ කර සභාපති තනතුරු ලබා ගන්නට උත්සාහ කරනවාට සැකයක් නැහැ. මේවා අපේ රටේ පමණක් නොවෙයි. කොයි රටේත් මහජනතාව අතර සිදුවෙන දේවල්. ඒ නිසා මා හිතනවා, ග්‍රාමෝදය මණ්ඩල තවත් ක්‍රමවත් කිරීම ඉතාමත්ම උචිතය කියා. ඡන්දයකින් මේ සාමාජිකයින් තෝරන්නට ගියොත් නැවතත් අවි අර වාද භේද විශාල වශයෙන් ගම්වල ඇතිකර ගමේ දියුණුවට බාධා ඇති කරනවා.

මගේ ඡන්ද කොට්ඨාශයේ සංවර්ධන සභාවට වසරක් පිරීම නිමිත්තෙන් ගුම් විස්සක නිහක පමණ ශ්‍රමදාන වැඩ සෑම කොට්ඨාශයකම අයගේ එකමුතුවෙන් කළා. ඒ සඳහා සතයක්වත් වියදම් වුණේ නැහැ. තේ පැන් සංග්‍රහය පවා ගමේම අය එකතුවෙලා කළා. කැවුම්, කිරිබත්, කෙසෙල්ගෙඩි ආදිය සකස් කර සපයා තිබුණා. ඒ මගින් අපි විශාල ව්‍යාපාරයක් කළා. රුපියල් ලක්ෂයක, ලක්ෂ එකහමාරක පමණ වැඩ කෙරුණා. පාරවල්, ඇලවේලි ආදිය සකස් කළා. ගම්සභා ක්‍රමය තිබුණා නම් ඒ විධියේ දෙයක් කවදාවත් වෙන්නෙ නැහැ. ඒනිසා ග්‍රාමෝදය මණ්ඩල මේ රටට ඉතාමත්ම උචිතයි. ඒවා තව ක්‍රමවත් කරන එකයි, අපට තිබෙන්නේ. මම ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒවා තවත් හොඳට සකස් කර ක්‍රමවත් කරන්නය කියා.

මීළඟට මම කියන්නට ඕනෑ, මේ සංශෝධන පනතින් කරන්නට බලාපොරොත්තු වන විධායක කමිටුවේ බලතල පැවරීම ගැන. ඒක ඉතාමත්ම වැදගත් දෙයක්. අද තිබෙන තත්ත්වය උඩ විධායක කමිටුවේ බලතල කාටවත් පවරන්න බැහැ. බොහෝ අවස්ථාවලදී විධායක කමිටුවේ සභාපතිකම දරන්නේ දිසා ඇමතිතුමයි. දිසා ඇමතිතුමා නැති අවස්ථාවක ඒ බලතල ක්‍රියාත්මක කරන්න බැහැ; නියෝග ක්‍රියාත්මක කරන්න බැහැ. ඒ නිසා සමහරවිට අපේ වැඩ ප්‍රමාද වෙනවා. සමහර ගරු මන්ත්‍රීවරු කිව්වා, මේ වැඩ ප්‍රමාද වෙනවා කියා. එසේ ප්‍රමාද වෙන්නට හේතුවක් තමයි, විධායක මණ්ඩලයේ බලතල පැවරීමට ආඥා පනතේ අවස්ථාවක් සලසා නොතිබීම. අන්න ඒ තත්ත්වය මේ සංශෝධනයෙන් පිරිසිදු වෙනවා. ඒ නිසා විධායක මණ්ඩලයේ බලතල පවරන්න පුළුවන්. ඊළඟ සංශෝධනයෙන් පුළුවන් දිසා ලේකම්ගේ බලතල පවරන්න. මේ පැවරීම් තුළින් අපේ සංවර්ධන වැඩ කටයුතු මීට වඩා ඉක්මනට කරන්න අවස්ථාව ලැබෙනවා. අන්න ඒකයි, මේ සංශෝධනවල තිබෙන වැදගත්කම.

අනෙක් සංශෝධනය තමයි, දැනට වියදම් කරන්නට පුළුවන් රුපියල් පන්දාහේ සීමාව රුපියල් පනස්දාහ දක්වා වැඩිකිරීම. ඒක ඉතාම වැදගත් දෙයක්. ඒ නිසා අර උප කාර්යාලවල වැඩ කටයුතු මීට වඩා දක්ෂ ලෙස ඉක්මණින් කරන්න පුළුවන් වෙනවා. මේ සංශෝධනවල තිබෙන වැදගත්කම ඒකයි. අපි පනත ගැන කථා කිරීමේ දී පනතේ තිබෙන සංශෝධන ගැනයි කථා කරන්න ඕනෑ. ග්‍රාමෝදය මණ්ඩලවලත්, සංවර්ධන සභාවලත් දියුණුව ඇතිවන විධියට, මහජනයාට ප්‍රයෝජනවත් වන විධියට කටයුතු කරන්නට අවස්ථාව මේ සංශෝධන පනතින් නිතැතින්ම ලැබෙන බව අපි සතුටින් ප්‍රකාශ කරන්නට ඕනෑ.

ග්‍රාමෝදය මණ්ඩලවල සභාපතිවරුන්, සාමාජික මහතුන් හඳුනා ගන්නට බැරිය කියා අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කිව්වා. මම කණගාටුවෙනවා, ඒ ප්‍රකාශය ගැන. තමන්ගේ ගමේ, තමන්ගේ ඡන්ද කොට්ඨාශයේ තිබෙන සමිති සමාගම් සහ ඒවායේ වැඩ කරන උදවිය ගැන සෑහෙන දැනීමක් තිබෙන්නට ඕනෑ, පළාතේ මන්ත්‍රීවරයාට. නැත්නම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමන්ගේ රාජකාරී කටයුතු කරන්න අමාරු වෙනවා. ඒ නිසා අමුතු හැඟීමක්, අමුතු බැජ් එකක්, අමුතු මාලයක් ග්‍රාමෝදය මණ්ඩලයේ සභාපතිට නොදුන්නාට ඔහුව දැන හඳුනා ගන්නට ඕනෑ තරම් අවස්ථාව පළාතේ මන්ත්‍රීවරයාට ලැබෙනවා. ග්‍රාමෝදය මණ්ඩලවල නියෝජිතයන් එනවා, ප්‍රාදේශීය මණ්ඩලවල රැස්වීම්වලට, මන්ත්‍රීතුමාත් ඒ ප්‍රාදේශීය මණ්ඩල රැස්වීම්වලට සහභාගි වෙනවා නම් එක මාසයකින්, එහෙම නැත්නම් එක රැස්වීමකින්ම මන්ත්‍රීතුමාට පුළුවන්කම ලැබෙනවා, ඒ හැම දෙනාම හඳුනා ගන්න. එම නිසා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් හුදෙක් මේ විවාදයෙන් දිනන්න, මේ පනතේ තිබෙන දුර්වලකම් හුවා දැක්වීම වැරදි බව පෙන්වා දෙන්න ඕනෑ.

මේ රටේ දියුණුව සඳහා, මේ ග්‍රාමෝදය මණ්ඩල ඇති කර තිබෙන්නේ මේ රටේ සාමයට උචිත පරිදියි, අපේ ජනතාවගේ සංස්කෘතියට ගැළපෙන ආකාරයටයි. මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන විටයි, මෙහි තිබෙන අඩුපාඩුකම් පෙනෙන්නේ. එම නිසා ඒ තිබෙන අඩුපාඩුකම් මොනවාදැයි සොයා බලා, ඒ අඩුපාඩුත් සකස් කර ගෙන මේ මණ්ඩල දියුණු කර ගන්නේ කොහොමද කියා පෙන්නා දීමයි, අපේ යුතුකම වන්නේ. අවසාන වශයෙන්, මේ ග්‍රාමෝදය මණ්ඩල මාගීයෙන් මේ රටේ සමගියත්, සංවර්ධනයත් ඇති කිරීමට අපට පුළුවන් වේවායි බලාපොරොත්තු වෙමින්, ආශිංසනය කරමින්, මේ වැඩ පිළිවෙළ දියත් කිරීම ගැන ගරු අගමැතිතුමාට ස්තුති වන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 6.36

**ආර්. ප්‍රේමදාස මහතා (අග්‍රාමාත්‍යතුමා, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා, මහාමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**

*(திரு. ஆர். பிரேமதாச—பிரதம அமைச்சரும் உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண அமைச்சரும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)*

**(Mr. R. Premadasa—Prime Minister, Minister of Local Government, Housing and Construction, Minister of Highways, and Leader of the House of Parliament)**

නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මන්ත්‍රීවරුන්—විශේෂයෙන්ම අද අප විවේචනයට ලක් කරමින් කථා කළ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්—මේ පනත් කෙටුම්පත කියවා මේ විවාදයට සහභාගි වුණා නම් මා ඉතාමත් සතුටු වෙනවා. ඇතැම් මන්ත්‍රීවරුන් මේ විවාදයට සහභාගි වුණේ මේ පනත් කෙටුම්පතවත් කියවන්නේ නැතිව බව බොහොම කනගාටුවෙන් නමුත් පෙන්නා දෙන්න සිදු වී තිබෙනවා. එක මන්ත්‍රීවරයෙක්, මීට කලින් සම්මත කෙරුණු පනතක් අල්ලා ගෙන කථා කරගෙන යන අතරතුර මට සිද්ධ වුණා, ඒ බව පෙන්නා දෙන්න.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) සාමාන්‍යයෙන් යමක් කියවා බලා කථා කරන කෙනෙක්. නමුත් මා හිතන්නේ නැහැ, එතුමා මේ සංශෝධන පනත් කෙටුම්පත කියවා තිබෙනවාය කියා. ඒ ගැන එතුමාට මා දොස් කියන්නේ නැහැ. මේ දවස්වල එතුමාටත් වැඩ කටයුතු ටිකක් වැඩිය තිබෙන්න ඇති. පසුගිය වාරයේදී මා කීවා, එතුමාගේ වැඩ පිළිවෙළ මොකක්ද කියා. දැන් ඒ වැඩ පිළිවෙළේ අන්තිම කෙළවරට කිට්ටු වෙන්න ඇවිත් තිබෙනවා.

ඊට පස්සේ කථා කළ අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් මේ පනත් කෙටුම්පත ගැන අවබෝධයක් ඇතිව තමුන්නාන්සේලාට කරුණු ඉදිරිපත් කළා. බිංගිරියේ මන්ත්‍රීවර නියෝජ්‍ය සමාජ සේවා ඇමතිතුමා පෙන්නා දුන්නා, මේ පනත යටතේ වෙනස්කම් කීපයක් ඇති කෙරෙනවාය කියා. අත්තනගල්ලේ මන්ත්‍රීතුමා කී බල තලත්, ඒ වගේම මුදල් වැය කිරීම් ආදී කාරණාත් සම්බන්ධයෙන් එතුමා පෙන්නා දුන්නා.

ඒ වගේම අපේ ආණ්ඩු පක්ෂයේ තවත් ඉන්නවා, හොඳ පළපුරුදු මන්ත්‍රීවරුන්. එතුමන්ලාත් කීප දෙනෙකුම කථා කරන්නයි, සිටියේ. නමුත් කාල—වේලා මදි වී තිබෙන නිසා, තවත් වැඩ කටයුතු රාශියක් කරන්න අපට තිබෙන නිසා මා එතුමන්ලාගෙන් ඉල්ලා සිටියා, මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න අපට අවකාශ දෙන්නය කියා.

අපේ ගරු මන්ත්‍රීවරුන් අතර ඉන්නවා, ගම් සභාවල, සුළු නගර සභාවල, මහ නගර සභාවල සේවය කර හොඳට අත්දැකීම් ඇති උදවිය. එතුමන්ලා දන්නවා, අප මේ සකස් කරගෙන යන වැඩ පිළිවෙළින් මොන පරමාර්ථයක්ද, ඉෂ්ට කර ගන්න යන්නේ කියා. එම නිසා මා සන්තෝෂ වෙනවා, එවැනි මන්ත්‍රීවරුන් පිරිසක් සමග මේ ආකල්පය ක්‍රියාත්මක කරන්න පුළුවන් වීම ගැන.

හොරණ මන්ත්‍රීවර කළුතර දිසා ඇමතිතුමා, ග්‍රාමෝදය අරමුදල ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී අප සියලු දෙනාම හමුවේ ඉතා වටිනා විග්‍රහයක් කළා. තමා මේ ග්‍රාමෝදය මණ්ඩල වැඩ පිළිවෙළ පාවිච්චි කරන ආකාරය එතුමා පෙන්වා දුන්නා. ඇත්ත වශයෙන්ම තමන්ට විමධ්‍යගත අයවැයෙන් ලැබෙන රුපියල් ලක්ෂ 25 තම ඡන්ද කොට්ඨාසය සම්බන්ධයෙන් වියදම් කරන්න ඉතාම හොඳ ක්‍රමය මේ ග්‍රාමෝදය මණ්ඩල සම්බන්ධ කරගෙන ඒ වැඩ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමයි.

මාවනැල්ලේ මන්ත්‍රීතුමා (චන්ද්‍ර රණතුංග මහතා) කීවා, එක්තරා ව්‍යාපෘතියකට වියදම් කරන්න ගිය මුදල් ප්‍රමාණයත්, ග්‍රාමෝදය මණ්ඩලය සම්බන්ධ කර ගෙන එය ක්‍රියාත්මක කිරීමේදී ලැබුණු ඵල-ප්‍රයෝජනත්.

ග්‍රාමෝදය මණ්ඩල අප ඇති කළේ ගමේ මට්ටමින් පුළුවන් තරම් දේශපාලන වාද-භේද තුනී කරන්නයි; ඒ කවුරුත් මේ වැඩ පිළිවෙළට සහභාගි කර ගන්නයි. මන්ත්‍රීවරුන් හුඟක් මහන්සි වී නොයෙක් කාර්යයන් සඳහා මුදල් හොයා ගෙන ඒ වැඩ කටයුතු කරනවා. නමුත් බොහෝ විට ගමේ උදවිය එහි අගය තේරුම් ගන්නේ නැති බව තමුන්නාන්සේලා සියලු දෙනාම පිළිගන්නවා ඇති. එහෙම වෙන්නේ ගමේ උදවිය සමග සාකච්ඡා කර, ගමට අවශ්‍ය දේ අපි නොකරන නිසයි. අන්න ඒ තත්ත්වය නැති කර ගන්න පුළුවනි, ග්‍රාමෝදය මණ්ඩල මේ කාර්යයන්ට සම්බන්ධ කර ගත්තොත් ඒවා සම්බන්ධ කරගෙන වැඩ කරනවා, අපේ හුඟක් මන්ත්‍රීවරු. ඒකෙන් හුඟක් අත්දැකීම් ලැබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

මේ අපේ විමධ්‍යගත අයවැයෙන් මුදල් සැහෙන ප්‍රමාණයක් අපට ඉතිරි කරවා ගන්නට වැඩි ඵලදායි කරවා ගන්නට අපට පුළුවන්, ග්‍රාම සේවක කොට්ඨාශයකට එක බැගින් තිබෙන අපේ ග්‍රාමෝදය මණ්ඩල සම්බන්ධ කර ගත්තොත්. මන්ත්‍රීතුමා ඒ විධියට කල්පනා කර වැඩ කළොත් මුදල් හදල් ප්‍රශ්නය මතු වෙන්නේ නැහැ. තමන්ට දේශපාලන වශයෙනුත් ප්‍රයෝජනයක් අත් පත් වෙනවා, තිබුණු වාද භේද දුරුවෙලා තමන් කරන සේවය අගය කර ජනතාව එකට එකතු වී වැඩ කිරීමෙන්. ගිය මාසයේ සම්මත කළ ග්‍රාමෝදය අරමුදල මගින් ආධාර කරන්නට අපි බලාපොරොත්තු වෙනව. හැබැයි නිකම් සල්ලි ඉල්ලා ගෙන නාස්ති කරන ග්‍රාමෝදය මණ්ඩලවලට නොවෙයි. ග්‍රාමෝදය මණ්ඩලයක් පිහිටුවා ගෙන "දැන් ඉතින් සල්ලි දෙන්න අපි වියදම් කරන්නම්" කියන අයට අපි උදව් කරන්නේ නැහැ. අපට පෙනුණොත් ඒ ග්‍රාමෝදය මණ්ඩලයත් ලැහැස්තියි තමන්ගේ සේවය දෙන්නට, වැඩ කරන්නට, ගම හදා ගන්නට කියා අපි එවැනි ආයතනවලට උදව් කරනවා. හරියට මන්ත්‍රීතුමා තමන් ඒ ග්‍රාමෝදය මණ්ඩලයේ වැඩ කටයුතුවලට පැහැදී උදව් කරනවා වගේ.

මෙය අලුත් ආකල්පයක්. මේ ආකල්පයට විරුද්ධ අය කවදාවත් මෙය තහවුරු කරන්නට උදව් කරන්නේ නැහැ. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු මේ වැඩ පිළිවෙලට විරුද්ධයි. ඔවුන් දැනුත් දිවුරුම් දෙනවා අවස්ථාවක් ලැබුණොත් මේ වැඩ පිළිවෙල වෙනස් කරනවා කියා. එවැනි අයගෙන් කවදාවත් බැහැ මේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්නට උපකාර ලබා ගන්නට. ඒ නිසා අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවේගම මහතා) හා කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) මෙය විවේචනය කිරීම ගැන මම පුදුම වන්නේ නැහැ.

නිල බලයෙන් එතුමන්ලා සංවර්ධන සභාවට පත් වී සිටිනවා. එහෙත් සංවර්ධන සභාවට එන්නේ නැහැ. ඉතින් කොහොමද සංවර්ධන සභා මාර්ගයෙන් අද ක්‍රියාත්මක වන මේ වැඩ පිළිවෙල ගැන අගැයීමක් එතුමන්ලා තුළ ඇති වන්නේ. මම පිළිගන්නවා, කල වානේ ගරු මන්ත්‍රීතුමාගේ ආකල්පය. එතුමන්ලා තුළ මේ වැඩ පිළිවෙළ ගැන කිසි විශ්වාසයක් නැහැ. ඒක දේශපාලන වශයෙනුත් එතුමන්ලා පිළිගෙන තිබෙන දර්ශනයක්. මිනිසුන් ගැන විශ්වාසයක් නැහැ. එහෙත් අපේ විශ්වාසයක් තිබෙනවා, අපේ ජනතාව ගැන. අපි මැතිවරණයකින් දිනුවත් පැරදුණත් අපේ ඒ විශ්වාසය අපි අත්හැර නැහැ. තමුන්නාන්සේ දන්නවා අපේ පක්ෂය අන්ත පරාජයට පත් වූ අවස්ථා තිබුණු බව, 1956 දීත් ඊට පසුව 1960 දී හා 1970 දීත්. නමුත් අපි ජනතාව සමග ඇති විශ්වාසය අත්හලේ නැහැ. අපි ඉගෙන ගත යුතු පාඩම් ඉගෙනගෙන අපි ඒ සංකල්පය ඉදිරියටම ගෙන ගියා. ඒ නිසා තමයි, ඒ ඓතිහාසික ජයග්‍රහණය අපට 1977 දී ලැබුණේ. එදා අපි වුණු පොරොන්දුවක් තමයි, පරිපාලන තන්ත්‍රයට ජනතාව සහභාගි කරවා ගන්නවා කියන එක. දැන් අපි හිතනවා, නොයෙක් නොයෙක් ක්‍රම වලින් ඒ වැඩේ කරන්නට.

මම කියන්නේ නැහැ, මේ වැඩ පිළිවෙල සියයට සියයක්ම හරියි කියා. නමුත් අත්දැකීම් අනුව විටින් විට මේ වැඩ පිළිවෙල සංශෝධනය කරමින් අපි මේ වැඩ පිළිවෙළින් බලාපොරොත්තු වන්නේ අවසානයේදී ගමේ හැම කටයුත්තක්ම ගමේ ජනතාව ලවාම ඒ නායකත්වයෙන් ඒ හැඟීම් අනුව ක්‍රියාත්මක කරන යුගයක් කර ගෙන යන්නයි. මෙය ආරම්භයක් පමණයි.

මෙයට අවුරුදු 1 1/2 කට ඉස්සරවෙලා ආරම්භ කළ මේ සංවර්ධන සභා ක්‍රමය මම විටින් විට මේ සභාවට ඇවිත් අත්දැකීම් අනුව මේ ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් අනුව සංවර්ධන සභාවල අදහස් අනුව නිරීක්ෂකයින්ගේ අදහස් අනුව ජනතාවගේ අදහස් අනුව විටින්විට සංශෝධනය කරමින් අවසානයේ අපේ පරමාර්ථය ගමේ පාර්ලිමේන්තුවක් ඇති කිරීම බව මම තමුන්නාන්සේට ප්‍රකාශ කරන්න කැමතියි. යම් දවසක මම සතුටු වන්නේ ගමේ ජනාධිපති කෙනෙක් ගමේ අගමැති කෙනෙක් ගමේ කැබිනට් මණ්ඩලයක් ගමේ පාර්ලිමේන්තුවක් ඇති වූ දවසටයි. එදාට තමයි, අපේ බලාපොරොත්තු ඉටු වුණා කියා මම සතුටු වන්නේ. ඒ තැනට මේක ක්‍රමානුකූලව ගෙන යන්නටයි අප බලාපොරොත්තු වෙන්නෙ. අපට ඕනෑ කරන්නෙ, ජනතාව විසින් තෝරා පත් කෙරෙන රජය මුළු රටටම බලපාන අවශ්‍යතාවන් සපුරාලන අතර ගමේ ජනතාව තමන්ගේ බල ප්‍රදේශ තුළ තමන්ගේ ඕනෑ එපාකම් තමන්ගේ ප්‍රමුඛත්වය අනුව ක්‍රියාත්මක කරන යුගයක් කරා මේ රට ගෙන යන්නටයි ඒක තමයි අපේ පරමාර්ථය. දැන් මේ පනතින් කරන්නෙත් ඒක එන්ට එන්ටම ව්‍යාප්ත කිරීමයි.

කලවානේ මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවේගම මහතා) මේ ප්‍රශ්නයට එක පාරටම බැස්සෙ ජනාධිපති මැතිවරණය ඔස්සෙයි. අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමා ඊයෙ-පෙරේද අනුරාධපුරයේදි කළ ප්‍රකාශයක් මෙතැනදි එතුමා ඇදල ගත්තා. මගේ හිතේ ඒකට හොඳ පිළිතුරක් කොළඹ දිසා ඇමතිතුමාගෙන් එතුමාට ලැබුණා. දිසා ඇමතිතුමා කිව්වා, අපේ පක්ෂය සර්වජන ඡන්දය කෙරෙහි විශ්වාසය තබන පක්ෂයක්; මේ රටේ ජනතාව තමයි යම් පක්ෂයකට ජය ලබා දෙන්නෙත්, යම් පක්ෂයක් පරාජය කරන්නෙත් කියලා. යම් පක්ෂයක් ඇති කරන්නෙත්, නැති කරන්නෙත්, අපි නොවෙයි. හැබැයි 1977 මැතිවරණයෙ ප්‍රතිඵල විග්‍රහ කර බැලුවාම, ජනතාව අපට දී තිබෙනව බලයක්, 'උඹලට ඕනෑ එකක් කරපන්' කියල. ඒක අපිට බොහොම ලෙහෙසියෙන් කරන්නට පුළුවන්කම තිබුණා, කොල්වින්. ආර්. ද සිල්වා මහතාට පින් සිදු වෙන්න ඇති කළ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්. මොකද? ඒ ව්‍යවස්ථාවෙ කියා තිබෙනව, තුනෙන් දෙකක බලයක් තිබෙන පාර්ලිමේන්තුවකට ඕනෑ එකක් කරන්න පුළුවන් කියල. දිග අරින්නත් පුළුවනි; අකුලන්නත් පුළුවනි.

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තමුන්නාන්සෙ කියවල බැලුවොත් පෙනේවි, යම් පිරිසකට තුනෙන් දෙකක බලයක් තිබුණොත් ඒ අයට සදාකාලිකව බලයෙ ඉන්න පුළුවන් බව. මම ගිය පාරත් ඒක කිව්ව. වගන්ති කීපයයි වෙනස් කරන්නට තිබෙන්නෙ. එතකොට—1977 පත් වෙන කොට—තුනෙන්-දෙකක් නොවෙයි, අපිට හයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

-පහක් ලැබුණා. කලවානෙ මන්ත්‍රීතුමා දන්නව, 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවට පුළුවන් කම තිබුණා, පාර්ලිමේන්තුවෙ ආයුෂ කාලය දික් කරන්නට. නමුත් මේ පාර්ලිමේන්තුවට, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඒක කරන්න බැහැ ; ජනමත විචාරණයකට යන්න ඕනැ. නමුත් 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඒක කරන්න පුළුවනි. අපට තිබුණෙ වගන්තියක් වෙනස් කරන්නටයි. අද මේ පාර්ලිමේන්තුවට පත් වී සිටින්නාවූ මන්ත්‍රීවරුන්ගෙ නම් ටික දමා, මේ ගොල්ලන් යම් තාක් කල් ජීවතුන් අතර සිටිනවා නම් ඒ හැම දෙනාම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්. මේ එක් එක් කෙනාගේ ඇවෑමෙන් ඔවුන්ගේ උරුමක්කාර පොල්මෑකාර උදවියට ලැබිය යුතුයි. මේක කාටද නවත්වන්න පුළුවන් ? ඒක ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා ඇති කළ—බණ්ඩාරනායක මහත්මියගෙ ආණ්ඩුවෙන් ඇති කළ—1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතෙ කරන්න පුළුවන්. අපි ඒ ව්‍යවස්ථාව යටතෙ පත් වෙලත්, ඒක කළේ නැහැ. අපි මොකද කළේ ? අපේ ව්‍යවස්ථාවට අපි ඇතුළත් කළා තුනෙන්-දෙකක් නොවෙයි, හයෙන්-පහක් නොවෙයි, හයෙන්-හයක් තිබුණත්, පාර්ලිමේන්තුවට නම් පාර්ලිමේන්තුවෙ ආයුෂ කාලය දික් කරන්න බැහැ ; ජනාධිපති ධුර කාලය දික් කරන්න බැහැ කියල.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේවා තමයි ජනතාවට වසන් කරන දේවල්. අර කොළේ වහ ලද—මොකද්ද ඒකට කියන්නෙ—කොලේ වහල ගහන වාය කියන්නෙ මේවාටයි. ඒ මන්ත්‍රීතුමා එක පාරටම ජනාධිපතිතුමා අනුරාධපුරයෙදී කළ කථාවක් අරගෙන වෙනත් අර්ථ කථනයක යෙදෙන්න පටන් ගත්ත. එතුමාගේ මාමන්ඩියත් මේ මොහොත වන කොට ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙලා ඉන්න අපේක්ෂකයකුය කියනව. ඊයෙ-පෙරේද එතුමා මොකක්ද ජනතාවට කිව්වෙ? එක්සත් ජාතික පක්ෂයට ගහල, පෙරළල, මරලා, වළලලා, වලට උඩින් පස් දමල, පස් උඩ නැගිල අපි තොවිලයක් කරමුය කියලයි කිව්වෙ. ඒක බොහොම හොඳ, ප්‍රියජනක, ප්‍රජාතන්ත්‍රවාදයට අනුකූල ජනසම්මතවාදී ප්‍රකාශයක්.

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා**
*(வைத்திய கலாநிதி ரன்ஜித் அத்தபத்து)*
**(Dr. Ranjith Atapattu)**

කවුද දන්නෙ නැහැ බෙර ගහන්නෙ?

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

මම හිතන විධියට කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) අපක්ෂපාතව කතා කරනවා නම් ඒ ගැනත් යමක් කියන්නට තිබුණා.

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා**
*(வைத்திய கலாநிதி ரன்ஜித் அத்தபத்து)*
**(Dr. Ranjith Atapattu)**

විජය කුමාරණතුංග වෙන්න ඇති බෙර ගහන්නේ.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

දැන් මේ ළඟදී ප්‍රකාශයක් කරලා තිබුණා. මම ඒකට විරුද්ධ වෙන්නේ නැහැ. ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතා ඒ කිව්වෙ ශාරීරික වශයෙන් අපිව අල්ලලා, ගහලා, මරලා, වළක දමලා, පස් පුරවලා, ඒක උඩ නැගලා තොවිලයක් කරන්න කියන එක නොවෙයි. ඒක කරන්න බැරි බවත් උන්නැහේ දන්නවා. නමුත් එයා ඒ කතා විලාශයෙන් ජනතාවට කියන්නේ තමුන්නාන්සේලාගේ ඡන්දය පාවිච්චි කරලා එක්සත් ජාතික පක්ෂය පෙරළලා විනාශ කරපල්ලා කියන එකයි. ඕක එතුමා අද ඊයේ කියන කතාවක් නොවෙයි. එක් දහස් නවසිය තිස් ගණන්වල ඉඳලාම එතුමා ඕක කිව්වානේ. ඕක කියල, කියල කියල කොයි තරමට පුරුදු වුණාද කිව්වොත් ඒ කියපු එකම ගුරුන්නාන්සේලාටම 1977 දී මේ රටේ ජනතාව කළා. ඉතින් ඒකට කමක් නැහැ. එම නිසා ඒක නැවත නැවතත් කිව්වාට කමක් නැහැ. නමුත් මම කියන්නේ, වෙනත් අර්ථ කථනයක් දෙන්න නරකයි. ජනාධිපතිතුමා අනුරාධපුරයේදී කළ ප්‍රකාශය එයා වැරදි විධියට පෙන්වන්න උත්සාහ කළා. අපේ ජනතාව එතරම් මන්ද බුද්ධික නොවෙයි. බුද්ධිමත් ජනතාවක් අපට ඉන්නේ. ඔවුන් දන්නවා මේ ජනාධිපතිතුමාට ඕනැ කළා නම්, එතුමාට 1977 දී ලැබිච්ච ජනවරම අනුව, ඒ උදවියගේම 1972 ව්‍යවස්ථාව අනුව තානිකරම ඒකාධිපතියෙක් වෙන්න එතුමාට තිබුණා. මේ පාර්ලිමේන්තුවෙ අපි සියලු දෙනාම සදාකාලයටම මෙතන ඉන්න තත්ත්වයක් ඇති කරන්න පුළුවන්කම තිබුණා. කරුණාකර මට කියන්න එහෙම කරන්න බැරිද කියා ඒ ව්‍යවස්ථාව යටතේ ?

I am ready to take that challenge from the hon. Member for Kalawana, Sir. Under the provisions of the 1972 Constitution we could have done that. We could have been here for all time.

ජනාධිපතිතුමාට මේ හෙට අනිද්දා මැතිවරණයකට යන්න වුවමනාවක් නැහැ. පළමුවැනි සියක් දවසේම මේක කර ගන්න තිබුණා නොවැ. එතකොට හැම පක්ෂයක්ම පැරදිලා බොහොම අමාරුවට වැටිලා ඉන්න වෙලාවේ අපිට මොනවාද කර ගන්න බැරි වුණේ ? ඕනෑ එකක් කර ගන්න පුළුවන්කම තිබුණා. අපි එහෙම කළේ නැහැ. එහෙම නම් මොකටද මේ අළුත් අර්ථකථනයක් මේකට ගෙනෙන්නේ කියා මම අහන්නට කැමතියි. ජනතාවට මේ පෙන්වන්න හදන්නේ, "අපොයි! දැන් හරි විනාශයක් වෙන්නයි යන්නේ ; ඔන්න මේ විධියට මැතිවරණ සිතියම අකුලන්නයි කිව්වා." කවුද ඒක කරන්නේ ? හැකුළුවොත් හකුළන්නේ අපියැ ? අපිට කර ගන්න පුළුවන්කම තිබෙන වෙලාවෙත් කර ගත්තේ නැහැනේ. ජනතාවනේ සර්වජන ඡන්දයෙන් ඒක කරන්නේ. එම නිසා මේ අවස්ථාවේ හැටියට අනවශ්‍ය අර්ථකථන නොදී ජනතාව මුලා කිරීමෙන් වළකින හැටියට මම ඉල්ලා සිටින්නට කැමතියි.

අපි අවුරුදු හයට වැඩිය එක දවසක්වත් ඉන්නේ නැති බව මේ අවස්ථාවේදී කියන්නට ඕනැ. දැන් ජනාධිපතිතුමාට කරන චෝදනාව මේක නේද? අවුරුදු හයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

